



# 2022

## වාර්ෂික කාර්ය සාධන වාර්තාව
## வருடாந்த செயலாற்றுகை அறிக்கை
## ANNUAL PERFORMANCE REPORT



දේශීය ආදායම් දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකාව
உள்நாட்டு இறைவரித் திணைக்களம் - இலங்கை
**INLAND REVENUE DEPARTMENT - SRI LANKA**



# වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2022

**දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**

වැය ශීර්ෂ අංකය 246
(2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරණ
රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.4 වගන්තිය ප්‍රකාරව)

**ඩී.ආර්.එස්. හපුආරච්චි**
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්

## ප්‍රධාන නිලධාරීන්

| | |
|---|---|
| **ඩී.ආර්.එස්. හපුආරච්චි මහතා** | **දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්** |

### නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරුන්

| | |
|---|---|
| **එම්.එල්. මොහොමඩ් තාහීර් මහතා** | බදු පරිපාලනය - ඉහල සංස්ථාපිත (4,7,8,9), තොරතුරු |
| **කේ.ඩී.එම්.එන්. ගුණතුංග මහතා** | බදු පරිපාලනය - විශාල බදු, ආදායම් අධීක්ෂණය, ආපසු ගෙවීම්, විමර්ෂණ හා බුද්ධි |
| **එස්.එස්.ඩී. වීරසේකර මහතා** | පාරිභෝගික සේවා, ප්‍රවර්ධන සහ මධ්‍යම ලේඛන කළමනාකරණය |
| **ටී. රාජපක්ෂ මහතා** | අභියාචනා සහ විරෝධතා, ණය කළමනාකරණය, පැරණි පද්ධති, හිඟ බදු අය කර ගැනීම හා නීති සබඳතා |
| **එම්.එස්.එම් සියාන් මහතා** | බදු පරිපාලන - ඉහල සංස්ථාපිත (1,2,3,5,6), ප්‍රභව බදු පරිපාලනය, සරල කරන ලද එකතු කල අගය මත බදු රාජකාරි |
| **ආර්.ඒ.එන් රාජපක්ෂ  මහතා** | මානව ප්‍රාග්ධන මානව සම්පත් සහ වත්කම් පරිපාලන |
| **එම්. ගුණවීර මහතා** | බදු ප්‍රතිපත්ති, නීති සම්පාදන, රීති සහ ජාත්‍යන්තර සබඳතා |
| **ඩී.යූ.ඒ. ජයවර්ධන මහතා** | බදු පරිපාලනය - විශාල බදු, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පරිපාලනය, ගෙවීම් පාලනය සහ මධ්‍ය සැකසුම් අංශය |
| **ඩබ්.ඒ.එස්. චන්ද්‍රසේකර මිය** | මධ්‍ය  සංස්ථාපිත, මධ්‍ය හා කුඩා පරිමාණ (සංස්ථාපිත හා සංස්ථාපිත නොවන), ප්‍රාදේශීය කාර්යාල සහ අවදානම් කලමනාකරණ |

## ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරුන්

| | |
|---|---|
| **එන්.එම් මොහොමඩ් මිෆ්ලි මහතා** | බදු ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සබඳතා හා ලේකම් අංශය |
| **එස්.එම්. අබේකෝන් බණ්ඩාර මහතා** | මධ්‍ය පරිමාණ සංස්ථාපිත අංශ 1-8 සහ අවදානම් කළමනාකරණය |
| **එල්.එම්.සී. වීරකෝන් මිය** | පාරිභෝගික සේවා සහ ප්‍රවර්ධනය |
| **ආර්.කේ.සී. චිත්‍රලතා මිය** | විමර්ශනය |
| **ටී.එම්.ජේ.එන්. බණ්ඩාර මහතා** | ඉහල සංස්ථාපිත අංශ 4 සහ 7, මිළ පැවරුම්, පර්යේෂණ සහ ජාත්‍යන්තර අංශ |
| **එච්.ඩබ්.එන්. තල්අරඹ මිය** | විශාල බදු ගෙවන්නන්ගේ අංශය |
| **එම්.පී. එස්. අබේරත්න මහතා** | ඉහල සංස්ථාපිත අංශ 3 සහ 6 |
| **එම්. ගනේෂරාජා මහතා** | ඉහල සංස්ථාපිත අංශ 1,2 සහ 5 |
| **ආර්.පී.එච්. ප්‍රනාන්දු මිය** | අභියාචනා සහ විරෝධතා (LTU,UCU,MCU,RO) |
| **බී.කේ.එස්. සාන්ත මහතා** | ස්වාධීන අභ්‍යන්තර කාර්යයන් පාලනය සහ බුද්ධි |
| **එම්.ඩී. ආනන්දසිරි මහතා** | තොරතුරු තාක්ෂණ පරිපාලන සේවා, ගෙවීම් පාලනය සහ බදු මෙහෙයුම් සහාය |
| **එස්.පී. රණසිංහ මිය** | තොරතුරු සහ අතුරු මුහුණත් නියෝජ්‍යායතන සහ විශේෂ කාර්යය |
| **ජේ.ඒ.ඩී.ඩී.ඩබ්.කේ. සිරිවර්ධන මිය** | පාරිභෝගික ලියාපදිංචිය සහ යාවත්කාලීන කිරීම |
| **යූ.ඩී.එන්. ජයවීර මහතා** | කලාප I, II සහIII |
| **ජේ.ඩී. රණසිංහ මිය** | පැරණි පද්ධති හිඟ බදු රැස් කිරීම, නීති කටයුතු සහ හිඟ බදු රැස් කිරීම (LTU,UCU,MCU,RO) |
| **ආචාර්ය එන්.ටී.ඒ. දිසානායක මිය** | විශාල බදු ගෙවන්නන්ගේ අංශය 4,5 සහ 6 |
| **ඩී.එම්.එන්.එස්.බී. දිසානායක  මහතා** | රඳවා ගැනීමේ බදු, උපයන විට ගෙවීම, මුද්දර ගාස්තු, ඔට්ටු හා සූදු බදු, සරල කරන ලද එකතු කල අගය මත බදු |
| **වී.කේ.ඒ. තුසිතාංජලී මිය** | ඉහල සංස්ථාපිත අංශය 8 සහ 9 |
| **ටී.යූ. අතුකෝරල මහතා** | ප්‍රසම්පාදන සහ වත්කම් කළමනාකරණය |
| **යූ.එල්.යූ.කේ. පෙරේරා මහතා** | විශාල බදු ගෙවන්නන්ගේ අංශය (2,3), විශාල බදු පරිපාලනය, ඉහළ සංස්ථාපිත හා මධ්‍ය පරිමාණ ආපසු ගෙවීම |
| **ඩබ්.එම්.ආර්. බණ්ඩාර මහතා** | මානව සම්පත් කළමනාකරණය |
| **ඩබ්.එස්. තිලකරත්න මහතා** | මානව සම්පත් සංවර්ධනය සහ වෙනස්වීම් කළමනාකරණය |

## පටුන


| | | |
|---|---|---|
| වගු ලේඛනය | | vi |
| සටහන් ලේඛනය | | vii |
| කෙටි යෙදුම් | | viii |
| 01 වන පරිච්ඡේදය | ආයතනමය පැතිකඩ | 1 |
| 1.1 | හැඳින්වීම | 3 |
| 1.2 | දැක්ම, මෙහෙවර සහ උපාය මාර්ගික ඉලක්ක | 4 |
| 1.3 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් | 5 |
| 1.4 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශයන් | 5 |
| 1.5 | සංවිධාන සටහන | 6 |
| 02 වන පරිච්ඡේදය | ප්‍රගතිය සහ අනාගත දැක්ම | 7 |
| 2.1 | 2022 වර්ෂය තුල දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ විශේෂිත ජයග්‍රහණයන් | 9 |
| 2.1.1 | වර්ෂය තුල දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය කරනු ලැබූ බදු | 9 |
| 2.1.2 | මුළු ආදායම රැස් කිරීම | 10 |
| 2.1.3 | රජයේ ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය | 12 |
| 2.1.4 | මුද්දර බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු ආදායම් පලාත් සභා වෙත මාරු කිරීම | 13 |
| 2.1.5 | ආදායම් බදු එකතු කිරීම | 14 |
| 2.1.6 | එකතු කල අගය මත බදු එකතු කිරීම | 15 |
| 2.1.7 | විගණනය | 17 |
| 2.1.8 | අභියාචනා | 18 |
| 2.1.9 | බදු ගෙවන්නන් ලියාපදිංචි කිරීමේ විස්තර | 19 |
| 2.1.10 | ඵලදායිතා අනුපාතය | 19 |
| 2.1.11 | බදු ගෙවන්නන් සහ බදු වෘත්තිකයන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 21 |
| 2.1.12 | වාර්තා අනුකූලතාවය | 23 |
| 2.1.13 | පැහැර හරින ලද බදු | 24 |
| 2.1.14 | 2022 වර්ෂයේ එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් සිදු කළ ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම් | 25 |
| 2.1.15 | 2022 අංක 14 දරණ අධිභාර බදු පනත ක්‍රියාත්මක කිරීම | 27 |
| 2.1.16 | 2022අංක 25 දරණ සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත ක්‍රියාත්මක කිරීම | 27 |
| 2.1.17 | කැසිනෝ ව්‍යාපාර සඳහා බලපත්‍ර නිකුත් කිරීම | 27 |
| 2.1.18 | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට කරන ලද සංශෝධන | 27 |
| 2.1.19 | වර්ෂය තුල පැනවූ නීති සම්පාදනයන් | 33 |
| 2.1.20 | වර්ෂය තුල නිකුත් කල ගැසට් නිවේදන | 33 |
| 2.2 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අභියෝග සහ අනාගත අරමුණු | 34 |
| 2.2.1 | අභියෝග | 34 |
| 2.2.2 | අනාගත අරමුණු | 35 |
| 03 වන පරිච්ඡේදය | වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය | 37 |
| 3.1 | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය | 39 |
| 3.2 | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 41 |
| 3.3 | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 42 |

| | | |
|---|---|---|
| 3.4 | මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන් | 44 |
| 3.5 | ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය | 60 |
| 3.6 | වෙන් කිරීම් ප්‍රයෝජනයට ගැනීමේ කාර්ය සාධනය | 61 |
| 3.7 | මු.රෙ. 208 ප්‍රකාරව අනෙකුත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවේ වැය සඳහා වන වෙන්කිරීම් ප්‍රදාන | 61 |
| 3.8 | මූල්‍ය - නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය | 62 |
| 3.9 | විගණකාධිපති වාර්තාව | 62 |
| <u>04 වන පරිච්ඡේදය</u> | <u>කාර්ය සාධන දර්ශක</u> | 63 |
| 4.1 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන දර්ශක | 65 |
| <u>05 වන පරිච්ඡේදය</u> | <u>තිරසාර සංවර්ධන ඉලක්ක</u> | 67 |
| 5.1 | තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීමේ කාර්ය සාධනය **(SDG)** | 69 |
| <u>06 වන පරිච්ඡේදය</u> | <u>මානව සම්පත් පැතිකඩ</u> | 71 |
| 6.1 | කාර්ය මණ්ඩල කළමනාකරණය | 73 |
| 6.2 | මානව සම්පත් සංවර්ධනය | 74 |
| <u>07 වන පරිච්ඡේදය</u> | <u>අනුකූලතා වාර්තාව</u> | 77 |
| 7.1 | අනුකූලතා වාර්තාව | **79** |
| ඇමුණුම | | |

## වගු ලේඛනය


| | | |
|---|---|---|
| වගුව 2:1 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරන ලද බදු | 9 |
| වගුව 2:2 | අවලංගු කර හෝ අහෝසි කර ඇති නමුත් 2022 වර්ෂයේ දී ආදායම් රැස් කිරීම් සිදු කරන ලද බදු | 9 |
| වගුව 2:3 | මුළු ආදායම රැස් කිරීම 2022 | 10 |
| වගුව 2:4 | 2022 සහ 2021 වර්ෂයන්හි ආදායම් රැස් කිරීම සැසඳීම | 11 |
| වගුව 2:5 | රාජ්‍ය ආදායමට සහ දළ දේශීය නිෂ්පාදිතයට (පවත්නා මිල ගණන් යටතේ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය | 13 |
| වගුව 2:6 | බදු ආදායම පළාත් සභාවලට මාරු කිරීම - 2022 | 14 |
| වගුව 2:7 | සංස්ථාපිත හා සංස්ථාපිත නොවන ආදායම් බදු එකතු කිරීම | 14 |
| වගුව 2:8 | එකතු කල අගය මත බදු දල එකතු කිරීම් හා ආපසු ගෙවීම් | 15 |
| වගුව 2:9 | දල දේශීය නිශ්පාදිතයට එකතු කල අගය මත බද්දෙහි දායකත්වය අංශ වලට අදාලව විශ්ලේෂණය කිරීම | 16 |
| වගුව 2:10 | විගණන විස්තර | 18 |
| වගුව 2:11 | සංස්ථාපිත සහ වෙනත් අංශ මගින් රැස් කරන ලද අතිරේක බදු වර්ගීකරණය (දණ්ඩන හැර) | 18 |
| වගුව 2:12 | ලැබුනු හා නිරවුල් කල අභියාචනා විස්තර විශ්ලේෂණය | 18 |
| වගුව 2:13 | ලියාපදිංචි වී ඇති බදු ගෙවන්නන් සංඛ්‍යාව | 19 |
| වගුව 2:14 | ආදායම් රැස් කිරීම, මුළු වියදම හා රැස් කිරීමේ පිරිවැය | 20 |
| වගුව 2:15 | 2022 වර්ෂයේදී බදු ගෙවන්නන් සහ බදු වෘත්තිකයන් සඳහා පැවැත් වූ දැනුවත් කිරීමේ වැඩසටහන් | 21 |
| වගුව 2:16 | 2017/2018 සිට 2021/2022 දක්වා ආදායම් බදු වාර්තා අනුකූලතාවය | 23 |
| වගුව 2:17 | එකතු කළ අගය මත බද්ද සහ උ.වි.ගෙ. මත බදු වාර්තා අනුකූලතාවය | 23 |
| වගුව 2:18 | පැහැර හරින ලද බදු විශ්ලේෂණය 2022.12.31 දිනට | 24 |
| වගුව 2:19 | 2022 වර්ෂය තුලදී ප්‍රකාශයට පත් කරන ලද ගැසට් නිවේදන | 33 |
| වගුව 4:1 | 2022 වර්ෂයේ කාර්ය සාධන දර්ශක | 66 |
| වගුව 5:1 | තිරසාර සංවර්ධන ඉලක්ක පදනම් කර ගත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් | 69 |
| වගුව 6:1 | 2022.12.31 දිනට කාර්ය මණ්ඩලය | 73 |
| වගුව 6:2 | 2022.12.31 දිනට කාර්ය මණ්ඩල සාරාංශය | 74 |
| වගුව 6:3 | 2022 වර්ෂයේ දී පවත්වන ලද මානව සම්පත් සංවර්ධන වැඩසටහන් | 74 |

# සටහන් ලේඛනය


| | | |
|---|---|---|
| සටහන 2:1 | මුළු ආදායම රැස් කිරීම - 2022 | 11 |
| සටහන 2:2 | 2021 වසර සමග 2022 වර්ෂයේ ආදායම් රැස් කිරීම සැසඳීම | 12 |
| සටහන 2:3 | රජයේ ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය | 13 |
| සටහන 2:4 | සංස්ථාපිත හා සංස්ථාපිත නොවන ආදායම් බදු එකතු කිරීම 2022 සහ 2021 | 14 |
| සටහන 2:5 | අංශ වලට අදාළව එකතු කළ අගය මත බදු රැස් කිරීම | 16 |
| සටහන 2:6 | ද.දේ.නි. එකතු කල අගය මත බද්දෙහි දායකත්වය අංශ වලට අදාලව විශ්ලේෂණය කිරීම | 17 |

## කෙටි යෙදුම්

| | |
|---|---|
| ආ.බ. | ආදායම් බදු |
| ප්‍රා.ලා.බ | ප්‍රාග්ධන ලාභ බද්ද |
| එ.අ.බ. | එකතු කළ අගය මත බද්ද |
| ස්.හෙ.බ | ස්වෙච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද |
| ණ.ආ.බ. | ණය ආපසු ගෙවීමේ බද්ද |
| ඔ.සූ.බ. | ඔට්ටු හා සූදු බද්ද |
| කො.ග.බ. | කොටස් ගනුදෙනු බද්ද |
| වි.බ. | විගමන බද්ද |
| ප්‍රේ.ගා. | ප්‍රේශණ ගාස්තු |
| මු.ගා. | මුද්දර ගාස්තු |
| ජා.ගො.බ | ජාතිය ගොඩනැගීමේ බද්ද |
| ආ.සේ.ගා. | ආර්ථික සේවා ගාස්තු |
| පි.බ. | පිරිවැටුම් බද්ද |
| ස.ආ.දා.බ. | සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද |
| කැ.බ.ගා. | කැසිනෝ බලපත්‍ර ගාස්තුව |
| ජා.ආ.බ. | ජාතික ආරක්ෂණ බද්ද |
| උ.වි.ගෙ. | උපයන විට ගෙවීම් |
| ර.ගැ.බ. | රඳවා ගැනීමේ බද්ද |
| අ.පු.ආ.බ. | අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද |
| අ.ආ.බ. | අත්තිකාරම් ආදායම් බද්ද |
| දේ.ආ.දෙ. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව |



# 01
# පරිච්ඡේදය

## ආයතනමය පැතිකඩ

## 1.1 හැඳින්වීම

සෞභාග්‍යමත් රටක් අරමුණු කර ගත් දැක්මක් උදෙසා රටකට බදු ආදායමෙන් ලැබෙන පිටිවහල ඉමහත් ය. ශ්‍රී ලාංකික ඉතිහාසය තුළ බදු අය කිරීම අනාදිමත් කාලයක පටන් සිදුවූවකි. එනම් රාජාවලිය පසුකර යටත් විජිත සමය තුළ දී පවා තම රාජ්‍ය පවත්වාගෙන යාම උදෙසා අය බදු ආදායම අත්‍යාවශ්‍ය විය. බදු ආදායම රජයේ ප්‍රධාන ආදායම් මාර්ගය වන අතර, රටක ආර්ථික හා සමාජ සංවර්ධනයේ දිශානතිය තීරණය කිරීමෙහිලා ප්‍රධාන කාර්යයභාරයක් ඉටු කරනු ලබයි. ඈත අතීතයේ පටන්ම අප රටෙහි විවිධ බදු වර්ග ක්‍රියාත්මක වූ අතර, බදු අයකිරීම සඳහා වන පරිපාලන ව්‍යුහයක අවශ්‍යතාවය මත 1932 දී ආදායම් බදු දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලදී. ඒ සමඟම තක්සේරු වර්ෂ 1931/1932 දී ප්‍රථම වරට ආදායම් බද්ද ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලදී. 1933 වර්ෂයේ දී ආදායම් බදු දෙපාර්තමේන්තුව "ආදායම් බදු, බූදල් බදු සහ මුද්දර බදු දෙපාර්තමේන්තුව" ලෙස බූදල් බදු සහ මුද්දර බදු කාර්යාලය සමග ඒකාබද්ධ කිරීමෙන් පසු නම් කරන ලදී. එය 1958 කැල්ඩෝර් ප්‍රතිසංස්කරණයෙන් පසුව "දේශීය ආදායම් දෙපාර්තමේන්තුව" ලෙස හඳුන්වා දුනි. 1972 වර්ෂයේදී මුල් වරට ශ්‍රී ලංකාවේ ස්වතක්සේරු ක්‍රමය යටතේ බදු අයකිරීම හඳුන්වා දෙන ලදී. 1963 වර්ෂයේදී ප්‍රථම වරට වක්‍ර බද්දක් ලෙස ව්‍යාපාර පිරිවැටුම් බද්ද හඳුන්වා දෙන ලදී. මෙම පිරිවැටුම් බද්ද වෙනුවට භාණ්ඩ හා සේවා මත බද්ද වර්ෂ 1998 දී හඳුන්වා දුන් අතර තවදුරටත්, භාණ්ඩ හා සේවා මත බද්ද තුළින් ඇතිවන බලපෑම අවම කිරීම සඳහා 2002 වර්ෂයේදී එකතු කළ අගය මත බද්ද ප්‍රධාන වක්‍ර බද්දක් ලෙස හඳුන්වා දෙන ලදී.

ශ්‍රී ලංකාවේ සමස්ථ රාජ්‍ය ආදායම, බදු ආදායම සහ බදු නොවන ආදායමින් සමන්විත වේ. රජය මඟින් ආර්ථික අවශ්‍යතා මත විවිධ බදු හඳුන්වාදෙනු ලබන අතර, ඒවා පරිපාලනය සඳහා විවිධ ආයතන වෙත පවරා දී ඇත. දේශීය බදු පරිපාලනය කරනු ලබන ප්‍රධාන ආයතනය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වන අතර එමගින් පරිපාලනය කරනු ලබන බදු වර්ග වන්නේ, ආදායම් බද්ද, එකතු කල අගය මත බද්ද, ඔට්ටු හා සූදු බද්ද , මුද්දර ගාස්තු මත බද්ද, ප්‍රාග්ධන ලාභ මත බද්ද,කොටස් ගනුදෙනු බද්ද, රඳවා ගැනීමේ බද්ද, විගමන බද්ද, ප්‍රේෂණ ගාස්තුව, අධිභාර බද්ද, ස්වේච්ඡාවෙන් හෙළිදරවු කිරීම මත බද්ද හා සමාජ ආරක්ෂණ දායකත්ව බද්දයි. ධූරාවලිය අනුව කොමසාරිස් ජනරාල්, නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරු 09 දෙනෙකු, ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරු 22 දෙනෙකු, කොමසාරිස්වරු 90 දෙනෙකු, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්වරු, නියෝජ්‍ය කොමසාරිස්වරු සහ සහකාර කොමසාරිස්වරු 925 දෙනෙකු සහ ඒකාබද්ධ සේවයේ නිලධාරීන් 1,450 දෙනෙකු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රාජකාරීවල නියුක්ත විය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 34 වන කොමසාරිස් ජනරාල්වරයා ලෙස ඩී. ආර්. එස්. හපුආරච්චි මහතා 2022 වර්ෂයේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මුල් පුටුව හොබවයි.

අංක 402 දරණ 2002 සැප්තැම්බර් 12 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.4 වගන්තිය අනුව මෙම වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කර ඇත.

## 1.2 දැක්ම, මෙහෙවර සහ උපාය මාර්ගික ඉලක්ක

### දැක්ම

මනා පුහුණුවක් සහ කැපවීමක් සහිත කාර්ය මණ්ඩලයකින් යුතුව බදු ගෙවන ජනතාව උදෙසා මා හැඟි සේවයක් ඉටු කරන්නා වූ, බදු ගෙවන්නා කෙරෙහි බදු හිතෛෂී බදු පරිපාලකයෙක් බවට පත්වීම

### මෙහෙවර

බදු ගෙවීම කෙරෙහි ස්වේච්ඡා අනුකූලතාව දිරි ගැන්වීම මඟින් මෙන්ම බදු ගෙවීම පැහැර හැරීම හා මග හැරීම වළක්වාලීම මඟින් අදාළ බදු නීති හා අනෙකුත් අණ පනත්වලට යටත්ව බදු අය කිරීම

බදු හා ආශ්‍රිත ව්‍යවස්ථාවන් සාධාරණව, එක සමානව, ආචාරශීලීව ක්‍රියාවට නැංවීම මගින් බදු ක්‍රමයේ අවංකභාවය හා කාර්යක්ෂමතාව කෙරෙහි මහජන විශ්වාසය පවත්වාගෙන යාමට කටයුතු කිරීම

### උපාය මාර්ගික ඉලක්ක

ස්වේච්ඡාවෙන් බදු ගෙවීම කෙරෙහි අනුකූලතාවය දැක්වීම සඳහා බදු ගෙවන්නන් දිරි ගන්වන අතරම, ඊට අනුබල සැලසෙන වැඩසටහන් ඔස්සේ බදු නීතිරීති කෙරෙහි ඔවුන් ස්වේච්ඡාවෙන් එකඟ කරවා ගැනීම, වැඩි දියුණු කිරීම හා එසේ අනුකූලතාවය නොදක්වන්නන් සොයා දැන අදාළ අවස්ථාවන්හිදී ඔවුනට එරෙහිව සුදුසු කටයුතු කිරීම

වැඩ කිරීමේ කාර්යක්ෂම ක්‍රම හා තාක්ෂණය යොදා ගැනීම මඟින් සහ දැනට තිබෙන සම්පත් වඩා හොඳින් උපයෝගී කර ගැනීම තුළින් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම

දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පෙරදැරි කරගෙන වඩාත් ඵලදායී අයුරින් දායක වීමට හැකිවනු පිණිස කළමනාකරණ හා තාක්ෂණික පුහුණුව මෙන්ම සේවා පළපුරුද්ද තුළින් කාර්ය මණ්ඩලයේ ඵලදායීතාවය සහ වෘත්තීයමය බව ඉහළ නැංවීම

## 1.3 දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්

- දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ විෂය පථය යටතේ වන්නා වූ සියළු අණ පනත් පරිපාලනය කිරීම
- රාජ්‍ය බදු ආදායම රැස් කිරීම
- රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳව ප්‍රතිචාර ලබා දීම

## 1.4 දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- පාරිභෝගික සේවා හා ප්‍රවර්ධන අංශය
- විශාල සංස්ථාපිත අංශය
- ඉහළ සංස්ථාපිත අංශය
- මධ්‍ය සංස්ථාපිත අංශය
- High Net Worth & VIP, RTP අංශය
- මෙට්‍රො සහ ප්‍රාදේශීය අංශය
- අභියාචනා අංශය
- ආපසු ගෙවීම් අංශය
- හිඟ බදු අය කර ගැනීමේ අංශය
- ලේකම් අංශය
- ප්‍රභව බදු අංශය
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පරිපාලන අංශය
- වංචා වැලැක්වීමේ අංශය
- මානව සම්පත් හා වත්කම් පරිපාලන අංශය
- මූල්‍ය අංශය
- ආදායම් පරිපාලන හා කළමනාකරණ තොරතුරු පද්ධති ව්‍යාපෘති අංශය

# 1.5 සංවිධාන සටහන




ix



# 02 පරිච්ඡේදය

# ප්‍රගතිය සහ අනාගත දැක්ම

## 2.1 2022 වර්ෂය තුළ දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ විශේෂිත ජයග්‍රහණයන්

### 2.1.1 වර්ෂය තුළදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මඟින් පරිපාලනය කරනු ලැබූ බදු

වර්ෂය තුළ දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරන ලද අණ පනත් යටතේ පනවන ලද බදු වගු අංක 2.1 හි දැක්වේ.

**2.1 වගුව : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරන ලද බදු**

| බද්ද | අණ පනත් |
|---|---|
| ආදායම් බද්ද | 2021 අංක 10 දරන පනත සහ 2022 අංක 45 දරන පනත මඟින් සංශෝධනය කළ පරිදි 2017 අංක 24 දරන දේශීය අදායම් පනත |
| එකතු කළ අගය මත බදු (මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද ඇතුළත්ව) | 2003 අංක 7, 2004 අංක 13, 2005 අංක 6, 2006 අංක 8, 2007 අංක 14, 2008 අංක 15, 2009 අංක 15, 2011 අංක 9, 2012 අංක 7, 2013 අංක 17, 2014 අංක 7, 2015 අංක 11, 2016 අංක 20, 2018 අංක 25, 2019 අංක 19, 2021 අංක 9, 2022 අංක 13 සහ 2022 අංක 44 දරන පනත් වලින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත |
| ඔට්ටු හා සූදු බදු | 2015 අංක 14 දරන පනත මඟින් සංශෝධිත 1988 අංක 40 දරන ඔට්ටු හා සූදු බදු පනත |
| මුද්දර ගාස්තු | 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත සහ 2008 අංක 10 සහ 2011 අංක 13 දරන පනත් මඟින් සංශෝධිත 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත |
| කොටස් ගනුදෙනු බද්ද | 2005 අංක 05 දරන මුදල් පනත සහ 2007 අංක 13 දරන මුදල් පනත |
| විගමන බද්ද | 2015 අංක 10 දරන මුදල් පනත |
| ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද | 2021 අංක 18 දරන මුදල් පනත |
| අධිභාර බද්ද | 2022 අංක 14 දරන අධිභාර බදු පනත |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත |
| ප්‍රේෂණ ගාස්තු | 2017 අංක 12 දරන විදේශ විනිමය පනත |
| කැසිනෝ බලපත්‍ර ගාස්තු | 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය) කිරීමේ පනත |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

කලින් බලාත්මකව තිබූ දැනට අවලංගුකර හෝ අහෝසිකර ඇති පහත සඳහන් බදු සම්බන්ධයෙන් අය කාර්යයන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී.

**2.2 වගුව : අවලංගු කර හෝ අහෝසි කර ඇති නමුත් 2022 වර්ෂයේ දී ආදායම් රැස් කිරීම් සිදු කරන ලද බදු**

| බද්ද | අදාළ ප්‍රඥප්තිය |
|---|---|
| ජාතිය රැක ගැනීමේ දායක බද්ද | 1991 අංක 52 දරන ජාතිය රැකගැනීමේ දායක බදු පනත, සංශෝධිත පරිදි |
| පිරිවැටුම් බද්ද (උතුරු පළාත) | 1981 අංක 69 දරන පිරිවැටුම් පනත, සංශෝධිත පරිදි |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 2005 අංක 5 දරන මුදල් පනත, සංශෝධිත පරිදි |
| ආර්ථික සේවා ගාස්තුව | 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත, සංශෝධිත පරිදි |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත, සංශෝධිත පරිදි |
| ණය ආපසු ගෙවීමේ බද්ද | 2018 අංක 35 දරන මුදල් පනත |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.2 මුළු ආදායම රැස් කිරීම

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂය තුළ දී රු. 1,058,080,103,723/- ක ශුද්ධ ආදායම් ප්‍රමාණයක් රැස් කරමින් ආදායම් රැස් කිරීමේ යහපත් වර්ධනයක් වාර්තා කර ඇත. (ඊට පළාත් සභාවලට මුළුමනින්ම මාරු කරනු ලබන මුද්දර බද්ද සහ පළාත් සභාවලට මාරු කරනු ලබන ජාතිය ගොඩනැගීමේ බද්ද යටතේ රැස් කිරීම් වලින් 1/3 ක කොටස ද ඇතුළත් වේ). එය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ඉතිහාසය තුළදී අත්කරගත් ඉහළම ආදායම වේ.

වර්ෂය සඳහා මුළු ආදායම් රැස් කිරීම රුපියල් මිලියන 1,058,080 ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව රුපියල් මිලියන 425,250/- ක වැඩිවීමක් පෙන්නුම් කරයි. ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද, සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සහ අධිභාර බද්ද හඳුන්වා දීම සහ කළින් කළට සිදු කරන ලද එකතු කල අගය මත බද්ද මත අනුප්‍රමාණ වෙනස්කම් ඇතුළත්ව ප්‍රධාන වශයෙන් රජය විසින් හඳුන්වාදෙනු ලැබූ බදු ප්‍රතිපත්ති වෙනස්කම් හේතු කොටගෙන මෙම ජයග්‍රහණය ලබා ගැනීමට හැකිවිය. ඒ අතර, බදු අනුකූලතාවය සඳහා පහසුකම් සැලසීමට සහ බලාත්මක කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ගන්නා ලද පුළුල් ක්‍රියාමාර්ග හේතු කොටගෙන එහි සාර්ථකත්වය තහවුරු විය.

රජයේ ආදායමට වර්ෂය තුළදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව දැරූ මුළු ආදායම් දායකත්වයෙහි ප්‍රතිශතය 53.46% කි. අනුරූපී ඇස්තමේන්තු සමඟ එක් එක් බදු වර්ගය යටතේ වන ආදායම සසඳා බැලූ විට, ආදායමේ මුළු රැස් කිරීම, 93.55% ක අගයක් පෙන්වන අතර ශුද්ධ ආදායම (පළාත් සභාවලට සම්පූර්ණයෙන්ම මාරු කරන ලද මුද්දර ගාස්තු සහ පළාත් සභාවලට මාරු කරන ලද ජාතිය ගොඩනැගීමේ බද්දෙන් 1/3 ක් හැර) වසර සඳහා ඇස්තමේන්තුවෙන් 92.41% ක් විය.

**2.3 වගුව : මුළු ආදායම රැස් කිරීම - 2022**

| බදු වර්ග/ ගාස්තු | ආදායම් ඇස්තමේන්තුව (රු.) | ආදායම් රැස් කිරීම (රු.) | රැස් කිරීම ඇස්තමේන්තුවේ % ක් ලෙස | රැස් කිරීම මුළු ආදායමට % ක් ලෙස |
|---|---|---|---|---|
| ආදායම් බද්ද | 553,000,000,000 | 524,533,797,581 | 94.85% | 49.57% |
| ප්‍රාග්ධන ලාභ බද්ද | 1,100,000,000 | 5,315,389,458 | 483.22% | 0.50% |
| එකතු කල අගය මත බද්ද | 533,000,000,000 | 463,071,659,532 | 86.88% | 43.77% |
| ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද | 3,900,000,000 | 3,969,890,410 | 101.79% | 0.38% |
| ණය ආපසු ගෙවීමේ බද්ද | - | 81,798,840 | - | 0.01% |
| ඔට්ටු හා සූදු බද්ද | 2,000,000,000 | 5,244,762,337 | 262.24% | 0.50% |
| කොටස් ගණුදෙනු බද්ද | 3,000,000,000 | 4,215,856,857 | 140.53% | 0.40% |
| විගමන බද්ද | 11,000,000 | 10,728,103 | 97.53% | 0.00% |
| මුද්දර බද්ද | - | 12,719,609,022 | - | 1.20% |
| ආර්ථික සේවා ගාස්තු | - | 201,752,669 | 0.00% | 0.02% |

| | | | | |
|---|---|---|---|---|
| ජාතිය ගොඩනැගීමේ බද්ද | - | 585,045,019 | 0.00% | 0.06% |
| පිරිවැටුම් බද්ද | - | 7,473,447 | - | 0.00% |
| ජාතික ආරක්ෂක බද්ද | - | 11,309,942 | - | 0.00% |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 35,000,000,000 | 36,111,030,506 | - | 3.41% |
| කැසිනෝ බලපත්‍ර ගාස්තු | - | 2,000,000,000 | - | 0.19% |
| ප්‍රේෂණ ගාස්තු | 500,000 | - | 0.00% | 0.00% |
| **මුළු ආදායම් රැස් කිරීම** | **1,131,011,500,000** | **1,058,080,103,723** | **93.55%** | **100.00%** |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

**සටහන 2.1 : මුළු ආදායම රැස් කිරීම - 2022**




මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

**2.4 වගුව : 2022 සහ 2021 වර්ෂයන්හි ආදායම් රැස් කිරීම සැසඳීම**

| බදු වර්ග/ ගාස්තු | 2022 ආදායම් රැස් කිරීම (රු.) | 2021 ආදායම් රැස් කිරීම (රු.) | රැස් කිරීම අඩුවීම හෝ වැඩිවීම (%) ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| ආදායම් බද්ද | 524,533,797,581 | 300,544,591,273 | 74.53% |
| ප්‍රාග්ධන ලාභ බද්ද | 5,315,389,458 | 667,876,234 | 695.86% |
| එකතු කළ අගය මත බද්ද | 463,071,659,532 | 308,213,044,594 | 50.24% |
| ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද | 3,969,890,410 | 174,616,959 | 2,173.49% |
| ණය ආපසු ගෙවීමේ බද්ද | 81,798,840 | 7,565,402 | 981.22% |
| ඔට්ටු හා සූදු බද්ද | 5,244,762,337 | 1,939,352,796 | 170.44% |
| කොටස් ගණුදෙනු බද්ද | 4,215,856,857 | 6,964,477,149 | -39.47% |
| විගමන බද්ද | 10,728,103 | 17,032,375 | -37.01% |
| මුද්දර බද්ද | 12,719,609,022 | 12,949,837,858 | -1.78% |
| ආර්ථික සේවා ගාස්තු | 201,752,669 | 728,114,581 | -72.29% |

| | | | |
|---|---|---|---|
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 585,045,019 | 599,129,474 | -2.35% |
| භාණ්ඩ හා සේවා බද්ද | - | 244,534 | -100.00% |
| පිරිවැටුම් බද්ද | 7,473,447 | 18,742,858 | -60.13% |
| ජාතික ආරක්ෂක බද්ද | 11,309,942 | 322,006 | 3,412.34% |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 36,111,030,506 | - | - |
| කැසිනෝ බලපත්‍ර ගාස්තු | 2,000,000,000 | - | - |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | - | 422,144 | -100.00% |
| ප්‍රේෂණ බද්ද | - | 5,214,948 | -100.00% |
| **මුළු ආදායම් රැස් කිරීම** | **1,058,080,103,723** | **632,830,585,186** | **67.20%** |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

**සටහන 2.2 : 2021 වසර සමඟ 2022 වර්ෂයේ ආදායම් රැස් කිරීම සැසඳීම**




මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.3 රජයේ ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය

2022 වසරේ රජයේ ආදායමට සහ දළ දේශීය නිෂ්පාදිතයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය මෙන්ම පසුගිය වසර හතරක කාලය තුළ එහි ප්‍රවණතාවයන් 2.5 වන වගුවෙන් පෙන්වයි. එම දායකත්වයන් 2.3 වන සටහනින් නිරූපණය කෙරේ. 2022 වසරේ රජයේ මුළු ආදායම රුපියල් මිලියන 1,979,184 ක් වූ අතර එයින් 53.46% ක ප්‍රතිශතාත්මක දායකත්වයක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇත.

2022 වර්ෂයේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තු ආදායම් රැස් කිරීමේ අගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් විට 4.38% කි.

**2.5 වගුව : රාජ්‍ය ආදායමට සහ දළ දේශීය නිෂ්පාදිතයට (පවත්නා මිල ගණන් යටතේ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය**

| වර්ෂය | රජයේ ආදායම (රු. මිලියන) | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රැස් කිරීම (රු. මිලියන) | රජයේ ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රැස් කිරීමේ ප්‍රතිශතය | පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය (රු. මිලියන) | දළ දේශීය නිෂ්පාදිතයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් රැස් කිරීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 2018 | 1,919,973 | 900,348 | 46.89% | 15,351,933 | 5.86% |
| 2019 | 1,890,899 | 1,025,319 | 54.22% | 15,910,976 | 6.44% |
| 2020 | 1,367,960 | 523,934 | 38.30% | 15,671,535 | 3.34% |
| 2021 | 1,457,071 | 632,831 | 43.43% | 17,600,191 | 3.60% |
| 2022 | 1,979,184 | 1,058,080 | 53.46% | 24,147,726 | 4.38% |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

**සටහන 2.3 : රජයේ ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය**




මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.4 මුද්දර බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු ආදායම් පළාත් සභාවලට මාරුකිරීම

2011 අයවැය යෝජනා වලට අනුකූලව පනවා ඇති අදාළ ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට කරන ලද සංශෝධන ප්‍රකාරව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් රැස් කරනු ලබන පහත සඳහන් බදු මඟින් දක්වා ඇති ප්‍රතිශතයන්ගෙන් පළාත් සභා වලට මාරුකරන ලදී.

| | |
|---|---|
| ජාතිය ගොඩනැගීමේ බද්ද | මුළු එකතුවෙන් 33.33% |
| මුද්දර ගාස්තුව | මුළු එකතුවෙන් 100.00% |

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද අදාළ බදුවල මුළු රැස් කිරීම් ප්‍රමාණය සහ පළාත් සභාවලට මාරු කරන ලද මුදල 2.6 වන වගුවෙහි දැක්වේ.

**2.6 වගුව : බදු ආදායම පළාත් සභාවලට මාරු කිරීම - 2022**

| | මුළු රැස් කිරීම් (රු.) | පළාත් සභාවලට මාරු කල ප්‍රමාණය (රු.) | % |
|---|---|---|---|
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 585,045,019 | 171,617,459 | 33.33% |
| මුද්දර බද්ද | 12,719,609,022 | 12,719,609,022 | 100% |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## 2.1.5 ආදායම් බදු එකතු කිරීම

රුපියල් මිලියන 455,158 ක මුළු ආදායම් බදු එකතු කිරීමේ ප්‍රමාණයක් එනම්, එකතු කළ මුළු ආදායම් බදු වලින් 87% ක ප්‍රමාණයක දායකත්වයක් සංස්ථාපිත අංශය විසින් මුළු ආදායම් බදු රැස් කිරීම සඳහා ලබා දී තිබුණි. එය සංස්ථාපිත නොවන අංශය සඳහා රුපියල් මිලියන 69,376 ක් එනම්, 13% ප්‍රමාණයකි.

එහි සංයුතිය සටහන 2.7 වන වගුවේ පෙන්වා දී ඇති අතර 2.4 වන සටහන මඟින් පැහැදිලි කරයි.

**2.7 වගුව : සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු එකතු කිරීම**

| | 2022 | | 2021 | |
|---|---|---|---|---|
| | බදු එකතු කිරීම (රු.) | % | බදු එකතු කිරීම (රු.) | % |
| සංස්ථාපිත* | 455,157,793,291 | 87% | 251,830,847,280 | 84% |
| සංස්ථාපිත නොවන** | 69,376,004,290 | 13% | 48,713,743,992 | 16% |
| එකතුව | **524,533,797,581** | **100%** | **300,544,591,272** | **100%** |

*2022 දී රු.මි. 251 හා 2021 දී රු.මි. 483 ක් වූ ලාභාංශ බද්ද ඇතුළුව
**උපයන විට ගෙවීම (උ.වි.ගෙ) යෝජනා ක්‍රමය යටතේ සේවා නියුක්තිකයින් විසින් ගෙවූ ආදායම් බදු සහ ර.ගැ.බ. ඇතුළුව
මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

**සටහන 2.4 : සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු එකතු කිරීම 2022 සහ 2021**




මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.6 එකතු කළ අගය මත බදු එකතු කිරීම

පෙර වර්ෂයේ රු. මිලියන 308,213 වූ එකතු කළ අගය මත බදු එකතු කිරීම, 2022 වර්ෂයේ දී රු. මිලියන 154,859 ක එනම් 50.24% ක ප්‍රමාණයක වැඩිවීමක් පෙන්නුම් කරයි. කෙසේ නමුදු, වර්ෂය සඳහා වන ඇස්තමේන්තුව වූ රු. මිලියන 533,000 සමග සැසඳූ කළ, එකතු කල අගය මත බද්ද යටතේ ආදායම් රැස් කිරීමේ ප්‍රතිශතය 86.88 ක් වන අතර එය රු. මිලියන 463,072 කි. දේශීයව එකතු කළ අගය මත බදු සඳහා රු. මිලියන 264,000 ලෙස සහ ආනයනය මත එකතු කළ අගය මත බදු රු. මිලියන 160,000 ලෙස එකතු කළ අගය මත බදු සඳහා මූලික ආදායම් ඇස්තමේන්තුව වූයේ රු. මිලියන 424,000 කි. 2022.10.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බද්ද 12% සිට 15% දක්වා අනුපාත වෙනස්වීම, එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි විය යුතු සීමාව රු. මිලියන 300 සිට 80 දක්වා වෙනස්වීම සහ සහාධිපත්‍ය දේපල සඳහා බදු නිදහස් කිරීම ඉවත් කිරීම යන හේතුන් මත පදනම්ව ඇස්තමේන්තුව සංශෝධනය විය. එකතු කළ අගය මත බදු අනුපාත වෙනස්කිරීම 2022.10.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි හඳුන්වා දුන්නද, එම වෙනස යටතේ අපේක්ෂිත ආදායම ලැබුණේ නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල දී පමණි. එසේම එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි විය යුතු සීමාව වෙනස් කිරීම 2022 ඔක්තෝම්බර් 1 වන දින සිට ක්‍රියාත්මක කිරීමට යෝජනා කර තිබුන ද එම යොජනාව පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද්දේ 2022 දෙසැම්බර් 14 වන දිනයි. එබැවින්, එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි විය යුතු සීමාව වෙනස්කිරීමෙන් 2022 එකතු කළ අගය මත බදු ආදායම් රැස් කිරීම සඳහා බලපෑමක් සිදු නොවිය. එමෙන්ම, සහාධිපත්‍ය දේපල විකිණීම සඳහා නිදහස් කිරීම ඉවත් කිරීම 2022 ජනවාරි 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි හඳුන්වාදෙන ලදී. එබැවින්, ඉහත හේතුන් මත දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට එකතු කළ අගය මත බද්ද සඳහා ඇස්තමේන්තුගත ආදායම රැස් කිරීමට නොහැකි වී ඇත.

ආනයන මත එ.අ.බ. සැසඳීමේ දී දේශීය සැපයුම් මත එකතු කළ එ.අ.බ. රුපියල් බිලියන 120 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. වර්ෂය සඳහා එකතු කල මුළු දේශීය එ.අ.බ. රුපියල් මිලියන 291,619 ක් වූ අතර එය 2021 වසරේ රැස් කල රුපියල් මිලියන 185,462 ක ප්‍රමාණය 57.24% කින් වැඩවීමකි. ඒ අතර, 2022 වර්ෂය තුළ ආනයන මත එකතු කල එ.අ.බ. පෙර වර්ෂය ඉක්මවා ගිය 43% ක වැඩිවීමක් පෙන්විය.

එ.අ.බ. දළ රැස් කිරීම, ආපසු ගෙවීම් සහ ශුද්ධ රැස් කිරීම 2.8 වන වගුව මගින් අංශවලට අදාළව දක්වා ඇත. 2022 වර්ෂය තුළදී එකතු කළ අගය මත බද්දෙහි අංශවලට අදාළ එකතුකිරීම 2.5 සටහන මඟින් නිරූපණය කෙරේ.

**2.8 වගුව : එකතු කළ අගය මත බදු දළ එකතු කිරීම සහ ආපසු ගෙවීම්**

| අංශය | 2022 | | | 2021 |
|---|---|---|---|---|
| | දළ රැස් කිරීම (රු.) | ආපසු ගෙවීම් | ශුද්ධ රැස් කිරීම (රු.) | ශුද්ධ රැස් කිරීම (රු.) |
| නිෂ්පාදන | 112,814,295,865 | 673,522,064 | 112,140,773,801 | 39,635,391,763 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **නිෂ්පාදන නොවන** | | | | | |
| සේවා | 116,010,177,196 | | 116,010,177,196 | 78,509,090,905 | |
| මූලා සේවා | 63,468,269,737 | | 63,468,269,737 | 67,317,686,840 | 145,826,777,745 |
| **ආනයන** | 171,478,020,566 | 25,581,768 | 171,452,438,798 | | 122,750,875,084 |
| **එකතුව** | | | **463,071,659,532** | | **308,213,044,592** |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

**සටහන 2.5 : අංශවලට අදාළව එකතු කළ අගය මත බදු රැස් කිරීම**




මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

වර්ෂය තුළ දී, දළ දේශීය නිෂ්පාදිතයට එකතු කළ අගය මත බද්දෙහි නිෂ්පාදන අංශයේ දායකත්වය 0.46% ක් වන විට නිෂ්පාදන නොවන අංශයේ ආදායම් රැස් කිරීම 0.74% ක් හා ආනයන අංශයේ රැස් කිරීම 0.71% ලෙස වාර්තා කරයි. එකතු කල අගය මත බදු ශුද්ධ රැස් කිරීම් ආංශික වශයෙන් හා එකතු කල අගය මත බද්ද දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 2.9 වගුවේ දක්වා ඇති අතර එය 2.6 සටහන මගින් නිරූපණය කෙරේ.

**2.9 වගුව : දළ දේශීය නිෂ්පාදිතයට එකතු කළ අගය මත බද්දෙහි දායකත්වය අංශවලට අදාළව විශ්ලේෂණය කිරීම.**

| අංශය | 2022 | | 2021 | | දළ දේශීය නිෂ්පාදිතයට එ.අ.බ. එකතු කිරීමේ ප්‍රතිශතය | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ශුද්ධ එකතු කිරීම ( රු. ) | % | ශුද්ධ එකතු කිරීම ( රු. ) | % | 2022 | 2021 | 2020 | 2019 | 2018 |
| නිෂ්පාදන අංශය | 112,140,773,801 | 24.22% | 39,635,391,763 | 12.86% | 0.46% | 0.23% | 0.27% | 0.54% | 0.52% |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| නිෂ්පාදන නොවන අංශය | 179,478,446,933 | 38.76% | 145,826,777,745 | 47.31% | 0.74% | 0.83% | 0.67% | 1.19% | 1.32% |
| ආනයන මත | 171,452,438,798 | 37.03% | 122,750,875,084 | 39.83% | 0.71% | 0.70% | 0.55% | 1.07% | 1.24% |
| **එකතුව** | **463,071,659,532** | **100.00%** | **308,213,044,592** | **100.00%** | **1.92%** | **1.75%** | **1.49%** | **2.79%** | **3.01%** |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

**සටහන 2.6 : ද.දේ.නි. ට එකතු කළ අගය මත බද්දෙහි දායකත්වය අංශවලට අදාළව විශ්ලේෂණය කිරීම**




මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.7 විගණනය

ව්‍යාපාර ක්‍රියාකාරකම්, අස්ථිත්වයේ වර්ගය සහ ව්‍යාපාරයේ ප්‍රමාණය ප්‍රකාරව බදු ගෙවන්නන්ගේ ගහනය පුළුල් ලෙස ආවරණය වන පරිදි විගණනය සහ විමර්ශනය 2022 වසර තුළදී සිදු කරන ලදී. ඒ අනුව, වර්ෂය තුළ විගණන 6,989 ක් ආරම්භ කර විගණන 5,356 ක් සම්පූර්ණ කිරීමට හැකි වී ඇත. COVID-19 වසංගතයේ පහව යෑම සහ නිලධාරීන්ට අමතර ආදායම් ඉලක්ක ලබා දීම හේතුවෙන් මෙම සංඛ්‍යා සාක්ෂාත් කර ගැනීමට හැකි විය.

විගණන විස්තර සහ විගණනයන් මඟින් එකතු කළ ආදායම පිළිබඳ විස්තර වගුව 2.10 සහ වගුව 2.11 දක්වා ඇත.

**2.10 වගුව : විගණන විස්තර**

රු. '000

| | ආදායම් බදු | එ.අ.බ. | උ.වි.ගෙ. | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|
| වර්ෂය තුල තක්සේරු කළ මුළු අතිරේක බදු ප්‍රමාණය | 14,462,306 | 24,474,784 | 34,718 | 2,156,502 | 41,128,310 |
| වර්ෂය තුළ රැස් කළ මුළු අතිරේක බදු ප්‍රමාණය | 9,558,275 | 1,709,536 | 32,351 | 2,011,361 | 13,311,523 |
| වර්ෂය තුළ ආරම්භ කළ විගණන පරීක්ෂණ සංඛ්‍යාව | 6,989 | | | | |
| වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද විගණන පරීක්ෂණ සංඛ්‍යාව | 5,356 | | | | |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

**2.11 වගුව : සංස්ථාපිත සහ වෙනත් අංශ මගින් රැස් කරන ලද අතිරේක බදු වර්ගීකරණය කිරීම (දණ්ඩන හැර)**

| විස්තරය | තක්සේරු නිකුත් කල සහ එකඟ වූ අතිරේක ආදායම/ පිරිවැටුම (රු. '000) | තක්සේරු නිකුත් කල සහ එකඟ වූ අතිරේක බදු (රු. '000) | | | | රැස් කල අතිරේක බදු (රු. '000) |
|---|---|---|---|---|---|---|
| | | සංස්ථාපිත - විශාල පරිමාණ බදු ගෙවන්නන්ගේ අංශය | සංස්ථාපිත - වෙනත් | වෙනත් අංශ | එකතුව | |
| ආදායම් බදු | 72,492,938 | 9,309,070 | 2,821,388 | 2,331,848 | 14,462,306 | 9,558,275 |
| එ.අ.බ. | 41,290,392 | 1,252,385 | 1,609,445 | 21,612,954 | 24,474,784 | 1,709,536 |
| උ.වි.ගෙ. | 203,029 | 33,913 | 805 | - | 34,718 | 32,351 |
| වෙනත් | 61,791,716 | 1,928,168 | 127,595 | 100,738 | 2,156,502 | 2,011,361 |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.8 අභියාචනා

ගත වූ වර්ෂය තුළ නිකුත් කළ තක්සේරු වලට එදිරිව ලැබී ඇති අභියාචනා 1,011ක් නිරවුල් කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමත් වූ අතර අභියාචනා විශ්ලේෂණය පහත පරිදි වේ.

**2.12 වගුව : ලැබුණු සහ නිරවුල් කළ අභියාචනා විශ්ලේෂණය**

| | ආදායම් බදු | එ.අ.බ. | උ.වි.ගෙ | ආ.සේ.ගා. | ජා.ගො.බ. | ර.ගැ.බ. | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **2022.01.01** දිනට ශේෂය | 210 | 187 | 2 | 1 | 123 | 0 | 523 |
| වර්ෂය තුල ලියාපදිංචි වීම **(APL 2** ප්‍රකාරව**)** | 717 | 1,329 | 7 | 0 | 138 | 3 | 2,194 |
| සමථයට පත් කළ | 431 | 405 | 2 | 0 | 172 | 1 | 1,011 |
| කොමසාරිස් ජනරාල්වරයාගේ කරුණු විමසීම සඳහා ඉදිරිපත් කල | 66 | 81 | 3 | 1 | 23 | 0 | 174 |
| **2022.12.31** වන දිනට ශේෂය | 430 | 1,030 | 4 | 0 | 66 | 2 | 1,532 |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## 2.1.9 බදු ගෙවන්නන් ලියාපදිංචි කිරීමේ විස්තර

2022 වර්ෂය අවසන් වන විට විවිධ බදුකරණ කාර්යයන් සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග ලියාපදිංචි වී ඇති තැනැත්තන් සංඛ්‍යාව 2.13 වන වගුවේ දක්වා ඇත.

**2.13 වගුව : ලියාපදිංචි වී ඇති බදු ගෙවන්නන් සංඛ්‍යාව**

| | 2021.12.31 දිනට | | 2022.12.31 දිනට | |
|---|---|---|---|---|
| ආදායම් බදු | | | | |
| *සංස්ථාපිත* | | | | |
| වාසික සමාගම්/ නිර්වාසික සමාගම් | 68,009 | | 73,444 | |
| *සංස්ථාපිත නොවන* | | | | |
| තනි පුද්ගල | 292,305 | | 204,467 | |
| හවුල් ව්‍යාපාර | 16,798 | | 13,766 | |
| උපයන විට ගෙවීම (උ.වි.ගෙ.)/ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (අ.පු.ආ.බ.) යෝජනා ක්‍රමය යටතේ ආදායම් බදු ගෙවන සේවා නියුක්තිකයින් | 32,702 | | 41,636 | |
| **ආදායම් බදු ගෙවන්නන්ගේ එකතුව** | | **409,814** | | **333,313** |
| වෙනත් බදු ගෙවන්නන් | | | | |
| එකතු කළ අගය මත බදු (එ.අ.බ.) සඳහා ලියාපදිංචි වී ඇති තැනැත්තන් | 9,070 | | 10,604 | |
| මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වී ඇති තැනැත්තන් | 246 | | 258 | |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචි වී ඇති තැනැත්තන් | 0 | | 5,422 | |
| ඔට්ටු සහ සූදු බදු ගෙවන්නන් සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 660 | | 624 | |
| **වෙනත් බදු ගෙවන්නන්ගේ එකතුව** | | **9,976** | | **16,908** |
| උ.වි.ගෙ./ අ.පු.ආ.බ. යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි වී ඇති සේවා යෝජකයින් | 34,985 | | 34,596 | |
| පොලිය මත රඳවාගැනීමේ බද්ද/ අ.ආ.බ. සඳහා ලියාපදිංචි වී ඇති රඳවාගැනීමේ බදු/ අත්තිකාරම් ආදායම් බදු අනුයෝජිතයින් | 604 | | 612 | |
| විශේෂිත ගාස්තු මත රඳවාගැනීමේ බදු/ අ.ආ.බ. සඳහා ලියාපදිංචි වී ඇති රඳවාගැනීමේ බදු/ අත්තිකාරම් ආදායම් බදු අනුයෝජිතයින් | 41,862 | | 41,897 | |
| මුද්දර ගාස්තු (විධිමත් මාසික උපලේඛනයන් යවන්නන්) | 9,854 | | 10,221 | |
| | | **87,305** | | **87,326** |
| **ලියාපදිංචි වී ඇති මුළු බදු ගෙවන්නන් සංඛ්‍යාව** | | **507,095** | | **437,547** |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## 2.1.10 ඵලදායීතා අනුපාතය

2022 වර්ෂය තුල දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මුළු වියදම රු. මිලියන 8,713 ක් වන අතර රැස් කළ ආදායම රුපියල් මිලියන 1,058,080 ක් වේ. එහෙයින්, ඵලදායීතා අනුපාතය (එනම්, වියදම් කළ සෑම රුපියලක් සඳහාම එකතු කළ ආදායම) 121:1 ක් වේ. නැතහොත්, රුපියල් 100/- ක් එකතු කිරීමට වැය වන පිරිවැය ශත 82 කි. ආනයන මත එ.අ.බ., ජා.ගො.බ., ආ.සේ.ගා.

සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද හැර රුපියල් 100/- ක් එකතු කිරීමට වැය වන පිරිවැය රුපියල් 1 කි. (වර්ෂ 2021 දී මෙම අගයන් පිළිවෙලින් ශත 72 ක් සහ ශත 90 ක් විය.) වර්ෂ 2020 සිට 2022 දක්වා ආදායම් එකතු කිරීමේ වර්ගීකරණය, මුළු වියදම සහ රැස් කිරීමේ පිරිවැය 2.4 වගුව මඟින් පෙන්වා දෙයි.

**2.14 වගුව : ආදායම් රැස් කිරීම, මුළු වියදම සහ රැස් කිරීමේ පිරිවැය**

රු. මිලියන

| විස්තරය | 2020 | 2021 | 2022 |
|---|---|---|---|
| ආදායම එකතු කිරීම | | | |
| ආදායම් බද්ද | 252,941.57 | 300,544.59 | 524,533.80 |
| ප්‍රාග්ධන ලාභ බද්ද | 357.59 | 667.88 | 5,315.39 |
| එකතු කළ අගය මත බද්ද | 233,786.12 | 308,213.04 | 463,071.66 |
| ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද | - | 174.62 | 3,969.89 |
| ණය ආපසු ගෙවීමේ බද්ද | 3,002.27 | 7.57 | 81.80 |
| ඔට්ටු හා සූදු බද්ද | 1,428.07 | 1,939.35 | 5,244.76 |
| කොටස් ගණුදෙනු බද්ද | 2,347.28 | 6,964.48 | 4,215.86 |
| විගමන බද්ද | 5.85 | 17.03 | 10.73 |
| මුද්දර ගාස්තු | 11,354.84 | 12,949.84 | 12,719.61 |
| ආර්ථික සේවා ගාස්තු | 14,950.04 | 728.11 | 201.75 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 3,740.46 | 599.13 | 585.05 |
| භාණ්ඩ හා සේවා බද්ද | 0.23 | 0.24 | - |
| පිරිවැටුම් බද්ද | 16.26 | 18.74 | 7.47 |
| ජාතික ආරක්ෂක බද්ද | 2.40 | 0.32 | 11.31 |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 0.64 | 0.42 | 0.42 |
| ප්‍රේෂණ ගාස්තු | - | 5.21 | - |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | - | - | 36,111.03 |
| කැසිනෝ බලපත්‍ර ගාස්තු | - | - | 2,000.00 |
| **මුළු එකතු කිරීම** | **523,933.62** | **632,830.59** | **1,058,080.10** |
| වියදම | | | |
| පුනරාවර්තන වියදම | | | |
| පඩිනඩි | 2,736.63 | 2,707.27 | 2,994.54 |
| ගමන් වියදම් | 7.09 | 2.62 | 3.64 |
| සැපයුම් හා උපකරණ | 121.00 | 136.34 | 219.11 |
| නඩත්තු හා අළුත්වැඩියා | 158.78 | 183.54 | 203.79 |
| කොන්ත්‍රාත් සේවා | 593.20 | 584.13 | 625.17 |
| මාරුකිරීම් | 44.76 | 33.58 | 35.32 |
| වෙනත් (පාඩු හා කපාහැරීම්) | 0.22 | - | - |
| ප්‍රාග්ධන වියදම | | | |
| ප්‍රතිසංස්කරණ හා වැඩි දියුණු කිරීම | 139.77 | 38.73 | 9.57 |
| අත්පත් කර ගැනීම | 65.01 | 50.62 | 16.90 |
| ධාරිතා ගොඩනැංවීම | 19.74 | 17.01 | 26.74 |
| ආයෝජන ( RAMIS ව්‍යාපෘතිය) | 227.60 | 823.16 | 4,578.31 |
| ආයෝජන (නව දේශීය ආදායම් පනත) | 375.92 | - | - |
| **මුළු වියදම** | **4,489.72** | **4,577.00** | **8,713.10** |

| | | | |
|---|---|---|---|
| රු.100 ක් රැස් කිරීම සඳහා පිරිවැය | 0.86 | 0.72 | 0.82 |
| රු.100 ක් රැස් කිරීම සඳහා පිරිවැය (ආනයන මත එකතු කළ අගය මත බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද, ආර්ථික සේවා ගාස්තු සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද හැර) | 1.03 | 0.90 | 1.00 |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## 2.1.11 බදු ගෙවන්නන් සහ බදු වෘත්තිකයන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

2022 වර්ෂය තුළ බදු ගෙවන්නන් සහ බදු වෘත්තිකයින් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලදි. මෙම වැඩ සටහන්වලදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු වූයේ බදු නීතියේ වෙනස්වීම් පිළිබඳව සහ මාර්ගගත සේවාව හරහා බදු වාර්තා ගොනු කිරීම සම්බන්ධයෙන් දැනුම ලබාදීමයි. මාර්ගගත සහ භෞතික යන දෙයාකාරයටම වැඩසටහන් පවත්වන ලද අතර මෙම වැඩසටහන්වල පටිගතකිරීම් වලට සමාජ මාධ්‍ය හරහා ප්‍රවේශ වීමේ හැකියාව ලබා දී ඇත.

**2. 15 වගුව : 2022 වර්ෂයේදී බදු ගෙවන්නන් සහ බදු වෘත්තිකයන් සඳහා පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන්**

| අංකය | විෂය | ආයතනය | සහභාගී වූ පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | එකතු කළ අගය මත බද්ද සහ මුද්දර ගාස්තු | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | 150 |
| 2 | බදු ගෙවන්නන් ලියාපදිංචිය | බදු ගෙවන්නන් ලියාපදිංචිය පුහුණු කිරීම - ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (SARTTAC) | 100 |
| 3 | අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (අ.පු.ආ.බ.)/ උ.වි.ගෙ. – 21/22 | බදු ගෙවන්නන්/විගණන සමාගම්/ බදු උපදේශකවරුන් සහ විෂය පිළිබඳ උනන්දුවක් දක්වන සියළු පාර්ශවයන් | දැනුවත් කිරීමේ වැඩ සටහන් පටිගත කර දේශීය ආදායම් You Tube Channel වෙත උඩුගත කෙරුණු අතර අදාළ සම්බන්ධතාවයන් පාරිභෝගිකයින් වෙත විද්‍යුත් තැපැල හරහා යැවීමට කටයුතු කෙරුණු අතර මෙම වැඩ සටහන් දෙපාර්තමේන්තු මුහුණු පොතේ සහ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇත |
| 4 | ර.ගැ.බ./අ.ආ.බ. 21/22 | | |
| 5 | සරල කරන ලද එකතු කළ අගය මත බද්ද | | |
| 6 | එකතු කළ අගය මත බද්ද | නාගරික සංවර්ධන අධිකාරිය | 100 |
| 7 | ගෙවිය යුතු ඇස්තමේන්තුගත ආදායම් බදු ප්‍රකාශය - 2022/2023 | බදු ගෙවන්නන්/විගණන සමාගම්/ බදු උපදේශකවරුන් සහ විෂය පිළිබඳ උනන්දුවක් දක්වන සියළු පාර්ශවයන් | දැනුවත් කිරීමේ වැඩ සටහන් පටිගත කර දේශීය ආදායම් You Tube Channel වෙත උඩුගත කෙරුණු අතර අදාළ සම්බන්ධතාවයන් පාරිභෝගිකයින් වෙත විද්‍යුත් තැපැල හරහා යැවීමට කටයුතු කෙරුණු අතර මෙම වැඩ සටහන් දෙපාර්තමේන්තු මුහුණු පොතේ සහ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇත |
| 8 | ද්විත්ව බදු/ බාහිර ප්‍රේෂණ | ලංකා විදුලි බල මණ්ඩලය | Microsoft Teams හරහා 250 |
| 9 | බදුකරණය | අධ්‍යාපන අමාත්‍යාංශය (ගුරුවරුන් සඳහා වැඩමුළුව) | 250 |

| | | | |
|---|---|---|---|
| 10 | සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද - ( සිංහල මාධ්‍යය) | බදු ගෙවන්නන්/විගණන සමාගම්/ බදු උපදේශකවරුන් සහ විෂය පිළිබඳ උනන්දුවක් දක්වන සියළු පාර්ශවයන් | දැනුවත් කිරීමේ වැඩ සටහන් පටිගත කර දේශීය ආදායම් You Tube Channel වෙත උඩුගත කෙරුණු අතර අදාළ සම්බන්ධතාවයන් පාරිභෝගිකයින් වෙත විද්‍යුත් තැපැල හරහා යැවීමට කටයුතු කෙරුණු අතර මෙම වැඩ සටහන් දෙපාර්තමේන්තු මුහුණු පොතේ සහ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇත |
| 11 | සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද - (ඉංග්‍රීසි මාධ්‍යය) | | |
| 12 | සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද - (දෙමළ මාධ්‍යය) | | |
| 13 | බදු නීති සහ ප්‍රතිපත්තීන් | කර්මාන්ත සංවර්ධන මණ්ඩලය- ගම්පහ | 200 |
| 14 | බදු ක්‍රියාපටිපාටීන් සහ කර්මාන්ත අංශය | වාණිජ හා කර්මාන්ත මණ්ඩලය - යාපනය | (Webinar) 350 |
| 15 | සංස්ථාපිත ආදායම් බදු 2021/2022 (සිංහල මාධ්‍යය) | බදු ගෙවන්නන්/විගණන සමාගම්/ බදු උපදේශකවරුන් සහ විෂය පිළිබඳ උනන්දුවක් දක්වන සියළු පාර්ශවයන් | දැනුවත් කිරීමේ වැඩ සටහන් පටිගත කර දේශීය ආදායම් You Tube Channel වෙත උඩුගත කෙරුණු අතර අදාළ සම්බන්ධතාවයන් පාරිභෝගිකයින් වෙත විද්‍යුත් තැපැල හරහා යැවීමට කටයුතු කෙරුණු අතර මෙම වැඩ සටහන් දෙපාර්තමේන්තු මුහුණු පොතේ සහ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇත |
| 16 | ආදායම් බදු සහ උ.වි.ගෙ | ජාතික බදුකරණ ආයතනය | 200 |
| 17 | බදුකරණය සහ රජයේ බදු ප්‍රතිපත්තීන් | අධ්‍යාපන අමාත්‍යාංශය (කලාවැව) | 150 |
| 18 | සංස්ථාපිත ආදායම් බදු 2021/2022 (ඉංග්‍රීසි මාධ්‍යය) | බදු ගෙවන්නන්/විගණන සමාගම්/ බදු උපදේශකවරුන් සහ විෂය පිළිබඳ උනන්දුවක් දක්වන සියළු පාර්ශවයන් | දැනුවත් කිරීමේ වැඩ සටහන් පටිගත කර දේශීය ආදායම් You Tube Channel වෙත උඩුගත කෙරුණු අතර අදාළ සම්බන්ධතාවයන් පාරිභෝගිකයින් වෙත විද්‍යුත් තැපැල හරහා යැවීමට කටයුතු කෙරුණු අතර මෙම වැඩ සටහන් දෙපාර්තමේන්තු මුහුණු පොතේ සහ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇත |
| 19 | තනි පුද්ගල ආදායම් බදු 2021/2022 (දෙමළ මාධ්‍යය) | | |
| 20 | හවුල් ව්‍යාපාර ආදායම් බදු 2021/2022 (දෙමළ මාධ්‍යය) | | |
| 21 | සංස්ථාපිත ආදායම් බදු 2021/2022 (දෙමළ මාධ්‍යය) | | |
| 22 | තනි පුද්ගල ආදායම් බදු 2021/2022 (සිංහල මාධ්‍යය) | | |
| 23 | හවුල් ව්‍යාපාර ආදායම් බදු 2021/2022 (සිංහල මාධ්‍යය) | | |
| 24 | තනි පුද්ගල ආදායම් බදු 2021/2022 (ඉංග්‍රීසි මාධ්‍යය) | | |
| 25 | හවුල් ව්‍යාපාර ආදායම් බදු 2021/2022 (ඉංග්‍රීසි මාධ්‍යය) | | |
| 26 | තනි පුද්ගල ආදායම් බදු 2021/2022 ඊ ගොනු කිරීම | | |
| 27 | හවුල් ව්‍යාපාර ආදායම් බදු 2021/2022 ඊ ගොනු කිරීම | | |
| 28 | නව බදු ප්‍රතිපත්තීන් | සෞඛ්‍ය අමාත්‍යාංශය කුකුලේගඟ | 300 |
| 29 | නව බදු ප්‍රතිපත්තීන් | ජාතික විගණන කාර්යාලය | 1,300 |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.12 වාර්තා අනුකූලතාවය

බදු ගෙවන්නා විසින් නියමිත වේලාවට බදු වාර්තා පිරවීම සහ ස්වයං තක්සේරු පදනම මත බදු ගෙවීම් අනුකූලතාවය ඉහල නැංවීම සඳහා වර්ෂය මුළුල්ලේ වැඩසටහන් අඛණ්ඩව පැවැත්වුණි.

**2.16 වගුව : 2017/2018 – 2021/2022 ආදායම් බදු වාර්තා අනුකූලතාවය**

| තක්සේරු වර්ෂය | අංශය | නියමිත දිනට අනුකූලතාවය | නියමිත දින සිට එක් මාසයක් තුල අනුකූලතාවය |
|---|---|---|---|
| 2017/2018 | සංස්ථාපිත | 47% | 51% |
| | සංස්ථාපිත නොවන | 31% | 38% |
| 2018/2019 | සංස්ථාපිත | 47% | 50% |
| | සංස්ථාපිත නොවන | 32% | 38% |
| 2019/2020* | සංස්ථාපිත | 46% | |
| | සංස්ථාපිත නොවන | 31% | |
| 2020/2021* | සංස්ථාපිත | 26% | |
| | සංස්ථාපිත නොවන | 21% | |
| 2021/2022 | සංස්ථාපිත | 32% | 34% |
| | සංස්ථාපිත නොවන | 33% | 38% |

*ආදායම් බදු වෙනුවෙන් 2019/2020 තක්සේරු වර්ෂය සඳහා නියමිත දිනට වාර්තා භාරදීම 2020 පෙබරවාරි මස 28 වන දින දක්වා ද 2020/2021 තක්සේරු වර්ෂය සඳහා 2021 දෙසැම්බර් මස 31 වන දින දක්වා ද දීර්ඝ කරන ලදී. දීර්ඝ කරන ලද දිනය නියමිත දිනය ලෙස සළකා තොරතුරු ලබා දී ඇත.

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

**2.17 වගුව : එකතු කල අගය මත බද්ද සහ උ.වි.ගෙ. මත බදු වාර්තා අනුකූලතාවය**

| වර්ෂය | එකතු කල අගය මත බද්ද | උපයන විට ගෙවීම | |
|---|---|---|---|
| 2021 වර්ෂය | 47% | තක්සේරු වර්ෂය 2020/2021 | 15% |
| 2022 වර්ෂය | 46% | තක්සේරු වර්ෂය 2021/2022 | 11% |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

තක්සේරු වර්ෂය තුළ දී සංස්ථාපිත නොවන අංශයේ ආදායම් බදු වාර්තා ගොනුකිරීමේ ප්‍රතිශතය 33% ක් වූ අතර නියමිත දින සිට මාසයක් ඇතුළත එය 38% දක්වා ඉහළ ගොස් ඇත. නියමිත දින සිට මාස දෙකකට පසුව අනුකූලතා අනුපාතය 41% කි. සංස්ථාපිත අංශය සම්බන්ධයෙන් ගත් කළ, එය නියමිත දිනට 32% ක් වූ අතර නියමිත දින සිට මාසයක් ඇතුළත එය 34% කි. මෙම අංශයේ නියමිත දින සිට මාස දෙකකට පසුව අනුකූලතා අනුපාතය 35% කි.

සංස්ථාපිත ආදායම් බදු වාර්තා, තනි පුද්ගල ආදායම් බදු වාර්තා සහ හවුල් ව්‍යාපාර ආදායම් බදු වාර්තා වෙනුවෙන් 2021/2022 තක්සේරු වර්ෂය සඳහා වාර්තා භාරදිය යුතු නියමිත දිනය 2022 දෙසැම්බර් මස 07 වන දින දක්වා දීර්ඝ කරන ලදී. කොවිඩ් -19 වසංගත තත්වය හේතුවෙන් ඇතිවූ අස්ථාවරත්වය පහව යෑම හේතුවෙන් ආදායම් බදු අනුකූලතාවය 2020 වර්ෂය හා සසඳන විට 2022 වර්ෂය තුළ සුළු වැඩිවීමක් පෙන්නුම් කරයි.

### 2.1.13 පැහැරහරින ලද බදු

2022 දෙසැම්බර් මස 31 වන දිනට පැහැරහරින ලද බදු ප්‍රමාණයන්, ආරවුල්ගත බදු ප්‍රමාණයන්, සහ රැස් කළ හැකි බදු ප්‍රමාණයන් දණ්ඩන සමග 2.18 වන වගුවේ දක්වා ඇත.

**2.18 වගුව : පැහැරහරින ලද බදු විශ්ලේෂණය - 2022 .12.31 වන දිනට**

| බදු වර්ගය | මුළු පැහැර හරින ලද බදු ප්‍රමාණය (රු.) | දණ්ඩන සහ පොළිය (රු.) | ආරවුල්ගත බදු ප්‍රමාණය (රු.) | ආරවුල්ගත බදු ආශ්‍රිත දණ්ඩන සහ පොළිය (රු.) | රැස් කළ හැකි බදු (රු.) | රැස් කළ හැකි බදු ආශ්‍රිත දණ්ඩන සහ පොළිය (රු.) |
|---|---|---|---|---|---|---|
| ආදායම් බද්ද | 287,136,530,311 | 182,669,954,650 | 257,883,922,729 | 165,007,061,926 | 29,252,607,582 | 17,662,892,723 |
| ආදායම් බද්ද මත අධිභාරය | 164,565,071 | 110,267,535 | 164,565,071 | 110,267,535 | - | - |
| රඳවා ගැනීමේ බද්ද | 4,063,421,933 | 2,064,423,605 | 3,676,486,992 | 1,884,556,898 | 386,934,941 | 179,866,707 |
| එකතු කළ අගය මත බද්ද | 135,263,986,217 | 132,040,832,942 | 75,135,255,645 | 82,111,749, 800 | 60,128,730,573 | 49,929,083,143 |
| එකතු කළ අගය මත බද්ද - මූල්‍ය සේවා | 66,825,973,698 | 35,163,245,028 | 64,174,139,166 | 33,579,149,119 | 2,651,834,533 | 1,584,095,909 |
| ආර්ථික සේවා ගාස්තු | 6,513,335,178 | 4,330,847,455 | 6,492,491,513 | 4,315,765,446 | 20,843,665 | 15,082,009 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 19,282,563,836 | 12,559,564,359 | 18,859,785,223 | 12,236,560,979 | 422,778,613 | 323,003,379 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද- මූල්‍ය සේවා | 2,711,267,817 | 1,390,042,620 | 2,542,604,776 | 1,301,040,488 | 168,663,041 | 89,002,132 |
| මුද්දර ගාස්තු | 9,732,724 | 4,866,362 | 9,732,724 | 4,866,362 | - | - |
| හර බද්ද | 2,215,581,368 | - | 2,215,581,368 | - | - | - |
| පිරිවැටුම් බද්ද | 710,139,795 | 356,616,755 | 710,139,795 | 356,616,755 | - | - |
| ජාතික ආරක්ෂක බද්ද | 761,131,631 | 324,789,855 | 761,131,631 | 324,789,855 | - | - |
| ජාතිය රැක ගැනීමේ අරමුදල | 12,614,971 | 3,196,002 | 12,614,971 | 3,196,002 | - | - |
| ධන බද්ද | 38,589 | 24,143 | 38,589 | 24,143 | - | - |
| සමාජ වගකීම් බද්ද | 732,401 | 11,523 | 732,401 | 11,523 | - | - |
| ණය ආපසු ගෙවීමේ බද්ද | 826,602,417 | 461,203,212 | 822,692,772 | 417,720,394 | 3,909,645 | 43,482,818 |
| ඔට්ටු හා සූදු බද්ද | 4,332,826,778 | 1,658,401,481 | 3,986,321,389 | 1,463,934,580 | 346,505,389 | 194,466,901 |
| අත්තිකාරම් සමාගම් බද්ද | 75,706 | 24,167 | 75,706 | 24,167 | - | - |
| ආරක්ෂක බද්ද | 207,367,713 | 85,941,071 | 207,367,713 | 85,941,071 | - | - |
| සංයුක්ත දණ්ඩන | - | 79,439,858 | - | 58,130,162 | - | 21,309,696 |
| **එකතුව** | **531,038,488,155** | **373,303,692,623** | **437,655,680,173** | **303,261,407,205** | **93,382,807,982** | **70,042,285,419** |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.14 2022 වර්ෂයේ එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් සිදු කළ ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම්

*2.1.14.1 මූල්‍ය සේවා සැපයීම මත එකතු කළ අගය මත බදු අනුපාතය*

2022 ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි නිශ්චිත ආයතනයක් හෝ වෙනත් පුද්ගලයෙකු විසින් මූල්‍ය සේවා සැපයීම මත එකතු කළ අගය මත අනුප්‍රමාණය 15% සිට 18% දක්වා වැඩි කරන ලදී.

යම් විශේෂිත ආයතනයක් හෝ වෙනත් තැනැත්තෙකු 2022 ජනවාරි මස 01වන දින සිට සංශෝධන පනත සහතික කල දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා 15% ක අනුප්‍රමාණයකින් මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු ගෙවා ඇති විට සංශෝධන පනත් සහතික කිරීමෙන් පසුව එළඹෙන මාසයේ විසිවන දින හෝ එදිනට පෙර (එනම්, 2022 අප්‍රේල් මස 20 වන දින) ඉතිරි බදු මුදල් ප්‍රමාණය ගෙවිය යුතු වේ. එසේ බදු ගෙවා ඇත්නම්, එවැනි විශේෂිත ආයතනය හෝ තැනැත්තා එකතු කළ අගය මත බදු පනතේ විධිවිධාන ප්‍රකාරව බදු පැහැර හැර ඇත්තෙකු ලෙස නොසලකනු ලබන්නේය.

*2.1.14.2 එකතු කළ අගය මත බදු අනුප්‍රමාණ සංශෝධන*

2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 අ වගන්තිය යටතේ ප්‍රකාශයට පත්කරන ලද 2022 මැයි 31 දිනැති අංක 2282/26 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව, 2022 ජූනි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අතය මත බදු අනුපාතය පහත දක්වා ඇති පරිදි සංශෝධන කරන ලදී.

(අ) ආනයන භාණ්ඩ (රෙදිපිළි)

H.S. කේතයන්හි සහ 2018 නොවැම්බර් මස 01වන දිනැති අංක 2095/20 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ උපලේඛනයේ I සහ II තීරුවේ දක්වා ඇති විස්තරය ප්‍රකාරව දක්වා ඇති රෙදිපිළි ආනයනය - සියයට බින්දුව (0%)

(ආ) සම්මත අනුප්‍රමාණය

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි හෝටලයක්, තානායමක්, අවන්හලක් හෝ ඒ හා සමාන සේවා සපයන වෙනත් සමාන ව්‍යාපාරයක් මඟින් සේවා සැපයීම ඇතුළත්ව ඉහත (අ) ඡේදය යටතේ සඳහන් කර ඇති ආනයන භාණ්ඩ හැර භාණ්ඩ හෝ සේවා ආනයනය සහ/හෝ සැපයීම වෙනුවෙන් (එවැනි සේවා සැපයීම මත 2019 දෙසැම්බර් මස 01 වන දින සිට එකතු කළ අගය මත බද්ද වූයේ සියයට බින්දුව) - සියයට දොළහ (12%)

2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 අ වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද 2022 අගෝස්තු මස 31 දිනැති අංක 2295/08 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව

2022 සැප්තැම්බර් මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බදු අනුප්‍රමාණය පහත දක්වා ඇති පරිදි නැවත වරක් සංශෝධනය කර ඇත.

(අ) සම්මත අනුප්‍රමාණය

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි හෝටලයක්, තානායමක්, අවන්හලක් හෝ ඒ හා සමාන සේවා සපයන වෙනත් සමාන ව්‍යාපාරයක් මඟින් සේවා සැපයීම ඇතුළත්ව ඉහත (අ) ඡේදය යටතේ සඳහන් කර ඇති ආනයන භාණ්ඩ හැර භාණ්ඩ හෝ සේවා ආනයනය සහ/හෝ සැපයීම වෙනුවෙන් (එවැනි සේවා සැපයීම මත 2019 දෙසැම්බර් මස 01 වන දින සිට එකතු කළ අගය මත බද්ද වූයේ සියයට බින්දුව) - සියයට දොළහ (15%)

### *2.1.14.3 එකතු කල අගය මත ලියාපදිංචි සීමාවේ සංශෝධන*

එකතු කල අගය මත බදු කාර්යයන් සඳහා ලියාපදිංචි වීමේ බද්දට යටත් සීමාව බදු අය කල හැකි කාලසීමාවකට රු. 75,000,000 හෝ වර්ෂයකට රු. 300,000,000 ලෙස සඳහන් වූ අගය 2022 ඔක්තෝබර් මස 01 වන දා සිට බලාත්මක වන පරිදි බදු අය කල හැකි කාලසීමාවකට රු. 20,000,000 හෝ වර්ෂයකට රු. 80,000,000 ලෙස අඩුකරන ලදී.

### *2.1.14.4 එකතු කල අගය මත බදු නිදහස්කිරීම් ඉවත්කිරීම*

යම් තැනැත්තෙකුට සභාධිපත්‍ය වාසික නවාතැන් සැපයීම මත ප්‍රදානය කළ නිදහස්කිරීම 2023 ජනවාරි මස 01 වන දා සිට බලාත්මක වන පරිදි ඉවත් කරන ලද අතර එකතු කළ අගය මත බද්දට යටත් වේ.

### *2.1.14.5 කොවිඩ් - 19 වසංගතය වෙනුවෙන් ප්‍රදානය කළ නිදහස් කිරීම් ප්‍රතිවූහගත කිරීම*

| යූ.එල්.පී.කේ. ලීලානන්ද (නියෝජිත) - පුවත්පත් බිල් | | 12/30/2022 | 246 | 1 | 1 | 0 | 1409 | 7 | 11 | 32,910 | 0 | 12/30/2022 | 32,910 | 32,910 | | 32,910 |
| එච්.ඒ.එල්. රොසිරු (නියෝජිත) - පුවත්පත් බිල් | | 12/30/2022 | 246 | 1 | 1 | 0 | 1409 | 7 | 11 | 13,800 | 0 | 12/30/2022 | 13,800 | 13,800 | | 13,800 |
| තුසාර සම්පත් (නියෝජිත) - පුවත්පත් බිල් | | 12/30/2022 | 246 | 1 | 1 | 0 | 1409 | 7 | 11 | 32,868 | 0 | 12/30/2022 | 32,868 | 32,868 | | 32,868 |
| **උප එකතුව** | | | | | | | | | | **501,403** | 0 | | **501,403** | **501,403** | - | **501,403** |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඇසෝසියේටඩ් නිව්ස්පේපර් සිලෝන් ලිමිටඩ් - පුවත්පත් මිලට ගැනීම | | 12/30/2022 | 246 | 1 | 1 | 0 | 1409 | 16 | 11 | 252,747 | 0 | 12/30/2022 | 252,747 | 252,747 | | 252,747 |
| **උප එකතුව** | | | | | | | | | | **252,747** | **0** | | **252,747** | **252,747** | - | **252,747** |
| ටාර්ගට් එන්වයරන්මන්ටල් සර්විස් කම්පනි - පිරිසිදු කිරීමේ ගාස්තු | | 12/30/2022 | 246 | 1 | 1 | 0 | 1409 | 17 | 11 | 2,977,621 | 0 | 12/30/2022 | 2,977,621 | 2,977,621 | | 2,977,621 |
| **උප එකතුව** | | | | | | | | | | **2,977,621** | **0** | | **2,977,621** | **2,977,621** | - | **2,977,621** |
| රක්නා ආරක්ෂක ලංකා ලිමිටඩ් - ආරක්ෂක සේවා | | 12/30/2022 | 246 | 1 | 1 | 0 | 1409 | 37 | 11 | 4,874,426 | 0 | 12/30/2022 | 4,874,426 | 4,874,426 | | 4,874,426 |
| **උප එකතුව** | | | | | | | | | | **4,874,426** | **0** | | **4,874,426** | **4,874,426** | - | **4,874,426** |
| විජිත යාපා ඇසෝසියේට්ස් ප්‍රයිවට් ලිමිටඩ්- වාර්ෂික දායකත්වය | | 12/30/2022 | 246 | 1 | 1 | 0 | 1505 | | 11 | 9,500 | 0 | 12/30/2022 | 9,500 | 9,500 | | 9,500 |
| **උප එකතුව** | | | | | | | | | | **9,500** | **0** | | **9,500** | **9,500** | - | **9,500** |
| ජයරත්න කන්ස්ට්‍රක්ශන් ඇන්ඩ් සප්ලයර්ස් - ගොඩනැගිලි අළුත්වැඩියා | | 12/30/2022 | 246 | 1 | 1 | 0 | 2001 | 33 | 11 | 30,763 | 0 | 12/30/2022 | 30,763 | 30,763 | | 30,763 |
| **උප එකතුව** | | | | | | | | | | **30,763** | **0** | | **30,763** | **30,763** | - | **30,763** |
| **එකතුව** | | | | | | | | | | **39,631,927** | - | | **39,631,927** | **39,631,927** | - | **39,631,927** |
| **මුළු එකතුව** | | | | | | | | | | **60,829,482** | - | | **60,829,482** | **60,829,482** | - | **60,829,482** |

ගෙවීම්/බැඳීම්වල ස්වභාවය පහත සඳහන් ආකාරයට හඳුනාගත යුතු ය.

1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු
2. රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල
3. පෞද්ගලික අංශය

බැරකම් යනු අදාළ ගිණුම් වර්ෂය ඇතුළත භාණ්ඩ, සේවාවන් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවලට අදාළ වත්කම් හා සේවාවන් ලැබී ඇති නමුත් ගිණුම් වර්ෂය තුළදී ඒ සඳහා අදාළ පාර්ශ්වයන්ට ගෙවීම් සිදුකර නොමැති ගනුදෙනුය.

බැඳීම් යනු අදාළ ගිණුම් වර්ෂය ඇතුළත භාණ්ඩ, සේවාවන් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් අදාළ වත්කම් හෝ සේවාව ආයතනය වෙත ලැබී නොමැති, එහෙත් එකී භාණ්ඩ හා සේවාවන් ලබාගැනීමේ අරමුණින් බාහිර පාර්ශවයන් සමඟ එළඹ ඇති ගිවිසුම් හෝ ලිඛිත එකඟතාවයන්ය.

ඇමුණුම - (iv)

බැරකම් පිළිබඳ ප්‍රකාශය - (i)

මු.රෙ.94 (2) සහ (3) ප්‍රකාරව බැරකම්වලට එළඹෙන ලද බැඳීම් ප්‍රකාශය

**අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**

**වියදම් ශීර්ෂ අංකය: 246**

**වැඩසටහන් අංකය හා නාමය: 01 මෙහෙයුම් වැඩසටහන**

| පුද්ගලයාගේ/ආයතනයේ නම | බැඳීම් පිළිබඳ විස්තරය | ව්‍යාපෘතිය | උප ව්‍යාපෘතිය | වැය විෂය සංකේතය | මූල්‍යකරණ සංකේතය | මු.රෙ. 94(2) හි සඳහන් ප්‍රතිපාදන අනුව එළඹිය හැකි උපරිම බැඳීම් සීමාව (රු.) | මු.රෙ. 94(3) අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.) | බැඳීම් හා බැරකම් වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|---|
| 1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු | | | | | | | | |
| .................................. | | | | | | | | |
| .................................. | | | | | | | | |
| එකතුව | නැත | | | | | | | |
| 2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල | | | | | | | | |
| .................................. | | | | | | | | |
| .................................. | | | | | | | | |
| එකතුව | නැත | | | | | | | |
| 3. වෙනත් (පෞද්ගලික අංශය) | | | | | | | | |
| .................................. | | | | | | | | |
| .................................. | | | | | | | | |
| එකතුව | නැත | | | | | | | |
| **මුළු එකතුව** | | | | | | | | |

ඇමුණුම - (v)

## බැරකම් පිළිබඳ ප්‍රකාශය - (ii)

### මු.රෙ.215 (3) (ආ) සහ (ඇ) ප්‍රකාරව තැන්පත් ගිණුමට මාරු කරන ලද ප්‍රතිපාදන

**අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**

**වියදම් ශීර්ෂ අංකය: 246**

**වැඩසටහන් අංකය හා නාමය: 01 මෙහෙයුම් වැඩසටහන**

| පුද්ගලයාගේ/ආයතනයේ නම* (ප්‍රතිපාදන මාරු කරන විට හඳුනාගෙන තිබිය යුතුය) | වගකීම් පිළිබඳ විස්තරය | ණයවර ලිපි අංක ආදිය | ප්‍රතිපාදන මාරු කරනු ලැබුවේ කුමන වැය ශීර්ෂයකින්ද | | | | තැන්පතු ගිණුම් අංකය | මාරුකරන ලද මුදල රු. |
|---|---|---|---|---|---|---|---|---|
| | | | වැඩසටහන | උප වැඩසටහන | වැය විෂය සංකේතය | මූල්‍යකරණ සංකේතය | | |
| 1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු<br>...................................<br>...................................<br>එකතුව | නැත | | | | | | | |
| 2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල<br>...................................<br>...................................<br>එකතුව | නැත | | | | | | | |
| 3. වෙනත් (පෞද්ගලික අංශය)<br>...................................<br>...................................<br>එකතුව | නැත | | | | | | | |
| **මුළු එකතුව** | | | | | | | | |

ඇමුණුම - (vi)

<u>ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පිළිබඳ ප්‍රකාශය</u>

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් වැඩසටහන

| | | රු. |
|---|---|---|
| (1) | ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර යටතේ, පරිපූරක වෙන්කිරීම්ද ඇතුළුව 2022 ඇස්තමේන්තුගත වෙන්කිරීම් | නැත |
| (2) | ඉහත (1) ට අදාළ 2022 වර්ෂය තුළදී දරන ලද මුළු වියදම | .............................. |
| (3) | 2022 ජනවාරි 01 දිනට ලැබීමට නියමිත තිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම්පෑම් වල එකතුව | .............................. |
| (4) | 2021 හා ඊට පෙර වර්ෂවලට අදාළව, 2022 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම්පෑම් වල එකතුව (ඇත්නම්) | .............................. |
| (5) | 2022 වර්ෂය සම්බන්ධයෙන් 2022 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම්පෑම් වල එකතුව | .............................. |
| (6) | 2021 හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් වූ හිමිකම්පෑම් සම්බන්ධයෙන් 2022 වර්ෂයේදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම්පෑම් වල එකතුව | .............................. |
| (7) | 2022 වර්ෂය සම්බන්ධයෙන් 2022 වර්ෂය තුළදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම්පෑම් වල එකතුව | .............................. |
| (8) | 2021 හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් 2022 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල මුළු එකතුව | .............................. |
| (9) | 2022 වර්ෂය වෙනුවෙන් 2022 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල එකතුව | .............................. |
| (10) | 2022 දෙසැම්බර් 31 දිනට ලැබීමට නියමිතව තිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම්පෑම් වල එකතුව<br>$\{(3+4+5))-(6+7))\}-(8+9$ | .............................. |
| (11) | මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2022 වර්ෂය සම්බන්ධයෙන් 2022 දෙසැම්බර් 31 දිනෙන් පසුව කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම්පෑම් වල එකතුව | .............................. |
| (12) | මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2022 දෙසැම්බර් 31 දිනෙන් පසුව ලැබුණු ප්‍රතිපූරණවල එකතුව | .............................. |
| (13) | මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කරන ලද දිනට ලැබීමට නියමිතව ඇති ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම්පෑම් වල එකතුව<br>(10 + 11 - 12) | .............................. |

ඇමුණුම - (vii)

<u>අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශය</u>

**අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**
**වියදම් ශීර්ෂ අංකය: 246**
වැඩසටහන් අංකය හා නාමය: **01** මෙහෙයුම් වැඩසටහන

| දිනය | වවුචර් අංකය | ආදායකයාගේ නම | ගෙවීමේ ස්වභාවය | ගණන (රු) |
|---|---|---|---|---|
| නැත | | | | |

ඇමුණුම - (viii)

**<u>2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 2015/03 හි උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ 2022.12.31 දිනට තත්ත්ව වාර්තාව</u>**

**අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**
**වියදම් ශීර්ෂ අංකය: 246**

| අනු අංකය | බැංකුවේ නම | ගිණුම් අංකය | **2022.12.31** දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය (රු.) | **2022.12.31** දිනට මුදල් පොත අනුව ශේෂය (රු.) | **2022.12.31** දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇතොත්) | අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය |
|---|---|---|---|---|---|---|
| 1 | ලංකා බැංකුව | 7041552 | 164,210,783.65 | - | නැත | 2022 දෙසැම්බර් |
| 2 | ලංකා බැංකුව | 7041554 | 292,829.89 | - | නැත | 2022 දෙසැම්බර් |
| 3 | ලංකා බැංකුව | 7041561 | - | - | නැත | 2022 දෙසැම්බර් |
| 4 | මහ බැංකුව | 50526 | 13,164,959.00 | - | නැත | 2022 දෙසැම්බර් |
| 5 | මහ බැංකුව | 50504 | 4,205,626.00 | - | නැත | 2022 දෙසැම්බර් |
| 6 | ලංකා බැංකුව | 7041588 | 40,500.00 | - | නැත | 2022 දෙසැම්බර් |

## 3.5 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

Rs. '000

| ආදායම් කේතය | ආදායම් කේතය පිළිබඳ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | රැස් කළ ආදායම | |
|---|---|---|---|---|---|
| | | මූලික | අවසාන | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| | ආදායම් බද්ද | | | | |
| **10.04.01.01** | ආදායම් බද්ද | **425,000,000** | **471,000,000** | **453,905,242** | **96%** |
| **10.04.01.02** | ලාභාංශ බද්ද | **6,200,000** | **1,000,000** | **250,703** | **25%** |
| **10.04.01.03** | ප්‍රේෂණ බද්ද | **5,000,000** | **3,000,000** | **1,001,849** | **33%** |
| **10.04.02.01** | උ.වි.ගෙ. | **18,000,000** | **35,000,000** | **25,546,114** | **73%** |
| **10.04.02.99** | වෙනත් | **28,000,000** | **18,000,000** | **23,991,057** | **133%** |
| **10.04.03.00** | රඳවා ගැනීමේ බද්ද | **12,000,000** | **25,000,000** | **19,838,833** | **79%** |
| 10.04.03.01 | පොළිය මත | 3,000,000 | 10,000,000 | 320,627 | 3% |
| 10.04.03.99 | ගාස්තු සහ වෙනත් මත | 9,000,000 | 15,000,000 | 19,518,207 | 130% |
| **10.04.04.00** | ආර්ථික සේවා ගාස්තු | | | **201,753** | |
| 10.04.04.01 | දේශීය | | | 174,029 | |
| 10.04.04.02 | ආනයන | | | 27,724 | |
| **10.04.05.00** | ප්‍රාග්ධන ලාභ බද්ද | **800,000** | **1,100,000** | **5,315,389** | **483%** |
| **10.04.06.00** | ස්වේච්ඡාවෙන් හෙළිදරවු කිරීම මත බද්ද | **1,000,000** | **3,900,000** | **3,969,890** | **102%** |
| | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | | | | |
| **10.02.01.00** | එකතු කළ අගය මත බද්ද | **424,000,000** | **533,000,000** | **463,071,660** | **87%** |
| 10.02.01.01 | මූල්‍ය සේවා | 86,000,000 | 75,000,000 | 63,468,270 | 85% |
| 10.02.01.02 | වෙනත් සේවා | 106,000,000 | 161,000,000 | 116,010,177 | 72% |
| 10.02.01.03 | නිෂ්පාදන | 72,000,000 | 81,000,000 | 112,140,774 | 138% |
| 10.02.01.04 | ආනයන | 160,000,000 | 216,000,000 | 171,452,439 | 79% |
| **10.02.02.00** | භාණ්ඩ හා සේවා බද්ද | | | | |
| 10.02.02.01 | සේවා | | | | |
| 10.02.02.02 | නිෂ්පාදන | | | | |
| 10.02.02.03 | ආනයන | | | | |
| **10.02.03.00** | ජාතික ආරක්ෂක බද්ද | | | **11,310** | |
| 10.02.03.01 | සේවා | | | 11,310 | |
| 10.02.03.02 | නිෂ්පාදන | | | | |
| 10.02.03.03 | ආනයන | | | | |
| **10.02.07.00** | මුද්දර බද්ද | | | | |
| **10.02.08.00** | හර බද්ද | | | | |
| **10.02.09.00** | පිරිවැටුම් බද්ද | | | **7,473** | |
| **10.02.12.00** | ජාතිය ගොඩනැගීමේ බද්ද | | | **413,428** | |
| 10.02.12.01 | සේවා | | | 332,880 | |
| 10.02.12.02 | නිෂ්පාදන | | | 19,404 | |
| 10.02.12.03 | ආනයන | | | 61,144 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| **10.02.16.00** | **සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද** | **140,000,000** | **35,000,000** | **36,111,031** | **103%** |
| 10.02.16.01 | සේවා | | | 13,191,134 | |
| 10.02.16.02 | නිෂ්පාදන | | | 10,167,032 | |
| 10.02.16.03 | ආනයන | | | 12,752,865 | |
| | **බලපත්‍ර බදු සහ වෙනත්** | **7,807,000** | **5,011,500** | **11,553,146** | **231%** |
| 10.03.03.00 | ඔට්ටු හා සූදු බද්ද | 2,500,000 | 2,000,000 | 5,244,762 | **262%** |
| 10.03.04.00 | කොටස් ගනුදෙනු බද්ද | 5,300,000 | 3,000,000 | 4,215,857 | **141%** |
| 10.03.05.00 | ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | | | | |
| **10.03.07.00** | **වෙනත් බලපත්‍ර** | | | | |
| 10.03.07.11 | ණය ආපසු ගෙවීමේ බද්ද | | | 81,799 | |
| 10.03.09.00 | විදේශිකයන් සඳහා කල්බදු ලබා දී ඇති ඉඩම් මත බද්ද | | | | |
| 10.03.10.00 | විගමන බද්ද | 6,000 | 11,000 | 10,728 | **98%** |
| 10.03.11.00 | ප්‍රේෂණ ගාස්තුව | 1,000 | 500 | | **0%** |
| 20.03.02.23 | කැසිනෝ බලපත්‍ර ගාස්තුව | | | 2,000,000 | |
| | **මුළු ආදායම** | **1,067,807,000** | **1,131,011,500** | **1,045,188,877** | **92%** |

* පලාත් සභා වෙත සම්පූර්ණයෙන් පැවරූ මුද්දර බදු සහ ජාතිය ගොඩනැගීමේ බද්ද යටතේ එකතු කර පලාත් සභාව වෙත පැවරූ 1/3 ක කොටස හැර

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## 3.6 වෙන්කිරීම් ප්‍රයෝජනයට ගැනීමේ කාර්ය සාධනය

රු. '000

| වෙන්කිරීම් වර්ගය | වෙන්කිරීම් | | සත්‍ය වියදම | වෙන්කිරීම් ප්‍රයෝජනයට ගැනීම අවසාන වෙන් කිරීමේ % ක් ලෙස |
|---|---|---|---|---|
| | මූලික | අවසාන | | |
| පුනරාවර්තන | 4,642,405 | 4,512,405 | 4,081,570 | 90% |
| ප්‍රාග්ධන | 1,521,570 | 5,134,694 | 4,631,525 | 90% |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව අනෙකුත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවේ වැය සඳහා වන වෙන්කිරීම් ප්‍රදාන

රු. '000

| අනුක්‍රමික අංකය | වෙන්කිරීම් ලැබුනේ කුමන අමාත්‍යාංශයෙන්ද / දෙපාර්තමේන්තුවෙන්ද යන වග | වෙන්කිරීම් වල අරමුණු | වෙන්කිරීම් | | සත්‍ය වියදම | වෙන්කිරීම් ප්‍රයෝජනයට ගැනීම අවසාන වෙන් කිරීමේ % ක් ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මූලික | අවසාන | | |
| අදාළ නොවේ | | | | | | |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## 3.8 මූල්‍ය - නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. '000

| වත්කම් කේතය | කේත විස්තරය | සමීක්ෂණ මණ්ඩල වාර්තාව පරිදි 31.12.2022 වන දිනට ශේෂය | මූල්‍ය තත්ව වාර්තාව අනුව 31.12.2022 වන දිනට ශේෂය | ගිණුම්ගත කළ යුතු | වාර්තා කිරීමේ ප්‍රගතිය % ලෙස |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි සහ ව්‍යුහ | 2,672,475 | 2,672,475 | - | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ සහ උපාංග | 631,481 | 631,481 | - | |
| 9153 | ඉඩම් | 2,081,300 | 2,081,300 | - | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | 5,894,114 | 5,894,114 | - | |
| 9155 | ජෛව විද්‍යාත්මක වත්කම් | - | - | - | |
| 9160 | දැනට වැඩ කටයුතු කෙරීගෙන යන | - | - | - | |
| 9180 | කල්බදු වත්කම් | 73,520 | 73,520 | - | |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## 3.9 විගණකාධිපති වාර්තාව

ඇමුණුම



# 04

## පරිච්ඡේදය

# කාර්ය සාධන දර්ශක

## 4.1 දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන දර්ශක

කිසියම් සංවිධානයක ප්‍රධාන කාර්ය සාධන දර්ශක (Key Performance Indicators) යනු අත්කර ගැනීමට අපේක්ෂිත ප්‍රතිඵල වල ප්‍රගතිය දැක්වෙන ප්‍රමාණාත්මක දර්ශක වේ. එම සංවිධානයේ උපාය මාර්ගික හා මෙහෙයුම් අභිවෘද්ධිය උදෙසා ඉලක්ක ලබා දීම, තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා විශ්ලේෂණාත්මක පදනමක් සැපයීම සහ ඒ සඳහා වඩාත්ම වැදගත් වැඩපිළිවෙළ තීරණය කිරීම කාර්ය සාධන දර්ශක මඟින් අරමුණු කරයි. ඒ අනුව, ප්‍රධාන කාර්ය සාධන දර්ශක මඟින් සංවිධානයේ උපායමාර්ගික ඉලක්ක අත්කර ගැනීමේ ප්‍රගතිය මැන බැලීම සිදු කරයි.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිශ්චිතව දක්වා ඇති බදු වර්ග පරිපාලනය කරනු ලබන අතර එම කාර්යය සඳහා යොදා ගනු ලබන කාර්ය සාධන දර්ශක හතරකි. එනම්, ආදායම් රැස් කිරීම, දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, බදු ලිපි ගොනු විවෘත කිරීම සහ බදු රැස් කිරීමේ පිරිවැය වේ.

**(අ) ආදායම් රැස් කිරීම**

ආදායම් බද්ද, එකතු කල අගය මත බද්ද, සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද, ස්වෙච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද, ඔට්ටු හා සූදු බද්ද, කොටස් ගනුදෙනු බද්ද, විගමන බද්ද හා ප්‍රේෂණ ගාස්තු ආදියෙහි පරිපාලනය තුලින් වර්ෂය තුළ ආදායම් රැස් කරන ලදී. වර්ෂය සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ලැබුණු මූලික ආදායම් ඉලක්කය රුපියල් මිලියන 1,067,807 ක් වූ අතර එය රුපියල් මිලියන 1,131,011.5 ලෙස සංශෝධනය කරන ලදී. අපේක්ෂිත කාල රාමුව තුළ බදු ප්‍රතිපත්තිමය සංශෝධනයන් ක්‍රියාත්මක නොවුවද දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ඉහත ආදායම් ඉලක්කයෙන් 93.55 % ක ප්‍රතිශතයක් අත්කර ගෙන තිබේ.

**(ආ) දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**

බදු ගෙවීම සඳහා සම්බන්ධිත පාර්ශවයන් දැනුවත් කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පුළුල් ක්‍රියාමාර්ග ගෙන ඇත. ඒ අනුව බදු ප්‍රතිපත්තියෙහි වෙනස්වීම්, වාර්තා භාරදීම ආදිය සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් පවත්වා ඇත. බොහෝ පිරිසක් සම්බන්ධ කර ගැනීමේ අරමුණෙන් එවැනි වැඩසටහන් වලින් වැඩි ප්‍රමාණයක් මාර්ගගත ක්‍රමය ඔස්සේ පවත්වා ඇත. එම වැඩසටහන් මාර්ගගත ක්‍රමය ඔස්සේ පැවැත්වීම නිසා පිරිවැය ද අවම කර ගන්නට හැකිවී ඇත. එමෙන්ම, භෞතිකව දැනුවත් කිරීමේ වැඩසටහක් සඳහා සහභාගී විය නොහැකි බදු ගෙවන්නන් මෙම මාර්ගගත වැඩසටහන් සඳහා ඵලදායී ලෙස සම්බන්ධ කර ගැනීමටද හැකි වී ඇත.

**(ඇ) බදු ලිපිගොනු ආරම්භ කිරීම**

බදු ආදායම ඉහළ නැංවීම සඳහා, බදු පදනම පුළුල් කිරීම අත්‍යාවශ්‍ය ය. ඒ අනුව, එකතු කල අගය මත බදු සඳහා ලියාපදිංචි කිරීමේ අවම සීමාව වර්ෂයකට (Registration threshold) රුපියල් මිලියන 300 සිට රුපියල් මිලියන 80 දක්වා පහත දමන ලදී. ආදායම් බදු පදනම ඉහල නැංවීමේ අරමුණෙන් යුතුව වර්ෂය තුළදී පුද්ගලික ආදායම් බදු ලියාපදිංචිය සඳහා සලකා බලනු ලබන ආදායම් සීමාව (Registration threshold) පහළ දැමීමට රජය යෝජනා කරන ලදී. ඒ අනුව, එම සීමාව වර්ෂයකට රුපියල් මිලියන 3 සිට රුපියල් මිලියන

1.2 දක්වා සංශෝධනය කිරීමට රජය අදහස් කල ද, එම යෝජනාව ක්‍රියාත්මක වූයේ 2023 ජනවාරි 01 දින සිට ය. කෙසේ වෙතත්, වසර තුළදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අලුතින් බදු ගෙවන්නන් 3,818 ක් ආදායම් බදු සඳහා ලියාපදිංචි කර ඇත.

**(ඇ) බදු රැස් කිරීමේ පිරිවැය**

බදු රැස් කිරීමේ පිරිවැය අවම කිරීම, අයවැය ප්‍රතිපත්තියෙහි වැදගත් පරමාර්ථයක් විය යුතු ය. බදු රැස් කිරීමේ පිරිවැය, ප්‍රාග්ධන පිරිවැය සහ පුනරාවර්ථන පිරිවැය යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වේ. අත්‍යාවශ්‍ය ප්‍රාග්ධන පිරිවැය පමණක් දරන මෙන් රජය මඟින් කල දැනුම් දීම මත දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි ප්‍රාග්ධන පිරිවැය සීමා කල යුතු විය.

කෙසේ වෙතත්, RAMIS 2.0 පද්ධතිය සඳහා රු. බිලියන 4.5 ක් ගෙවීම හේතුවෙන් එම RAMIS ව්‍යාපෘතිය සඳහා වර්ෂය තුළ දැරූ පිරිවැය රුපියල් බිලියන 4.5 ක් විය. 2022 වර්ෂය තුළ රුපියල් 100 ක් සඳහා ආසන්න වශයෙන් ශත 82 ක් ලෙස රැස් කිරීමේ පිරිවැය අවම මට්ටමක පවත්වා ගැනීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට හැකි වී ඇත. (මේ සඳහා තීරණය කර ඇති පදනම් අනුපාතය වන්නේ රු. 100 ක් රැස් කිරීම සඳහා රු. 1 ට අඩු වූ පිරිවැයකි.)

නිපැයුම්, හඳුනාගත් ප්‍රධාන දර්ශක වල ප්‍රතිශතයක් ලෙස 4.1 වගුවෙහි දැක්වේ.

**4.1 වගුව : 2022 වර්ෂයේ කාර්ය සාධන දර්ශක**

| සුවිශේෂී දර්ශක | සත්‍ය ප්‍රතිදානය අපේක්ෂිත ප්‍රතිදානයේ % ක් ලෙස | | |
|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% |
| ආදායම් එකතු කිරීම | 93.55% | | |
| දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 100% | | |
| බදු ලිපිගොනු විවෘත කිරීම | 153% | | |
| ආදායම් රැස් කිරීමේ පිරිවැය | 100% | | |

මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව



# 05

## පරිච්ඡේදය

# තිරසාර සංවර්ධන ඉලක්ක

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේ කාර්ය සාධනය

සමතුලිත සමාජ, ආර්ථික සහ පාරිසරික තිරසරභාවයක් හරහා දරිද්‍රතාවය පිටු දැකීම, පෘථිවිය ආරක්ෂා කිරීම හා 2030 වන විට සියළුම ජනතාවට සාමය හා සෞභාග්‍යය භුක්ති විඳීම තහවුරු කිරීම යන්න අරමුණු කරමින් වර්ෂ 2015 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වා දුන් පරිදි සියළුම සාමාජික රටවල් විසින් තිරසාර සංවර්ධන අරමුණු නොහොත් ගෝලීය අරමුණු වර්ෂ 2015 දී පිළිගන්නා ලදී. සමාජයේ සියළු දෙනාගේම නිර්මාණශීලීත්වය, දැනුම, තාක්ෂණය සහ මූල්‍ය සම්පත් යනාදිය සෑම සන්දර්භයකම තිරසාර සංවර්ධන ඉලක්ක වෙත ළඟාවීම සඳහා අවශ්‍ය වේ.

2017 අංක 19 දරන තිරසාර සංවර්ධන ඉලක්ක පනත ප්‍රකාරව සියළුම රජයේ පරිපාලන අස්ථිතීන් විසින් තිරසාර සංවර්ධන ඉලක්ක නඩත්තු කිරීම සිදු කළ යුතුය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම සැකසීමේදී මෙකී තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා අවධානය යොමු කර තිබේ.

වර්ෂය සඳහා ඉලක්කගත තිරසාර සංවර්ධන අරමුණු 5.1 වන වගුවේ දක්වා ඇත.

**5.1 වගුව : තිරසාර සංවර්ධන ඉලක්ක පදනම් කර ගත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම්**

| ඉලක්ක/ අභිමතාර්ථ | ඉලක්ක | අරමුණු වෙත ළඟා වීමේ දර්ශක | ළඟා කර ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100% |
| නිරෝගිමත් ජීවිතයක් සහතික කර, සෑම වයසකම සිටින සෑම අයකුගේම යහජීවනය ප්‍රවර්ධනය කිරීම. | වර්ෂය අවසාන වන විට සියළුම නිලධාරීන්ට කොවිඩ් - 19 එන්නත්කරණ මාත්‍රා තුනම ලබා දීම. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් එන්නත්කරණයට ලක් කළ ප්‍රතිශතය | | | |
| සංයුක්ත හා සමානාත්මතාවයෙන් යුතු ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කරමින් සැමට ජීවිත කාලය පුරා ඉගෙනුම් අවස්ථා උදා කර දීම | දෙපාර්තමේන්තු විභාග වාර තුනකින් පැවැත්වීම. | පැවැත්වූ විභාග ගණන<br>පැවැත්වූ විභාග වලින් සමත් වූ ප්‍රතිශතය | | | |
| | කුසලතා සංවර්ධනය කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම (කණ්ඩායම් තුනකින් නිලධාරීන් 90 ක්) | සහභාගීවූවන්ගේ ධනාත්මක ප්‍රතිචාර<br>පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | | | |
| | දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන් පශ්චාත් උපාධි හැදෑරීම සඳහා යොමු කරවීම. | දෙපාර්තමේන්තුවේ සියළු නිලධාරීන් අතුරින් පශ්චාත් උපාධිය ලබා ගෙන ඇති නිලධාරීන්ගේ ප්‍රතිශතය | | | |
| ස්ත්‍රී - පුරුෂ සමානාත්මතාව සාක්ෂාත් කරමින් සියලු කාන්තාවන් සහ ගැහැණු දරුවන් සවිබල ගැන්වීම | බඳවා ගැනීමේදී සහ උසස්වීම් ලබා දීමේදී, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය තහවුරු කිරීම. | නව බඳවා ගැනීම් වල කාන්තා ප්‍රතිශතය | | | |
| ධරණීය, සංයුක්ත හා තිරසර ආර්ථික වර්ධනය, සැමට පූර්ණ සහ ඵලදායී රැකියා හා නිසි කාර්ය ප්‍රවර්ධනය | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දේශීය ආදායම් සේවා පුරප්පාඩු සඳහා බඳවා ගැනීම. | බඳවා ගත් නිලධාරීන් සංඛ්‍යාව | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වෙනත් සේවා පුරප්පාඩු සඳහා බඳවා ගැනීම | | | | |
| ස්ථායී යටිතල පහසුකම් ගොඩනැගීම, සංයුක්ත සහ තිරසාර කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම හා නවෝත්පාදනයන් දිරි ගැන්වීම | අවශ්‍ය පරිදි ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම | අළුත්වැඩියා කර නඩත්තු කරන ගොඩනැගිලි සංඛ්‍යාව<br><br>අළුත්වැඩියා සහ නඩත්තු කිරීමේ පිරිවැය | | | |
| | නව ගොඩනැගිලි ඉදිකිරීම | ඉදිකල නව ගොඩනැගිලි සංඛ්‍යාව | | | |
| | 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත අනුව RAMIS පද්ධතිය යාවත්කාලීන කිරීම | RAMIS 2.0 | | | |
| රටවල් තුල හා රටවල් අතර අසමානතාවය අවම කිරීම | ද්විත්ව බදුකරණය වැලැක්වීම සඳහා ගිවිසුම් වලට එළඹීම. | ද්විත්ව බදුකරණය වැලැක්වීම සඳහා එළඹුණු ගිවිසුම් සංඛ්‍යාව | | | |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව



# 06
# පරිච්ඡේදය

## මානව සම්පත් පැතිකඩ

## 6.1 කාර්ය මණ්ඩල කළමනාකරණය

2022 දෙසැම්බර් 31 වන දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය, ඒවායේ තනතුරු දරන සංඛ්‍යාව සහ පුරප්පාඩු සංඛ්‍යාව ද සමග 6.1 වගුවේ දක්වා ඇත.

**6.1 වගුව : 2022.12.31 දිනට කාර්ය මණ්ඩලය**

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | තනතුරු දරන සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| **දේශීය ආදායම් සේවය** | **1,229** | **981** | **248** |
| කොමසාරිස් ජනරාල් | 1 | 1 | **0** |
| නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 9 | 6 | **3** |
| ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | 22 | 6 | **16** |
| කොමසාරිස් | 90 | 43 | **47** |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්/නියෝජ්‍ය කොමසාරිස්/සහකාර කොමසාරිස් | 1,107 | 925 | **182** |
| **වෙනත් සේවා** | **1,639** | **1,450** | **189** |
| **ඒකාබද්ධ සේවය** | **1,448** | **1,308** | **140** |
| ප්‍රධාන මූල්‍ය නිළධාරී | 1 | 1 | **0** |
| ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | **0** |
| අභ්‍යන්තර විගණක | 1 | 1 | **0** |
| අධ්‍යක්ෂ (පරිපාලන) | 1 | 1 | **0** |
| ගණකාධිකාරී | 5 | 5 | **0** |
| පරිපාලන නිලධාරී | 3 | 3 | **0** |
| භාෂා පරිවර්තක | 9 | 9 | **0** |
| සංවර්ධන නිලධාරී | 7 | 7 | **0** |
| පුස්තකාලයාධිපති | 1 | 1 | **0** |
| සහකාර පුස්තකාලයාධිපති | 1 | 1 | **0** |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 925 | 847 | **78** |
| රියදුරු | 96 | 84 | **12** |
| කාර්යාල සහායක සේවය | 397 | 347 | **50** |
| **තොරතුරු තාක්ෂණ සේවය** | **170** | **128** | **42** |
| අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | 2 | 2 | **0** |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | 16 | 4 | **12** |
| නිළධාරී (තොරතුරු තාක්ෂණ) | 47 | 19 | **28** |
| සහායක (තොරතුරු තාක්ෂණ) | 105 | 103 | **2** |
| **දෙපාර්තමේන්තු සේවය** | **20** | **14** | **6** |
| තාක්ෂණ නිලධාරී | 2 | 0 | **2** |
| ප්‍රවාහන නිලධාරී | 1 | 1 | **0** |
| ගොඩනැගිලි අධීක්ෂක | 1 | 0 | **1** |
| පර්යේෂණ සහකාර | 10 | 9 | **1** |
| පිළිගැනීමේ නිලධාරී | 4 | 3 | **1** |
| වඩු කාර්මික | 1 | 1 | **0** |
| සංචාරක බංගලා භාරකරු | 1 | 0 | **1** |
| **වෙනත්** | **1** | **0** | **1** |
| ඉංජිනේරු | 1 | 0 | **1** |
| **එකතුව** | **2,868** | **2,431** | **437** |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

**6.2 වගුව : 2022.12.31 දිනට කාර්ය මණ්ඩල සාරාංශය**

| | අනුමත සංඛ්‍යාව | සේවයේ නිරත සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 1,257 | 996 | 261 |
| තෘතීක | 60 | 32 | 28 |
| ද්විතීක | 1,055 | 971 | 84 |
| ප්‍රාථමික | 496 | 432 | 64 |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 6.2 වගුවේ මට්ටම් හතරකින් දක්වා ඇත. ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් ලෙස බදු පරිපාලන කාර්යයන්හි සෘජුව නියැලෙන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්තුමා ඇතුළුව, නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරුන් 09, ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරුන් 22, කොමසාරිස්වරුන් 90, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්වරුන්, නියෝජ්‍ය කොමසාරිස්වරු සහ සහකාර කොමසාරිස්වරු, ඉංජිනේරුවරයා සහ තොරතුරු තාක්ෂණ නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා ඇතුළත් වේ. ඉහළ මට්ටමේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වැඩ බලන තනතුරු වල රාජකාරියේ නියැලීම හේතුවෙන් පුරප්පාඩු 261 ක් පවතින අතර, රාජ්‍ය සේවා කොමිෂම විසින් තවමත් ස්ථිර කිරීමේ ලිපි ඔවුන් වෙත ප්‍රදානය කර නොමැත. එසේම රාජ්‍ය සේවයට අලුතින් බඳවා ගැනීම් නැවැත්වීමේ රජයේ ප්‍රතිපත්තිය නිසා දේශිය ආදායම් සේවයෙහි පුරප්පාඩු සංඛ්‍යාව වැඩි වී ඇත. 2022.12.31 දින වන විට ස.කො/නි.කො/ජ්‍යෙ.නි.කො තනතුරු 182 ක පුරප්පාඩු පැවති අතර නව බඳවා ගැනීම් සඳහා තරග විභාගයක් 2022 මාර්තු මාසයේ දී පවත්වා ඇත.

මීට අමතරව, තොරතුරු තාක්ෂණ නිලධාරීන්ගෙන් සමන්විත තෘතීය මට්ටමේ පුරප්පාඩු 28 ක් පැවතිනි. තාක්ෂණ නිලධාරීන් සහ තොරතුරු තාක්ෂණ සහකාර තනතුරු සඳහා 2022.12.31 දින වන විට ද්විතියික මට්ටමේ පුරප්පාඩු 84 ක් තිබුණි. මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා වන අවශ්‍යතාවය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දන්වා යවා ඇත.

**6.2 මානව සම්පත් සංවර්ධනය**

**6.3 වගුව : 2022 වර්ෂයේ දී පවත්වන ලද මානව සම්පත් සංවර්ධන වැඩසටහන්**

| අංකය | වැඩසටහනේ නම | පුහුණු කළ කාර්ය මණ්ඩල සංඛ්‍යාව | වැඩසටහනේ කාලසීමාව | | මුළු ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය | ප්‍රතිඵලය/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දේශීය | දේශීය | දේශීය | | |
| 1 | කලා පශ්චාත් උපාධිය (ජන සන්නිවේදන) - කැළණිය විශ්ව විද්‍යාලය | 27 | 22-ජන. | 22-දෙසැ. | 2,767,500 | | දේශිය | ප්‍රායෝගික හා න්‍යායික දැනුම ව්‍යාප්ත කිරීම තුළින් පර්යේෂණ කුසලතා වර්ධනය කිරීමටත්, සමකාලීන අභියෝගවලට මුහුණ දිය හැකි මාධ්‍ය සහ සන්නිවේදන වෘත්තිකයන් බිහි කිරීමටත්, ඵලදායී සන්නිවේදන උපාය මාර්ග සැපයීමටත් මෙම වැඩසටහන උපකාරී විය. |
| | | 8 | 22-මාර්තු | 23-පෙබ | 820,000 | | | |
| | | 2 | 22-අප්‍රේ. | 23-මාර්තු | 205,000 | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 2 | කලා පශ්චාත් උපාධිය (ආර්ථික විද්‍යාව) - කැළණිය විශ්ව විද්‍යාලය | 11 | 22-ජන. | 22-දෙසැ. | 1,347,500 | | දේශිය | මෙම වැඩසටහන ආර්ථික විද්‍යාවේ න්‍යායික සහ ප්‍රායෝගික පසුබිමකින් සමන්විත වේ. IRD නිලධාරීන්ට ආර්ථික කටයුතු පිළිබඳ දැනුමෙන් බහු ගෙවන්නන් සම්බන්ධීකරණය කිරීමට සිදුවන බැවින් නිලධාරීන්ගේ වැඩ කිරීමේ හැකියාව වැඩිදියුණු කිරීමට එය උපකාරී වේ. |
| | | 2 | මාර්.-22 | පෙබ.-23 | 245,000 | | | |
| 3 | කලා පශ්චාත් උපාධිය (ව්‍යවහාරික ආර්ථික විද්‍යාව) - පේරාදෙණිය විශ්ව විද්‍යාලය | 1 | ජන.-22 | දෙසැ.-22 | 98,000 | | දේශිය | මෙම වැඩසටහන මගින් නිලධාරීන්ට ආර්ථික ගැටළු, ඒවාට හේතු සහ විසඳුම් සෙවීම සඳහා න්‍යායික දැනුම සහ විශ්ලේෂණ කුසලතා යෙදීමේ හැකියාව ලබා දේ. |
| 4 | කලා පශ්චාත් උපාධිය (ආර්ථික විද්‍යාව) - රුහුණ විශ්ව විද්‍යාලය | 4 | අප්‍රේ.-22 | මාර්.-23 | 393,200 | | දේශිය | මෙම වැඩසටහන ආර්ථික විද්‍යාවේ න්‍යායික සහ ප්‍රායෝගික පසුබිමකින් සමන්විත වේ. IRD නිලධාරීන්ට ආර්ථික කටයුතු පිළිබඳ දැනුමෙන් බහු ගෙවන්නන් සම්බන්ධීකරණය කිරීමට සිදුවන බැවින් නිලධාරීන්ගේ වැඩ කිරීමේ හැකියාව වැඩිදියුණු කිරීමට එය උපකාරී වේ. |
| 5 | තොරතුරු තාක්ෂණ පශ්චාත් උපාධිය | 2 | ජුලි-22 | 24-ජුනි | 371,000 | | දේශිය | මෙමගින් තොරතුරු තාක්ෂණයේ වත්මන් සහ නැගී එන වර්ධනයන් පිළිබඳ දැනුම මෙන්ම තොරතුරු මත පදනම් වූ ආර්ථිකයක අභියෝග ජය ගැනීම සඳහා තොරතුරු තාක්ෂණය පිළිබඳ උසස් මාතෘකා පිළිබඳ ගැඹුරු දැනුම වැඩි දියුණු කරයි. |
| 6 | ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධිය | 1 | මාර්-22 | පෙබ-23 | 500,000 | | දේශිය | එය සැබෑ ලෝකයේ ව්‍යාපාරික කටයුතු සඳහා නිලධාරීන්ගේ දැනුම සහ කුසලතා මාරු කිරීමේ හැකියාව වැඩි දියුණු කරයි. එසේම එය IRD හි නිලධාරීන්ගේ කාර්ය සාධනය සහ වෘත්තීයභාවය වැඩි දියුණු කරයි. |
| 7 | වෘත්තිමය ඉංග්‍රීසි ඩිප්ලෝමාව | 1 | මාර්-22 | පෙබ-23 | 80,000 | | දේශිය | මෙමගින් මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ගේ වාචික සහ ලිඛිත නිපුණතාවය වැඩිදියුණු කිරීමට උපකාරී වූ අතර මූලික භාෂා කුසලතා සහ නිලධාරින්ට තම සේවය විශ්වාසයෙන් හා කාර්යක්ෂමව ඉටු කළ හැකිය. |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 8 | පරිගණක ජාලකරණය සහ දෘඩාංග පුහුණුව | 1 | ජන-22 | ජුනි - 22 | 34,050 | | දේශිය | දෙපාර්තමේන්තුවේ පරිගණක ආශ්‍රිත ගැටළු සහ ජාලකරණ ගැටළු හඳුනා ගැනීමට පරිගණක දෘඩාංග සහ ජාලකරණය පිළිබඳ දැනුම මෙමඟින් ලබා දේ. |
| 9 | කාර්යාල සහායකයින්ගේ සහ රියදුරන්ගේ වෘත්තීය සංවර්ධනය | 2 | එක් දින 17.10.2022 | | 10,000 | | දේශිය | මෙම වැඩසටහන කාර්යාල කාර්ය සහායකයින්ගේ සහ රියදුරන්ගේ රාජකාරියේ ගුණාත්මක භාවය ඉහළ නංවයි. අවසාන වශයෙන්, එය දෙපාර්තමේන්තුවේ ප්‍රශස්ත වැඩ පරිසරයක් නිර්මාණය කිරීමට උපකාරී වේ. |
| 10 | ගිණුම් පොත්පත් ක්‍රමානුකූලව නඩත්තු කිරීම | 2 | 27.10. 2022 | 28.10. 2022 | 15,000 | | දේශිය | එය ගිණුම් පොත් නඩත්තු කිරීමේ ගුණාත්මකභාවය වැඩි දියුණු කරයි. |
| 11 | දේ.ආ.දෙ. සඳහා අත්‍යාකරණ සේවාදායක යටිතල පහසුකම් සැපයීම සහ ස්ථාපනය කිරීම - සිංගප්පූරුව | 6 | 17.01. 2022 | 21.01. 2022 | | 351,271 | විදේශ | අත්‍යා ජාල සංරචක දැනට පවතින තාක්ෂණයට අනුකූලව ක්‍රියාත්මක කර ඇති අතර ලබාගත් දැනුම භාවිතයෙන් එය තවදුරටත් වැඩිදියුණු කළ හැකිය. |
| 12 | ජ්‍යෙෂ්ඨ නිළධාරීන් සඳහා විධායක පුහුණුව - පාකිස්ථානය | 1 | 30.03. 2022 | 10.04. 2022 | | 157,960 | විදේශ | බදු එකතු කිරීමේ කාර්යයන්, නිලධාරීන්ගේ බදු පරිපාලන කුසලතා සම්බන්ධයෙන් ජාත්‍යන්තර භාවිතයන් වැඩි දියුණු කිරීම |
| 13 | දේ.ආ.දෙ. සඳහා පරිමිතික සහ අභ්‍යන්තර ෆයර් වොල් සැපයීම සහ ස්ථාපනය නිරීම - ඉන්දියාව | 3 | 22.03. 2022 | 27.03. 2022 | | 140,904 | විදේශ | ගෝලීය වශයෙන් පිළිගත් ප්‍රමිතීන්ට අනුව ජාල ආරක්ෂණ පියවරයන් පවත්වාගෙන යාම සහ පාලනය කිරීම |
| 14 | ආසියා පැසිෆික් කලාපය සඳහා ජාත්‍යන්තර බදුකරණය පිළිබඳව කලාපීය උපදේශනය - පිලිපීනය | 2 | 05.12. 2022 | 06.12. 2022 | | 123,201 | විදේශ | කුළුණු දෙකක විසඳුම ශ්‍රී ලංකාවට ඇති බලපෑම විශ්ලේෂණය කිරීම සහ එම ව්‍යාපෘතියේ මෑතකාලීන සංවර්ධනය දැන ගැනීම. |
| 15 | බදු පරිපාලන විනිශ්චය හා තක්සේරුව (TADAT) - ඉන්දියාව | 6 | 12.12. 2022 | 16.12. 2022 | | 646,788 | විදේශ | විශේෂයෙන්ම දේශීය ආදායම් පද්ධති යාවත්කාලීන කිරීමේදී මෙම පාඨමාලාවේදී ලබාගත් අත්දැකීම් සහ රැස් කරගත් දැනුම අනාගතයේදී අදාළ කර ගැනීමට ප්‍රයෝජනවත් වේ |

*මූලාශ්‍රය*: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව



# 07

## පරිච්ඡේදය

# අනුකූලතා වාර්තාව

## 7.1 අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ වන අවශ්‍යතාවය | අනුකූලතා තත්වය (අනුකූල වේ / නොවේ) | අනුකූලතාවය නොදැක්වීම පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් | අනාගතයේදී අනුකූල නොවීම වැළැක්වීම සඳහා යෝජිත නිරවද්‍ය කිරීමේ ක්‍රියාවන් |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර ඇත.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශය | අනුකූල වේ | | |
| 1.2 | රජයේ නිලධාරින්ගේ ගිණුම සඳහා වන අත්තිකාරම් | අනුකූල වේ | | |
| 1.3 | වෙළඳ සහ නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.6 | වෙනත් | අනුකූල වේ | | |
| **2** | **පොත් සහ රෙජිස්ටර් නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන 267/2018 ප්‍රකාරව ස්ථාවර වත්කම් රෙජිස්ටරය නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම . | අනුකූල වේ | | |
| 2.2 | පෞද්ගලික පඩිනඩි රෙජිස්ටරය / පෞද්ගලික පඩිනඩි කාඩ්පත් නිසි පරිදි නඩත්තු කර යාවත්කාලීන කිරීම. | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් රෙජිස්ටරය නඩත්තු කර යාවත්කාලීන කිරීම. | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා රෙජිස්ටරය නඩත්තු කර යාවත්කාලීන කිරීම. | අනුකූල වේ | | |
| 2.5 | සියළු මාසික ගිණුම් සාරාංශ (CIGAS) සකස් කර නියමිත දිනට භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් සහ මුදල් ඇණවුම් රෙජිස්ටරය නිසි පරිදි නඩත්තු කර යාවත්කාලීන කිරීම. | අනුකූල වේ | | |
| 2.7 | බඩු ලේඛන පොත් රෙජිස්ටරය නඩත්තු කර යාවත්කාලීන කිරීම. | අනුකූල වේ | | |
| 2.8 | තොග රෙජිස්ටරය නඩත්තු කර යාවත්කාලීන කිරීම. | අනුකූල වේ | | |
| 2.9 | අලාභ රෙජිස්ටරය නඩත්තු කර යාවත්කාලීන කිරීම. | අනුකූල වේ | | |
| 2.10 | බැඳීම් රෙජිස්ටරය නඩත්තු කර යාවත්කාලීන කිරීම. | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් රෙජිස්ටරය (GA-N20) නඩත්තු කර යාවත්කාලීන කිරීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **3** | **මුදල් පාලනය සම්බන්ධ කාර්යයන් පවරා දීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | ආයතනය තුළ මූල්‍ය අධිකාර බලය පවරා දීම. | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය අධිකාර බලය පවරා දීම පිළිබඳව ආයතනය තුළ සන්නිවේදනය කිරීම. | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා යන පරිදි මූල්‍ය අධිකාර බලය පවරා දීම. | අනුකූල වේ | | |
| 3.4 | අංක 171/2004 දරණ 2014.05.11 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව, රජයේ පඩි සැකසීමේ මෘදුකාංග පැකේජය යොදා ගැනීමේදී ගණකාධිකාරිවරු විසින් මෙම අධිකාරි බලය පිළිපැදීම. | අනුකූල වේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සැකසීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලසුම සැකසීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම සැකසීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලසුම සැකසීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකසා NBD වෙත නියමිත දිනට ඉදිරිපත් කිරිම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහයන්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත නියමිත වෙලාවට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර ඇති සියළු විගණන විමසුම් සඳහා විශේෂිත කාල සීමාවක් තුළ පිළිතුරු සැපයීම. | අනුකූල වේ | | |
| **6** | **අභ්‍යන්තර විගණන** | | | |
| 6.1 | මුදල් රෙගුලාසි 134(2) DMA /1-2019 ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ උපදේශනයන් ලබා ගැනීමෙන් අනතුරුව වර්ෂය ආරම්භයේදී අභ්‍යන්තර විගණන සැලසුම සැකසීම. | අනුකූල වේ | | |
| 6.2 | සියළුම අභ්‍යන්තර විගණන වාර්තා සඳහා මසක් ඇතුළත පිළිතුරු ලබා දීම. | අනුකූලවේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ (4)40 උපවගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටුව** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 ප්‍රකාරව වර්ෂය තුළ විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් 04ක් වත් පැවැත්වීම. | අනුකූල වේ | | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන ඡේදය ප්‍රකාරව මිලදී ගන්නා ලද සහ අපහරණය කරන ලද වත්කම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත භාර දීම. | අනුකූල වේ | | |
| 8.2 | ඉහත කී චක්‍රලේඛයේ 13 වන ඡේදය ප්‍රකාරව චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා සුදුසු සම්බන්ධීකරණ නිලධාරියෙකු පත් කිරීම. | අනුකූල වේ | | |
| 8.3 | අංක 05/2016 දරණ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පවත්වා අදාළ වාර්තා විගණකාධිපතිවරයා වෙත නියමිත දිනට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 8.4 | චක්‍රලේඛයේ විශේෂයෙන් දක්වා ඇති පරිදි භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල හරහා අතිරික්ත හෝ අඩුපාඩු නිරාවරණය කර ගැනීම සහ කාලසීමාව තුළ ඒ හා සම්බන්ධ අනෙකුත් නිර්දේශ, ක්‍රියාකාරකම් | අනුකූල වේ | | |
| 8.5 | මු.රෙ.772 ප්‍රකාරව, පාවිච්චියට නුසුදුසු භාණ්ඩ ව්‍යපහරණය කිරීම. | අනුකූල වේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | දෛනික ධාවන සටහන සහ සංචිත වාහන පිළිබඳ සාරාංශ සකස් කර විගණකාධිපතිවරයා වෙත නියමිත දිනට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 9.2 | පාවිච්චියට නුසුදුසු බව නිර්දේශ කිරීමෙන් පසු මාස හයකට අඩු කාල සීමාවක් තුළ පාවිච්චියට නුසුදුසු වාහන ව්‍යපහරණය කිරීම. | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් නඩත්තු කිරීම සහ යාවත් කාලීන කිරීම. | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104, 109 සහ 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ | | |
| 9.5 | අංක 30/2016 දරණ 2016.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ විධිවිධානයන් ප්‍රකාරව වාහන වල තෙල් පරිභෝජනය නැවත පරීක්ෂා කිරීම. | අනුකූල වේ | | |
| 9.6 | කල් බදු කාල සීමාවෙන් පසු කල් බදු වාහන ලොග් පොත් වල අත්‍යන්ත හිමිකාරීත්වය පැවරීම. | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳීම් ප්‍රකාශ සකස් කර , සහතික කර විගණනය සඳහා සූදානම් කරවීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 10.2 | සලකන ලද වර්ෂය යටතේ හෝ පෙර වර්ෂ වල පැවති නිෂ්ක්‍රීය ගිණුම් නිරවුල් කිරීම. | අදාළ නොවේ | | |
| 10.3 | ගැලපුම් සිදු කළ යුතු සහ මාසයක් තුළ එකී ශේෂ නිරවුල් කළ යුතු, බැංකු සැසඳීම් ප්‍රකාශයන් හරහා නිරාවරණය කරගත් ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීම. | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගැනීම.** | | | |
| 11.1 | වෙන්කර ඇති ප්‍රතිපාදන සීමාව නොඉක්මවා වියදම් කිරීම. | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව වර්ෂය අවසානයේ ඉතුරු ප්‍රතිපාදන නොඉක්මවන බැරකම් | අනුකූල වේ | | |
| **12** | **රාජ්‍ය නිලධාරීන්ගේ ගිණුමට අත්තිකාරම්** | | | |
| 12.1 | සීමාවට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟ ණය සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක් සිදු කිරීම. | අනුකූල වේ | | |
| 12.3 | එක් වසරකට වැඩි හිඟ ණය ශේෂ නිරවුල් කිරීම. | අනුකූල වේ | | |
| **13** | **පොදු තැන්පතු ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු ව්‍යාපහරණය සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතුව සහ පාලන රෙජිස්ටරය යාවත්කාලීන කර නඩත්තු කර ඇත. | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයෙහි මුදල් පොතේ ශේෂය TOD වෙත ප්‍රේෂණය කිරීම | අනුකූල වේ | | |
| 14.2 | කාර්යය සම්පූර්ණ කිරීමේ සිට මාසයක් ඇතුළත මු.රෙ. 371 ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවීමේදී තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාර පොත් සමග මාසිකව සැසඳීම | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | රෙගුලාසි ප්‍රකාරව ආදායම් මඟින් ආපසු ගෙවීම | අනුකූල වේ | | |
| 15.2 | එකතු කල ආදායම තැන්පතු ගිණුමට බැර නොකරමින්, ඍජුවම ආදායම් ගිණුමට බැර කිරීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ.176 ප්‍රකාරව ආපසු ලැබෙන හිඟ ආදායම් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩලය ඇතුළත කාර්ය මණ්ඩලයට පඩි ගෙවීම | අනුකූල වේ | | |
| 16.2 | සෑම කාර්ය මණ්ඩල සාමාජිකයෙකුටම ලිඛිත රාජකාරි ලැයිස්තුවක් ලබා දීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 16.3 | සෑම වාර්තාවක්ම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත, ඔවුන්ගේ අංක 04/2017 දරණ 2017.09.20 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව භාර දීම. | අනුකූල වේ | | |
| **17** | **මහජනතාව වෙත තොරතුරු ලබා දීම.** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කිරීම සහ නිසි තොරතුරු රෙජිස්ටරයක් නඩත්තු කිරීම හා යාවත්කාලීන කිරීම. | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු වෙබ් අඩවි හෝ විකල්ප ක්‍රියා මාර්ග මඟින් මහජනතාව වෙත ලබා දීම සහ මෙම වෙබ් අඩවි හෝ විකල්ප ක්‍රියා මාර්ග මඟින් රාජ්‍ය අධිකාරියට එදිරිව මහජනයාට පැමිණිලි ඉදිරිපත් කිරීමට / ගුණාත්මකභාවය ඇගයීමට ඉඩ ප්‍රස්ථා ලබා දීම. | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන සහ 10 වන වගන්තිය ප්‍රකාරව අර්ධ වාර්ෂික හෝ වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 05/2008 සහ 05/2018(1) ප්‍රකාරව ආයතනය විසින් පුරවැසි ප්‍රඥප්තියක් / පුරවැසි සේවාලාභියාගේ ප්‍රඥප්තියක් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම. | අනුකූල වේ | | |
| 18.2 | චක්‍රලේඛයේ 2.3 ඡේදය ප්‍රකාරව පුරවැසි ප්‍රඥප්තිය / පුරවැසි සේවාලාභියාගේ ප්‍රඥප්තියක් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමෝපායක් සකස් කිරීම. | අනුකූල වේ | | |
| **19** | **මානව සම්පත් සැලසුම සැකසීම.** | | | |
| 19.1 | 2018.01.24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 02 වන ඇමුණුමේ ආකෘතිය ප්‍රකාරව මානව සම්පත් සැලසුමක් සකස් කිරීම. | අනුකූල වේ | | |
| 19.2 | ඉහත කී මානව සම්පත් සැලසුම මඟින් කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුම අවම ලෙස වසරට පැය 12 ට නොඅඩු පුහුණු අවස්ථාවන් සඳහා යොමු කිරීම. | අනුකූල වේ | | |
| 19.3 | ඉහත කී චක්‍රලේඛයේ ඇමුණුම 01 හි ආකෘතිය පදනම් කර ගනිමින් සමස්ථ කාර්ය මණ්ඩලයට වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් සඳහා අත්සන් කිරීම. | අනුකූල වේ | | |
| 19.4 | ඉහත කී චක්‍රලේඛයේ ඡේද අංක 6.5 ප්‍රකාරව ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කිරීම සහ මානව සම්පත් සංවර්ධන සැලසුම, ධාරිතා ඉහළ නැංවීමේ වැඩ සටහන් සංවිධාන කිරීම හා නිපුණතා සංවර්ධන වැඩසටහන් පවත්වාගෙන යාමේ වගකීම පැවරීම. | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේද සඳහා ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | පෙර වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේදයන්හි පෙන්වා දී ඇති අඩුලුහුඩුකම් නිවැරදි කිරීම. | අනුකූල වේ | | |

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. } පීඑෆ්ආර්/ඩී/අයිආර්ඩී/එෆ්එස්/22/02 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි 31 දින

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්,
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 246 - දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය සහිත මතය

ශීර්ෂය 246 - දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව පසුව නිකුත් කරන ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.




අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්

ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.1.1(අ) | භාණ්ඩාගාර තොරතුරු හා දෙපාර්තමේන්තු පොත් අතර පවතින වෙනස්කම් නිවැරදිව හඳුනාගෙන ගැලපිය යුතුය. | 1.6.1(අ)(i) |
| 1.6.1.1(අ) | මූල්‍ය ප්‍රකාශන හා පාලන ගිණුම් අතර පවතින වෙනස්කම් නිවැරදිව හඳුනාගෙන ගැලපිය යුතුය. | 1.6.1(අ)(ii) |
| 1.6.1.1(අ) | භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු පොත්, මූල්‍ය ප්‍රකාශන සමඟ නිවැරදිව පැසදීම් කළ යුතුය. | 1.6.1(අ)(iii) |
| 1.6.1.3 | අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිවැරදිව හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් කර නිරවුල් කළ යුතුය. | 1.6.1(අ)(iv) |
| 1.6.2.1(අ) | චක්‍රලේඛ ප්‍රකාරව දෙපාර්තමේන්තු සතු සියළු වත්කම් තක්සේරු කර ගිණුම් ගත කළ යුතුය. | 1.6.2(අ) |
| 1.6.2.1(ආ) | චක්‍රලේඛ ප්‍රකාරව දෙපාර්තමේන්තුව සතු සියළු වත්කම් තක්සේරු කර ගිණුම් ගත කළ යුතුය. | 1.6.2(ආ) |
| 2.1.1 (ඇ) | වෙනසට හේතු හඳුනා නිවැරදි කළ යුතුය. | 2.2.11 |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ආදායම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) නොසැසඳීම්**

ආදායම් සංකේතයක් මෙන්ම පාලන ගිණුමක් ලෙස ද ක්‍රියා කරන සාමූහික නොවන ආදායම් බදු යටතේ අංක 10.04.02.99 ආදායම් සංකේතය යටතේ භාණ්ඩාගාරයේ පොත් අනුව, දෙපාර්තමේන්තු ආදායම් වර්ගීකරණයේදී හා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ACA 1 අනුව ශේෂයන් පරීක්ෂාවේදී පහත වෙනස්කම් නිරීක්ෂණය විය.

i. භාණ්ඩාගාරයේ තොරතුරු අනුව, යථෝක්ත පාලන ගිණුමට සමාලෝචිත වර්ෂය තුල දී රු. 24,034,679,728 ක් බැර වී තිබුණද, දෙපාර්තමේන්තුව විසින් ආදායම් වර්ගීකරණයේදී පාලන ගිණුම අනුව ආදායම රු.23,959,784,613 ක් ලෙස හඳුනා ගැනීම හේතුවෙන් රු.74,895,115 ක නොපැසඳීමක් නිරීක්ෂණය විය.

ii. දෙපාර්තමේන්තුව විසින් ආදායම් වර්ගීකරණයේ දී පාලන ගිණුමට අනුව ආදායම රු.23,959,784,613 ක් වුව ද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ACA 1 අනුව අංක 10.04.02.99 දරන අනෙකුත් ආදායම් පාලන ගිණුමේ ශේෂය රු. 23,991,056,550 ක් වීම හේතුවෙන් රු. 31,271,937 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

iii. භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම අනුව 10.04.02.99 දරන අනෙකුත් ආදායම් සංකේතය යටතේ ශේෂය රු. 24,034,679,727 ක් වන අතර, ආදායම් ආපසු ගෙවීම් ගැලපූ පසු ශේෂය රු. 24, 033,971,591 කි. නමුත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ACA 1 අනුව, 10.04.02.99 දරන අනෙකුත් ආදායම් පාලන ගිණුමේ ශේෂය රු. 23,991,056,550 ක් වීම නිසා රු. 42,915,041 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

iv. 2022 දෙසැම්බර් 31 දිනට RAMIS පරිගණක පද්ධතිය තුළ රු. බිලියන 5.6 ක නිරවුල් නොවූ අවිනිශ්චිත ශේෂයක් පැවතීම හේතුවෙන් හිඟ බදු ශේෂය එම ප්‍රමාණයෙන් අධි ගණනය වී ඇති බවත්, එම නිරවුල් නොවූ ශේෂයන් 2015 සිට එනම්, ආසන්න වසර 07 කට වැඩි කාලයක් පුරා නිරවුල් නොවී පැවතුණ බවත් නිරීක්ෂණය විය.

v. ආදායම් රැස්කිරීමේ බැංකු ගිණුම් මගින් භාණ්ඩාගාරයට බැර වන මුදල්, බැංකු ගිණුම් ප්‍රකාශ සමඟ සසඳා හඳුනා ගෙන ඇති වෙනස්කම් නිවැරදි කිරීමට කාලීනව පියවර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය වූයෙන් ආදායම් ගිණුම්කරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනයේ දුර්වලතා පවතින බව නිරීක්ෂණය විය.

**(ආ) මාසික ආදායම් වාර්තා කිරීම්වල නිවැරදිතාවය**

2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015 හි 4 වගන්තිය - වාර්තා නිසි පරිදි පවත්වා ගැනීම මගින් ආදායම් පරිපාලනය හා ගිණුම්කරණය වැඩිදියුණු කිරීම සඳහාත් අධීක්ෂණ කටයුතු සහ ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහාත් ක්‍රමවත් ලෙස වාර්තා පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වන අතර 4 (ඇ)ඡේදය අනුව ආදායම නිවැරදිව වර්ගීකරණය කිරීම හා ඒ ඒ ආදායම් විෂයන් යටතට එළඹෙන මාසයේ පළමු සතිය තුළ හඳුනා ගැනීම කළ යුතු බවට මඟ පෙන්වීම් කර තිබුණි. බැංකුව විසින් රැස් කර මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරනු ලබන එකතු කළ අගය මත බදු හා භාණ්ඩ හා සේවා බදු මුදල් හැර අනෙකුත් සියලුම ආදායම් මහා භාණ්ඩාගාරයේ පවත්වා ගෙන යන වෙනත් බදු ආදායම් පාලන ගිණුමේ වාර්තා කර ඒවා අදාළ ආදායම් සංකේත අනුව වර්ගීකරණය කර මාසික ගිණුම් මගින් නිවැරදි ආදායම් සංකේතයට මාරු කිරීමේ දී, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ ජනවාරි, පෙබරවාරි, මාර්තු සහ නොවැම්බර් යන මාසවලට අදාළව නිවැරදිව සිදු කර නොතිබුණි.

**(ඇ) ආදායම් වර්ගීකරණ දෝෂ**

එකතු කළ අගය මත බදු ආදායම භාණ්ඩාගාරයේ පවත්වා ගෙන යන පාලන ගිණුමට බැර කර, එසේ බැර වන මුදල් මාසික සාරාංශ මගින් මූල්‍ය සේවා, අනෙකුත් සේවා හා නිෂ්පාදන යන එකතු කළ අගය මත බදු ආදායම් සංකේත තුන වෙත ගිණුම්ගත කරනු ලැබේ. සමාලෝචිත වර්ෂයේ අවසානයට පාලන ගිණුමේ ඉතිරි වී පැවැති රු.7,946,219 ක් ආදායම් සංකේත අනුව හඳුනා ගැනීමෙන් තොරව 10.04.02.99 අනෙකුත් සේවා ආදායම් සංකේතයට මාරු පත්‍ර මගින් මාරු කිරීම හේතුවෙන් එකතු කළ අගය මත බදු මූල්‍ය සේවා, අනෙකුත් සේවා හා නිෂ්පාදන යන ආදායම් සංකේත තුනෙහිම ශුද්ධ ආදායමේ නිරවද්‍යතාව විගණනයේදී තහවුරු නොවිය.

**1.6.2 මූල්‍ය නොවන වත්කම්**

(අ) කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම් මාර්ගෝපදේශය අනුව රජයට අයත් සියලුම ඉඩම් සහ පෞරාණික උරුමයන් ලෙස හඳුනාගත් ගොඩනැගිලි හැර අනෙකුත් සියලු ගොඩනැගිලි තක්සේරු කිරීම අත්‍යවශ්‍ය බව දක්වා ඇතත්, දේශිය ආදායම් දෙපාර්තමේන්තුව සතු කුරුණෑගල හා නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාල පිහිටි ඉඩම් මේ දක්වා තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

**(ආ)** 2018 දෙසැම්බර් 31 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2018 අනුව ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම් මාර්ගෝපදේශය අනුව කෙරී ගෙන යන ඉදි කිරීමක මෙතෙක් දරා ඇති සම්පූරණ වියදම කෙරී ගෙන යන වැඩ වශයෙන් ගිණුම්ගත කල යුතු වුවත්, දේශීය ආදායම් දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ පිහිටි රු.176,000,000 ක මූලික ඇස්තමේන්තුවක් යටතේ ඉදි කෙරෙමින් පැවති මේ වන විට 80% ක් සම්පූර්ණ කරන ලද හා අමතර වැඩ සඳහා මූලික ඇස්තමේන්තුවෙන් බැහැරව රු.83,468,649 ක් ද ගෙවා ඇති දැනට ඉදිකිරීම් නවතා ඇති වාහන අංගනය වෙනුවෙන් මෙතෙක් දරා ඇති මුදල්, ඉඩම් හා ගොඩනැගිලි ලෙස ගිණුම්ගත වී තිබුණි.

(ඇ) 2022 අප්‍රේල් 05 දින පොලිස් දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති රු.6,315,000 ක් වටිනා මෝටර් වාහන සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයට ගැලපුම් කිරීම හේතුවෙන් ආරම්භක ශේෂය එම වටිනාකමින් ඌන ගණනය වී තිබුණි.

### 1.6.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) RAMIS පද්ධතියෙහි ක්‍රියාත්මක වන Appeal හා Objection යන උප මොඩියුල සඳහා ප්‍රවේශ වීමට විගණන කාර්යය මණ්ඩලයට ප්‍රවේශ අවසර ලබා දී නොතිබීම හේතුවෙන් RAMIS පද්ධතියෙහි Report මොඩියුලය මගින් ජනනය වන Appeal Registration, Time Bar Report, Settled Appeal Report, Objection Registration, Settled Objection Report හා Unsettled Objection Report යන වාර්තාවලට අදාළ යාවත්කාලීන කරන ලද තොරතුරු පද්ධතිය තුළින් ලබා ගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණු අතර අදාල තොරතුරු විගණනයට ලබා දී නොතිබුණි. මේ හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට මත භේදයට තුඩු දුන් බදු අභියාචනා හා විමසීම් පිළිබඳව විගණනයට පරීක්ෂා කළ නොහැකි විය.

(ආ) 2020 පෙබරවාරි 03 දිනැති කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා කමිටුව (Cabinet Appointed Negotiated Committee -CANC) විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් RAMIS අදියර 2.0 ට අදාළ මූලික හඳුනා ගැනීමෙන් බැහැරව නව අවශ්‍යතා යටතේ ඉටු කිරීමට නියමිත අතිරේක අවශ්‍යතා ඇතුළත් ලියවිල්ලෙහි පිටපතක් හා එකී හඳුනාගත් අවශ්‍යතාවල ප්‍රගතිය විගණනයට වාර්තා නොවීම හේතුවෙන් එම අදියරෙහි මූලික හඳුනා ගැනීම්වලට අදාළව බැහැරව කරන ලද ගෙවීම්වල නිවැරදිතාවය විගණනයට පරීක්ෂා කළ නොහැකි විය.

(ඇ) දෙපාර්තමේන්තුව සතු මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම්ගත වටිනාකම රු. 320,307,150 ක් වූ වාහන සම්බන්ධයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා, විගණනයට වාර්තා ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් එකී වත්කම් විගණනයේ දී සනාථ කරගත නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

දෙපාර්තමේන්තුව 2022 වර්ෂයේ අග්‍රිම සැලැස්ම අනුව වර්ෂය තුළ රු.10,927,298,979 ක් වූ වාර්ෂික අග්‍රිමය රු.910,608,248 ක් බැගින් සමාන වාරික 12කින් ලබා ගැනීමට සැලසුම් කර තිබුණ ද, දෙපාර්තමේන්තුව අග්‍රිමය ඉල්ලුම් කිරීමේ දී මාසිකව සියයට 15 සිට සියයට 473 දක්වා පරාසයක් සහිතව රු.9,105,142,020 ක් වර්ෂය තුළ වැඩිපුර අග්‍රිම ඉල්ලුම් කර තිබුණු අතර, දෙපාර්තමේන්තුව වෙත ලැබුණු මුළු අග්‍රිමය රු.9,397,702,623 ක් විය. එය ඉල්ලුම් කළ අග්‍රිමයෙන් සියයට 53 ක එනම්, රු.10,634,738,376 ක විචලනයක් වූ අතර, මාසිකව ඉල්ලුම් කළ අග්‍රිමය හා ලැබුණු අග්‍රිමය අතර විචලනය සියයට 19 සිට සියයට 93 දක්වා පරාසයක පැතිර තිබුණි. ඒ අනුව ඉල්ලුම් කළ යුතු අග්‍රිමය හා ලැබුණු අග්‍රිමය අතර රු.1,529,596,356 ක (සියයට

14) වෙනසක් නිරීක්ෂණය වූයෙන් දෙපාර්තමේන්තුවේ දළුම කළමනාකරණය මනා පාලනයකින් යුතුව සිදුව ඇති බවක් නිරීක්ෂණය නොවිය.

## 2.2 ආදායම් කළමනාකරණය

මුදල් රෙගුලාසි සංග්‍රහයේ 128 (2) (ඇ) ඡේදය ප්‍රකාරව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් අර්ධ වාර්ෂික හිඟ බදු වාර්තා පිළිවෙළින් ජූලි 31 හා ඊළඟ මුදල් වර්ෂයේ ජනවාරි 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වේ. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ පළමු අර්ධ වර්ෂය සඳහා 2022 සැප්තැම්බර් 30 දිනැතිව මාස දෙකක ප්‍රමාදයකින් යුතුව හා දෙවන අර්ධ වර්ෂය සඳහා 2022 පෙබරවාරි 28 දිනැතිව මාසයක ප්‍රමාදයකින් යුතුව ඉදිරිපත් කරන ලද හිඟ බදු ආදායම් පිළිබඳ වාර්තාව මඟින් ලබා දුන් තොරතුරු පරීක්ෂාවේ දී නිරීක්ෂණය වූ කරුණු පහත වේ.

**2.2.1** දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එක් රැස් කර ගත යුතු සමස්ථ හිඟ බදු, දඩ හා පොළී ආදායම අයකර ගැනීමට පවතින හැකියාව මත අය කළ හැකි හා අය කිරීම් තාවකාලිකව අත් හිටවූ ලෙස වර්ග කර තිබුණු අතර ඒ අනුව, සමස්ථ හිඟ බදු, දඩ හා පොළී ආදායමෙන් සියයට 75 කට වැඩි වටිනාකමක් තාවකාලිකව අත් හිටවූ බදු, දඩ හා පොළී ලෙස හඳුනා ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) ඒ අනුව, **RAMIS** පරිගණක පද්ධතියට අදාළව, 2022 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟ බදු, දඩ හා පොළී වටිනාකමින් සියයට 84 ක් එනම්, රු.562,405,600,725 ක් අය කිරීම් තාවකාලිකව අත්හිටු වූ බදු, දඩ හා පොළී ලෙසත්, රු.109,368,553,575 ක් එනම් සියයට 16 ක් අය කර ගත හැකි හිඟ බදු හා දඩ ලෙසත් හඳුනා ගෙන තිබුණි.

(ii) තවද, Legacy පරිගණක පද්ධතියට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟ බදු, දඩ හා පොළී වටිනාකමින් රු.178,511,486,652 ක් එනම්, සියයට 76 ක් අය කිරීම් තාවකාලිකව අත්හිටු වූ බදු, දඩ හා පොළී ලෙස හඳුනා ගෙන තිබුණි.

ඒ අනුව, සමස්ථ හිඟ බදු, දඩ හා පොළී ආදායමෙන් සැලකිය යුතු ඉහළ වටිනාකමක් තාවකාලිකව අත් හිට වූ බදු, දඩ හා පොළී ලෙස ඉවත් වී යාම දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කාර්යන්ට අදාළ නිශ්චිත කාර්ය සාධනයන්ට ළඟා නොවීමක්ද යන ගැටළුකාරී තත්වය විගණනයේදී නිරීක්ෂණය විය.

**2.2.2** RAMIS පරිගණක පද්ධතියට අදාළව 2022 දෙසැම්බර් 31 දිනට පැවති අයකළ හැකි හිඟ බදු, දඩ හා පොළී වටිනාකමෙන් ආසන්න වශයෙන් සියයට 34 ක් එනම්, රු.37,260,349,009 ක්ම වසර 03 ඉක්ම වූ කාලයක් පුරා පවතින ශේෂයන් බවත්, **Legacy** පරිගණක පද්ධතියට අදාළව

එදිනට පැවැති වටිනාකමෙන් සියයට 92 ක් එනම්, රු.49,541,396,875 ක්ම වසර **03** ඉක්ම වූ කාලයක් පුරා පවතින ශේෂයන් බව නිරීක්ෂණය විය.

**2.2.3** RAMIS පරිගණක පද්ධතියට අදාළව එදිනට අය කිරීම් තාවකාලිකව අත් හිටවූ හිඟ බදු ශේෂයන්ගෙන් සියයට 34 ක් එනම්, රු. 190,228,513,511 ක්ම වසර 03 ඉක්ම වූ කාලයක් පුරා පවතින් බවත් Legacy පරිගණක පද්ධතියට අදාළවද එදිනට අය කර ගත හැකි හිඟ බදු, දඩ හා පොළී වටිනාකමෙන් සියයට 96 ක් එනම්, රු. 170,498,900,008 ක්ම වසර 03 ඉක්ම වූ කාලයක් පුරා පවතින ශේෂයන් බවත් නිරීක්ෂණය විය.

ඒ අනුව, දෙපාර්තමේන්තුව විසින් සත්‍ය වශයෙන්ම අය කර ගත හැකි බදු වටිනාකම් ලෙස හඳුනා ගත් හිඟ බදු මෙන්ම තාවකාලිකව අත් හිටවූ හිඟ බදු ශේෂයන්ද අය කර ගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාණවත් කාර්යක්ෂමතාවයකින් යුතුව ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය විය.

**2.2.4** හිඟ බදු, දඩ හා පොළී ආදායම්. බදු වර්ග අනුව විශ්ලේෂණයේදී, මුළු අය කර ගත හැකි හිඟ බදු ආදායම් වටිනාකමෙන් සියයට 70 ක් එනම්, රු.114,293,744,157 ක් එකතු කළ අගය මත බදු මුදල් බව නිරීක්ෂණය විය. තෙවන පාර්ශවයන් විසින් රැස් කර ගන්නා ලද බදු ආදායම දෙපාර්තමේන්තුව විසින් කාලානුරූපිව ප්‍රේෂණය කර ගැනීමට අවශ්‍ය පියවරයන් ප්‍රමාණවත් පරිදි ක්‍රියාත්මක වී නොමැති බව නිරීක්ෂණය විය.

**2.2.5** Legacy පරිගණක පද්ධතිය යටතේ වසර ගණනාවක සිට පවතින අහෝසි කරන ලද බදු වර්ගයන්ට අදාළ රු. 7,229,330,585 ක් වටිනා හිඟ බදු හා දඩ ශේෂයන් තව දුරටත් නිරීක්ෂණය වන අතර එහිදී, 2021 අංක 18 දරන මුදල් පනතේ II කොටසේ 14 සහ 15 වන වගන්ති ප්‍රකාරව සුදුසුකම් ලබන හිඟ බදු හඳුනා ගෙන කපා හැරීම කාර්යක්ෂමව ක්‍රියාත්මක කර නොමැති බව නිරීක්ෂණය විය.

**2.2.6** 2014 අංක 14 දරන පනතින් සංශෝධිත 2010 අංක 16 දරන පැහැර හරින ලද බදු අය කර ගැනීමේ **(විශේෂ විධිවිධාන)** පනත යටතේ 2009 දෙසැම්බර් **31** දිනට ගෙවීම් පැහැර හරින ලද බදු අය කර ගැනීම සඳහා නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයෙකු යටතේ දෙපාර්තමේන්තුව තුළ වෙනම අංශයක් **(DTRU)** ස්ථාපිත කර අදාළ හිඟ බදු අය කර ගැනීමට අදාළ විශේෂ විධිවිධාන පනවා තිබුණි. එම අංශයට 2015 දෙසැම්බර් 31 දින රු. 48,812,991,690 ක් හිඟ බදු හා දඩ ලෙස මාරු කර ඇති අතර මේ වන විට අංශය පිහිටුවා වසර 12 ක් ගත වී ඇතත්, 2022 දෙසැම්බර් 31 දින වන විට රු. 22,120,036,394 ක් එනම් සියයට 45 ක් පමණක් නිරවුල් කර තිබුණි.

**2.2.7** ඉදිරිපත් කර ඇති තොරතුරු පිළිබඳ සිදුකල නියැදි පරීක්ෂාව අනුව 2019, 2020, 2021 හා 2022 වර්ෂය තුළ මෙම අංශයේ හිඟ බදු නිරවුල් කිරීම මුදලින් රු. 2,583,148,892 ක් (සියයට 25 ක්) හා වෙනත් ප්‍රභවයන්ගෙන් නිරවුල් කිරීම් රු. 7,679,715,027 ක් (සියයට 75 ක්) බව නිරීක්ෂණය විය.

**2.2.8** Legacy පරිගණක පද්ධති යටතේ පාලනය වූ කාලපරිච්ඡේදයන්ට අදාළව දෙපාර්තමේන්තුව විසින් ගනු ලැබූ නීතිමය ක්‍රියාමාර්ග 2007 - 2018 හා 2019 – 2022 කාලපරිච්ඡේදයන් තුළ පිළිවෙලින් රු. 26, 150,871,589 ක් වටිනා නීති කෘත්‍යයන් 188 ක් හා රු. 31,445,998,814 ක් වටිනා නීති කෘත්‍යයන් **183** ක් වශයෙන් එකතු වටිනාකම රු. 57,596,870,403 ක් වූ මතභේදකාරී බදු හා දඩ මුදලකට අදාල නීති කෘත්‍යයන් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් විසඳී නොතිබුණු අතර, එහිදී දෙපාර්තමේන්තුවේ නීති අංශයේ පවතින සේවක පුරප්පාඩු හා අදාල අංශ නීතිපති දෙපාර්තමේන්තුව සමඟ ක්‍රියාකාරී සහයෝගීතාවයකින් කටයුතු නොකිරීම යනාදී අභ්‍යන්තරික ගැටළු පවතින බව නිරීක්ෂණය විය.

**2.2.9** 2022 ජුනි 30 දින වන විට Legacy හා RAMIS පද්ධති වලට අදාළව 2004 වර්ෂයේ සිට නිකුත් කරන ලද රු. 2,488,003,615 ක් වටිනා චෙක්පත් **4,831** ක් අගරුව තිබුණු බවත්, ඒහි ඇතුළත් වර්ෂ 03-10 අතර කාලයක් පුරා නිරවුල් නොවී පවතින අගරු චෙක්පත් ප්‍රමාණය 3,188 ක්. එනම් මුළු අගරු චෙක්පත් සංඛ්‍යාවෙන් සියයට 66 ක් බවත්, බදු ආදායම් එකතු කිරීමේදී දිගින් දිගටම ඇතිවන මෙම තත්ත්වය මගහරවා ගැනීම සඳහා මෙන්ම චෙක්පත් නිරවුල් කර ගැනීම පිළිබඳ උචිත ප්‍රමාණවත් මඟපෙන්වීම් සිදු නොවීම මෙම අයහපත් තත්ත්වයට හේතුවී ඇති බවත් නිරීක්ෂණය විය.

**2.2.10** බදු ගෙවන්නන් විසින් තෙවන පාර්ශවයන්ගෙන් එකතු කළ අගය මත බදු වශයෙන් රැස්කර දෙපාර්තමේන්තුව වෙත චෙක්පත් මඟින් ගෙවනු ලැබූ බදු වලට අදාළව අගරු චෙක්පත් 3,471 ක වටිනාකම රු.1,980,596,605 ක් වූ අතර එය මුළු අගරු චෙක්පත් වටිනාකමෙන් සියයට 80 ක් විය. මෙසේ තෙවන පාර්ශවයන් විසින් වක්‍ර බදු වශයෙන් රැස් කරන ලද ආදායම් ගෙවීමේදී අගරු වී ඇති චෙක්පත් සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග නොගැනීම රජයේ ආදායම් අවභාවිතයට ඉඩ ලබාදීමක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.

**2.2.11** දෙපාර්තමේන්තුව විසින් ආදායම් ඇස්තමේන්තු කර නොතිබුණු ආදායම් සංකේත 07 ක් යටතේ රු. 2,667,312,580 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට රැස් කර තිබුණි. මේ අතුරින් දැනට අහෝසිකර ඇති බදු හෝ ගාස්තු වර්ග 06 කට අදාලව සමාලෝචිත වර්ෂයේ එක්රැස්වන ආදායම, පෙර වර්ෂවලට අදාලව හිඟ ආදායම් වලින් එකතු වන බදු මුදල් ලෙස සැලකිය හැකිය. සමාලෝචිත වර්ෂයේ ආදායම් ප්‍රකාශය අනුව යථෝක්ත බදු වලට අදාල ආදායම් රැස් කිරීම,

හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් ඊට අදාල හිඟ ආදායම් එකතු කිරීම් වලට සමාන විය යුතු වුවත්, රු.259,082,257 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.12** 2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015 හි 8 ඡේදය අනුව දැනට බල නොපැවැත්වෙන බදු හෝ ගාස්තුවල ආදායම් රැස් කිරීමක් වාර්තා වුවහොත් එවැනි අවස්ථාවක එම හිඟ ආදායම් පිළිබඳ වාර්ෂික වාර්තාවත් රැස් කරන ලද ප්‍රමාණයද, සඳහන් කරමින් ආකෘතිපත්‍ර අංක 03 භාවිතා කරමින් සෑම ගිණුම් වර්ෂයක් අවසානයේ ඊට පසුව එළඹෙන මාසය ඇතුළත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තුමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ට පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද යථෝක්ත ආදායම් රැස් කිරීම් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**2.2.13** 2018 ජනවාරි 05 දිනැති හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015 (XI) අනුව ආදායම් සංකේතාංක 10.03.11.00 දරන ප්‍රේෂණ ගාස්තු ආදායම් ශීර්ෂ සඳහා වන සියළුම ආදායම් ගණන්දීමේ කටයුතු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණු අතර දෙපාර්තමේන්තුව විසින් ප්‍රේෂණ ගාස්තු සඳහා සමාලෝචිත වර්ෂයට සහ ඉකුත් වර්ෂයට අදාළව රු. මි. **1** බැගින් ආදායම් ඇස්තමේන්තු කර ඇතත් කිසිදු ආදායමක් රැස්කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**2.2.14** සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ACA 1 අනුව ආදායම් සංකේත 04 කට අදාලව බදු ආදායම් රැස්කිරීමේ ශුද්ධ අගය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 6 සිට 48 දක්වා පරාසයකින් යුතුව පහළ ගොස් තිබුණු බවත්, එහි සමස්ථ බලපෑම රු. 7,339,374,701ක් බවත් නිරීක්ෂණය විය.

**2.2.15** 2019 වර්ෂයට අදාළව පෙර බදු වාර්තා වල දක්වා ඇති අතිරේක බදු රැස් කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව පරිගණක පද්ධතිය ඇසුරින් සිදුකල නියැදි විගණන පරීක්ෂාවේදී පෙර බදු වාර්තා වල දක්වා තිබූ බදු ලිපිගොනු 08 ක 2019 වර්ෂයේ ආදායම් බදු හා එකතු කළ අගය මත බදු වලට අදාලව රු 123,891,664 ක අතිරේක බදු අය කළ බවට වාර්තා කර තිබුණද 2022 සැප්තැම්බර් 20 දිනට පරිගණක පද්ධතිය අනුව එම කාල පරිච්ඡේදයන්ට අතිරේක තක්සේරු වාර්තා නිකුත් කර නොතිබූ බව නිරීක්ෂණය විය.

**2.2.16 හිඟ බදු වාර්තාවල නිවැරදිතාවය**

(අ) මුදල් රෙගුලාසි සංග්‍රහයේ 128 (2 ) (ඇ) ඡේදය ප්‍රකාරව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලද 2022 දෙසැම්බර් 31 දිනට අර්ධ වාර්ෂික හිඟ බදු වාර්තාවල ඇතුළත් කේවල ශේෂයන්ගේ වටිනාකම රු 10,000,000 ට වැඩි බදු ගෙවන්නන් 24 දෙනෙකුට අදාලව පැවැති

රඳවා ගැනීම් බදුවල අයකළ හැකි බදු ශේෂ RAMIS පද්ධතියට අනුව රු. 985,666,458 ක් වැඩියෙන් දක්වා ඇති බව නිරීක්ෂණය විය.

(ආ) එදිනට හිඟ බදු වාර්තාවේ ඇතුළත් සංස්ථාපිත ආදායම් බදු මුදල්වල ඇතුළත් බදු ගෙවන්නන් 31 දෙනෙකුට අදාල හිග බදු ශේෂ RAMIS පද්ධතිය අනුව රු. 411,508,750 අඩු ගණනය වී තිබීම හා 2022 ජුනි 30 දිනට රු. 594,909,174 ක් වටිනා හිඟ බදුවලට අදාල කාලපරිච්ඡේදයන් නිවැරදිව හඳුනාගෙන නොතිබුණි.

(ඇ) තවද, 2018/2019 තක්සේරු වර්ෂයේ සිට තක්සේරු වාර්තා පද්ධතිය තුළින් නිකුත් නොවීම හේතුවෙන් 2020/2021 දක්වා හිඟ බදු වාර්තා නිවැරදිව පද්ධතිය තුළින් ජනනය නොවන අතර හිඟ බදුවලට අදාල කේවල ශේෂ සංචලනයන් පිළිබඳ තොරතුරු (මාරුකිරීම්, එකතුකිරීම් හා අනෙකුත් අදාල ගැලපීම්) පද්ධතිය තුලින් සිදු නොවීම හේතුවෙන් හිඟ බදු වාර්තා සඳහා එම කරුණු Manual සටහන් කිරීමට සිදුව තිබුණි.

මේ අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පිළියල කරන ලද හිඟ බදු වාර්තාවේ නිරවද්‍යතාව RAMIS පද්ධතිය ඇසුරින් විගණනයට තහවුරු නොවුණි

**2.2.17** ආදායම් රැස්කිරීමේ බැංකු ගිණුම් මඟින් භාණ්ඩාගාරයට බැර වන මුදල්, බැංකු ගිණුම් ප්‍රකාශ සමග සසඳා හඳුනා ගෙන ඇති වෙනස්කම් නිවැරදි කිරීමට කාලීනව පියවර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය වූයෙන් ආදායම් ගිණුම්කරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනයේ දුර්වලතා පවතින බව නිරීක්ෂණය විය.

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

**2.3.1** දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය ප්‍රකාශනයන්හි බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය පිළියෙල කිරීමේ දී 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර ව බැඳීම් හා බැරකම් වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන නොතිබුණි.

**2.3.2** 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ 2022 දෙසැම්බර් 31 දිනට වැය විෂය 02 කට අදාලව බැඳීම් හා බැරකම් රු. 2,130,464 කින් අඩුවෙන් ද, ගොඩනැගිලි කුලී වැය විෂයට අදාලව බැරකම හඳුනාගැනීමේදී රු. 3,402,666 වැඩියෙන් ද, දක්වා තිබීම හා විගණන නියැදි පරීක්ෂාවකට අනුව දෙපාර්තමේන්තුව විසින් රු.194,140,500 ක් වටිනා දිගුකාලීන ගිවිසුම්වලට එළඹීම හේතුවෙන් උද්ගතව තිබූ බැඳීම් සමාලෝචිත වර්ෂයේ ගිණුම් මඟින් හෙළිදරව් කර නොතිබීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ නිවැරදිතාවය විගණනයේ දී ගැටළු සහගත විය.

**2.3.3** 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ සඳහන් ශේෂයෙන් 2023 පෙබරවාරි 28 වන දින වන විටත් නොපියවූ බැඳීම් හා බැරකම් ප්‍රමාණය රු. 17,946,949 ක් ( සියයට 30) විය.

### 2.4 නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 3.1 වගන්තිය ප්‍රකාරව, රජයේ වාහන නඩත්තු කිරීමට අදාලව දෙපාර්තමේන්තු වාහන සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාව සිදු නොකිරීම, ඉන්ධන පරීක්ෂාව සිදුකල දින සිට පාවිච්චි කල ඉන්ධන ප්‍රමාණය පිළිබඳ මාසික වාර්තා සටහනක් පවත්වාගෙන නොයාම, සියළුම රියදුරන් පොදු 268 හා 2008 ජූනි 26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/2008 හි ඇමුණුම 01 ආකෘති විධිමත් පරිදි පවත්වා ගැනීමට උපදෙස් ලබා නොදීම යන කරුණු අභ්‍යන්තර විගණන වාර්තාවලින් අනාවරණය කර තිබුණි. මෙම දුර්වල අභ්‍යන්තර පාලනය හේතුවෙන් විගණනය වෙත ඉදිරිපත්කර ඇති ගිණුම්වල ඇතුළත් රථවාහන සඳහා වාර්ෂිකව දරන ලද රු. 110,308,706 ක ඉන්ධන හා වියදම්වල නිවැරදිතාවය විගණනයේදී ගැටළු සහගත විය.

### 2.5 අවිධිමත් ගනුදෙනු

#### 2.5.1 විධිමත් අනුමැතියකින් තොරව ගෙවීම් කිරීම

**2.5.1.1** කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක : 01/2019 හි 1.1 ඡේදය ප්‍රකාරව RAMIS ව්‍යාපෘතියේ කාර්ය ගෙවීම් කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා තිබිය යුතු වුවත් RAMIS ව්‍යාපෘතියට අදාල අනුමත කාර්ය මණ්ඩලය පවත්වා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය 2019 නොවැම්බර් 30 දින දක්වා පමණක් ලැබී තිබීම හේතුවෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව 2019 දෙසැම්බර් සිට 2022 දෙසැම්බර් දක්වා රු. 91,550,864 ක් ගෙවා තිබුණි.

**2.5.1.2** 2022 වර්ෂය සඳහා RAMIS ව්‍යාපෘතිය යටතේ දීමනා ගෙවීමේදී නිත්‍ය රාජකාරි සඳහා නිවාඩු අනුමත කර ගෙන තිබූ නිලධාරීන් සිව් දෙනෙකුට එම නිවාඩු කාලපරිච්ඡේදයන් සඳහාද රු. 157,632 ක්ද, ව්‍යාපෘතියෙන් ඉවත්ව ගිය නිලධාරීන් දෙදෙනෙකු වෙත ඉවත්ව යාමෙන් පසු රු. 23,848 ක්ද ගෙවා තිබුණි. දීමනා ගෙවීමට අදාලව රාජකාරි ඉටු කර ඇති බවට තහවුරු කිරීමට අදාළව මනා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වාගෙන නොයෑම හේතුවෙන් ඉහත දුර්වලතා පැන නැගී ඇති බව නිරීක්ෂණය විය.

## 2.6 තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

අපේක්ෂිත වියදම වඩාත් නිවැරදිව ඇස්තමේන්තු නොකිරීම හේතුවෙන් අවශ්‍ය ප්‍රමාණයට වඩා සැලකිය යුතු අතිරික්ත මුදල් ප්‍රමාණයක් අත්තිකාරම් වශයෙන් ලබාදී තිබුණ අතර එසේ වැඩිපෙන් ලබා දී තිබුණු ප්‍රමාණය සියයට 27 සිට සියයට 72 දක්වා පරාසයක විය. විශේෂිත කාර්යයක් සඳහා නිලධාරියකු වෙත ලබාදියයුතු උපරිම අත්තිකාරම් සීමාව රු.100,000 නොඉක්මවිය යුතු වුවද එම සීමාව ඉක්මවන ලෙස අත්තිකාරම් ලබා දුන් අවස්ථාද නිරීක්ෂණය විය.

## 2.7 තැන්පතු

මුදල් රෙගුලාසි 571 ප්‍රකාර ව ඉකුත් තැන්පතු සැලකිල්ලට ගනිමින් කටයුතු කළයුතු වූ පොදු තැන්පත් ගිණුම් 02 කට අයත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් නොවූ ශේෂ වටිනාකම රු. 4,028,671 ක් වූ අතර, ව්‍යවස්ථාපිත ගෙවීම් සඳහා තාවකාලික රඳවා ගැනීම් වලට අදාලව 2022 දෙසැම්බර් 31 දිනට වූ ශේෂය තුළ නිරවුල් කරමින් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණු වටිනාකම රු. 480,311 ක් විය.

## 2.8 බැංකු ගිණුම් මෙහෙයවීම

දේශීය ආදායම් දෙපාර්තමේන්තු අභ්‍යන්තර විගණන ඒකකයේ විගණනයට ලක්වූ මඩකලපුව, අනුරාධපුරය, කොළඹ දකුණ හා මීගමුව යන ප්‍රාදේශීය කාර්යාල වෙත ලැබී තිබූ රු. 22,291,279 ක් වටිනා චෙක්පත් 48 ක් නියමිත දිනට බැංකුගත නොකර අත රඳවාගෙන පැවති අවස්ථා නිරීක්ෂණය වූ අතර එම තත්වය මග හරවා ගැනීම සඳහා නිසි අධීක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කල යුතුව පැවතුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

### 3.1.1 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

#### 3.1.1.1 දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ RAMIS පද්ධතියේ කාර්යය සාධනය පරීක්ෂාව

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ අරමුණ පෙරදැරිව, ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර තිබුණු අතර ඒ සඳහා 2014 වර්ෂයේ සිට 2022 සැප්තැම්බර් දක්වා රු. 7,153,012,199 ක මුළු පිරිවැයක් දරා තිබුණි. RAMIS 1.0 සඳහා 2014 මැයි 27 දින සිංගප්පූරු ඩොලර් 35,006,646 කට (පැවති විදේශ විනිමය මිල අනුව රු.බිලියන

04 ක මුදලකට) සිංගප්පූරුවේ ආයතනයක් සමඟ ගිවිසුම් ගත වී තිබූ අතර එම පද්ධතියේ වැඩ කටයුතු නිම කර තිබූ මොඩියුල 2016 ජනවාරි 01 සිට ක්‍රියාත්මක කර තිබුණි.යථෝක්ත පද්ධතියේ නඩත්තු සේවා සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) දෙපාර්තමේන්තුව විසින් 2016 ජනවාරි මස සිට 2020 ඔක්තෝබර් දක්වා වර්ෂ 04 ක පද්ධති නඩත්තු සේවා කටයුතු සිංගප්පූරු ඩොලර් 5,880,313 (රු.725,882,619) පිරිවැයක් දරා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව 2020 ඔක්තෝබර් මස දී අවසන් වීමේ දී එහි නඩත්තු කටයුතු දෙපාර්තමේන්තුවට භාර ගැනීමට නියමිත නමුත් ඒ සඳහා අවශ්‍ය සේවකයින් බඳවා ගැනීමට කටයුතු නොකිරීම හා මෘදුකාංග හා දෘඩාංග යාවත්කාලීන කිරීමට කටයුතු නොකිරීම මත එම පද්ධතිය භාර ගැනීමට දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි. මෙ හේතුවෙන් 2021 ජනවාරි 31 දක්වා මාස 03 කින් කොන්ත්‍රාත් ගිවිසුම දීර්ඝ කරමින් සිංගප්පූරු ඩොලර් 309,824 ක් (රු. 46,826,053) ගෙවා තිබුණු අතර, නැවතත් 2021 පෙබරවාරි 01 දින සිට 2024 ජනවාරි 31 දක්වා වසර 03 කට සිංගප්පූරු ඩොලර් 21,053,371 කට (රු.බි. 3.1 ක් පමණ) නඩත්තු සේවා කොන්ත්‍රාත්තුව සිංගප්පූරු සහයෝගිතා ආයතනයේ උප කොන්ත්‍රාත් කරුවකු වෙත ලබා දී තිබුණි. මෙහිදී නඩත්තු කටයුතු අදියර වශයෙන් පවරා ගත යුතු වුවද, කාර්යය මණ්ඩලය බඳවා ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් දෙවන අදියර පවරා ගැනීම 2023 දක්වා වසරකින් දීර්ඝ කිරීමට සිදු වී තිබුණු අතර, ගිවිසුම් ප්‍රකාරව Phase 01, Phase 02, Phase 03 හා Phase 04 පිළිවෙලින් 2021 පෙබරවාරි 01, 2022 ජනවාරි, 2023 ජනවාරි හා 2024 ජනවාරි යන කාල පරාසයන් තුළ දී භාර ගැනීම සඳහා ගිවිසුම් ගත වී තිබුණි. නියමිත දිනට නඩත්තු කටයුතු දෙපාර්තමේන්තුව විසින් භාර ගැනීමට අපොහොසත් වුවහොත්, Phase 02 සඳහා ගිවිසුම් ගත දෙවැනි වසරට මසකට සිංගප්පූරු ඩොලර් 89,438 ක්ද, Phase 03 භාර නොගැනීම මත ගිවිසුම් ගත වී 3 වැනි වසරට මසකට සිංගප්පූරු ඩොලර් 191,498 ක් බැගින් අමතර පිරිවැය දැරීමට සිදු විය හැකි බව නිරීක්ෂණය විය.

(ආ) 2017 අංක 24 දරන නව දේශීය ආදායම් පනත ක්‍රියාත්මක වීමත් සමඟ 2018 අප්‍රේල් පළවෙනිදා සිට බදු පරිපාලනයට අදාළ බොහෝ ක්‍රමවේදයන් හා නෛතිමය තත්ත්වයන් වෙනස් වීමට භාජනය වීම මත නව බදු පනත වෙනුවෙන් සිදු කළ යුතු සංශෝධනයන් සඳහා සිංගප්පූරුවේ ආයතනයක් වෙත ව්‍යාපෘති 02 ක් යටතේ එම කටයුත්ත පවරා තිබුණි. ඒ අනුව බදු වාර්තා නිකුත් කිරීම හා එකතු කිරීම හා ඊ සේවාවන් සිදු කිරීම යන කාර්යයන් ව්‍යාපෘතියට ඇතුළත් කර RAMIS 2.0 අදියර A සඳහා සිංගප්පූරු ඩොලර් 1,760,000 (රු.මි.265ක් පමණ) කට ගිවිසුම් ගත වී තිබුණු අතර, ප්‍රාග්ධන ලාභ බදු සහ ආදායම් බදු සඳහා ස්වයං ඇස්තමේන්තුගත වාර්තා වලට අදාල කටයුතු, සංචාරක VAT බදු ආපසු ගෙවීම් සම්බන්ධ කටයුතු, නව බදු ගෙවන්නන් ලියාපදිංචිය, බදු වාර්තා නිකුත් කිරීම හා ලබා ගැනීම, බදු ගෙවීම් ලබා ගැනීම හා එකතු කිරීම, තක්සේරු නිකුත් කිරීම, බදු අභියාචනා ලබා ගැනීම හා සකස් කිරීම, බදු ආපසු ගෙවීම් නිකුත් කිරීම, නිෂ්කාශන සහතික නිකුත් කිරීම, දේශීය ආදායම්

දෙපාර්තමේන්තුව හා අනෙකුත් සම්බන්ධ ආයතන සමඟ අතුරු මුහුණත් (Interface) සැපයීම හා අන්තර්ජාල හරහා සම්බන්ධ වීම යන කාර්යයන් සඳහා 2.0 අදියර B හිදී සිංගප්පූරු ඩොලර් 15,534,364 (රු.බි. 2.3 ක් පමණ) කට ගිවිසුම් ගත වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) RAMIS පද්ධතිය ක්‍රියාත්මක වීමේ දී ඇති වන ගැටළු සඳහා RAMIS පද්ධතියෙහි යම් යම් වෙනස්කම් සිදු කරනු ලබන බවත්, මේ සඳහා සිංගප්පූරු ආයතනයට එම වෙනස්කම් සිදු කිරීමට ගත වන මිනිස් දිනක් සඳහා සිංගප්පූරු ඩොලර් 1,333 ක් එනම් දල වශයෙන් රු.185,017 ක් වැය වන බවත්,ඒ අනුව එම ආයතනයට මොඩියුල සංවර්ධනය කිරීමට ගෙවන පිරිවැයට අමතරව, මෙසේ සිදු කල වෙනස්කම් සඳහා විටින් විට රු.71,723,662 ක් ගෙවා තිබුණු බව නියැදි විගණන පරීක්ෂාවකදී නිරීක්ෂණය විය. තවද පද්ධතිය ක්‍රියාත්මක කිරීමේදී මෙන්ම බදු සඳහා නිරන්තරයෙන් යෝජනා කරනු ලබන වෙනස්කම් හේතුවෙන් ගැටළු ඇති විය හැකි අවස්ථා සඳහා පද්ධතිය නිර්මාණය කිරීමේ දී/ පද්ධති අවශ්‍යතා විශ්ලේෂණයේ දී අවධානය යොමු නොකිරීම විටින් විට මෙම අමතර වියදම් දැරීමට හේතු වී ඇති බව නිරීක්ෂණය විය.

(ii) RAMIS 2.0 යටතේ, තක්සේරු වාර්තා නිකුත් කිරීමේ මොඩියුලය සංවර්ධනය නොවීම හේතුවෙන් 2022 මැයි 31 දිනට කාල කඩඉමට යටත් 2018/ 19 තක්සේරු වර්ෂයට අදාළව වූ ආදායම් බදු තක්සේරු වාර්තා නිකුත් කිරීම පද්ධතිය හරහා සිදුකළ නොහැකි බවත් මොඩියුල සංවර්ධනය නොවීම හේතුවෙන් 2018/19 තක්සේරු වර්ෂයෙන් ඉදිරියට පද්ධතිය හරහා නිලධාරීන් වෙත වැඩ අයිතම පැවරීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය.

### 3.1.1.2 RAMIS පද්ධතිය සඳහා කාර්යය මණ්ඩලය පුහුණුව හා බඳවා ගැනීම

(අ) RAMIS ව්‍යාපෘතිය සඳහා පිළියෙල කරන ලද අවශ්‍යතා ලේඛනයට (Schedule of Requirements) හි 4.2.3 අනුව, පුහුණු සැලැස්මක් පිළියෙල කිරීමත් ඒ අනුව පුහුණු පාඨමාලා සිදු කිරීම යනාදිය දක්වා තිබුන ද දෙපාර්තමේන්තුව ඒ අනුව කටයුතු සිදු කළ බව හා සිදු කරමින් පවතින කටයුතුවල ප්‍රගතිය පරීක්ෂා කිරීමට තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිය.

(ආ) මෙම ව්‍යාපෘතියෙහි විෂය පථයට අදාල කාර්යයන් ආවරණය කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලයට අනුව කාර්යය මණ්ඩලය ඌනතාවය 40 ක් වන අතර එම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා මෙතෙක් කටයුතු කර නොගැනීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පවරා ගැනීම

ප්‍රමාද වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපානු ලබන බවද, ඒ මත අතිරේක වියදම් දැරීමට සිදු වන බවද, නිරීක්ෂණය විය.

### 3.1.1.3 RAMIS ව්‍යාපෘතිය ස්ථාපනය සඳහා යොදවා ඇති කාර්යය මණ්ඩල වියදම

RAMIS පද්ධතිය ස්ථාපිත කිරීම වෙනුවෙන් පවත්වා ගෙන යනු ලබන ව්‍යාපෘති කාර්යාලයේ 2021 ගෙවීම් පිළිබඳ නියැදි පරීක්ෂාවට අනුව නිලධාරීන් 71 ක් වෙන මාසිකව දල වශයෙන් රු. 2,557,512 බැගින් මුදලක් ගෙවා තිබුණු අතර, 2020 වර්ෂයේ ඔක්තෝබර් සිට 2021 වර්ෂයේ ඔක්තෝබර් දක්වා කාල පරිච්ඡේදයට අදාළව RAMIS ව්‍යාපෘති කාර්යය මණ්ඩලය සඳහා රු.44,114,059 ක් ගෙවීම් කර තිබුණි. තවද, මෙම ව්‍යාපෘති කාර්යය මණ්ඩලය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රාජකාරී කටයුතු වල නිරත වන අතරතුරදී මෙම ව්‍යාපෘතියෙහි කටයුතු සඳහා තම සේවා දායකත්වය ලබා දීම සිදු කරනු ලැබීමෙන් 2014 සිට 2022 වර්ෂය දක්වා ආසන්න වශයෙන් වසර 08 කට ආසන්න කාලසීමාවක් නිත්‍ය රාජකාරී කටයුතු වලට බාධාවක් විය හැකි බවත්, ව්‍යාපෘතිය අප්‍රමාදීව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් භාර නොගැනීම දෙපාර්තමේන්තු සමස්ථ කාර්යක්ෂමතාවයට අහිතකර බලපෑම් ඇතිවිය හැකි බවත් නිරීක්ෂණය විය.

### 3.1.1.4 RAMIS පද්ධතියට ආයතන 28 ක් සම්බන්ධ කිරීමේ ප්‍රගතිය

ආයතන 28 ක් RAMIS පද්ධතියට සම්බන්ධ කිරීම අදියර 4 ක් යටතේ සිදු කිරීමටත් එහිදී , දැනටමත් ශ්‍රී ලංකා රේගුව, මහජන බැංකුව, ලංකා බැංකුව, මුදල් අමාත්‍යාංශය, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව, ලංකා ක්ලියර් පුද්ගලික සමාගම යන ආයතන 06 සම්බන්ධ කර ඇති අතර, ඉතිරි ආයතන විවිධ ගැටළු පැවතීම හේතුවෙන් මෙතෙක් සම්බන්ධ කළ නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය.

## 3.2 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුව සතු ගිණුම්ගත වටිනාකම රු. 10,900,000 ක් වූ වාහන 04 ක් 2020 හා 2021 වර්ෂයන්වල සිට නිශ්ක්‍රියව පවතින බව නිරීක්ෂණය වූ අතර, 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා අවස්ථා 11 ක දී, අනතුර සිදුවී මාස 11 සිට වසර තුනක් ගතවී ඇති වාහන අනතුරු සම්බන්ධයෙන් අලුත්වැඩියා කටයුතු මෙතෙක් අවසන් වී නොතිබුණු අතර, සිදුවූ හානිය තක්සේරු කිරීමක්ද සිදුකර නොතිබුණි.

### 3.3 පාඩු හා හානි

**(අ)** මුදල් රෙගුලාසි 103 හා 109 ප්‍රකාරව, අවස්ථා 05 කදී 2019 හා 2020 වර්ෂවලදී සිදු වූ වාහන අනතුරු සම්බන්ධයෙන් වටිනාකම රු. 64,567 ක් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකිරීම හෝ කපා හැරීම සිදු කල යුතු වුවත් ඒඅනුව කටයුතු කර නොතිබුණි.

**(ආ)** හානි පාඩු ලේඛනය අනුව 2022 වර්ෂයේදී සිදු වූ අලාභ යටතේ , 2022 දෙසැම්බර් 31 දින වන විට අය විය යුතුව පැවැති වාහන 02 කට අදාල අලාභය රු. 89,900 ක මුදලක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි

**(ඇ)** 2022 වර්ෂයේ කපා නොහල ඉදිරියට ගෙනයන ශේෂ අතර වාහන අනතුරු 02 ක් සම්බන්ධයෙන් රු. 4,361,250 ක අලාභ වටිනාකමක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණද එම වටිනාකම් හානි පාඩු ලේඛනයේ දක්වා නොතිබුණි.

**(ඈ)** 2021 වර්ෂයේදී සිදුවී ඇති වාහන අනතුරු පහක් සම්බන්ධයෙන් 2023 අප්‍රේල් 27 දිනය වන විටද , අලුත්වැඩියා කර අවසන් වී නොමැති බව නිරීක්ෂණය වූ අතර, එහි ඇතුළත් CAD 0165 දරන වාහනයට අදාල අලාභයේ වටිනාකම වූ රු. 3,475,000 ක් පමණක් 2022 වර්ෂයේ සිදුවූ අලාභ යටතේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

**(ඉ)** 2022 දෙසැම්බර් 31 දින වනවිට අයවීමට නියමිතව ඇති NA 9123 දරන වාහන අනතුර සම්බන්ධයෙන් වූ ඉදිරියට ගෙන යන ශේෂ යටතේ දැක්විය යුතු රු. 24,450 ක අලාභය, එසේ ඉදිරියට ගෙන ගොස් නොමැතිව අයකර ගැනීම් යටතේ දක්වා තිබුණි.

### 3.4 අනාර්ථික ගනුදෙනු

වර්තමානයේදී බදු පරිපාලනය සම්බන්ධ සමස්ථ ක්‍රියාවලිය පරිගණක පද්ධතිය හරහා මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදුවන අවධියක අවශ්‍යතාවය අධි ඇස්තමේන්තු කරමින් දෙපාර්තමේන්තුව විසින් 2019 , 2020 වර්ෂ වලදී රු. 556,365 ක පිරිවැයක් දරමින් මුද්‍රණය කර තිබුණු , උපදෙස් පත්‍රිකා 11 කට අදාල .ආකෘති පත්‍ර කට්ටල 35,820 ක් හා 2021 වර්ෂයේදී රු.1,089,675 ක් වැයකර මුද්‍රණය කරන ලද ආකෘති පත්‍ර කට්ටල 888,139 ක් තවදුරටත් භාවිතයට ගත නොහැකිව දෙපාර්තමේන්තු ගබඩාවේ පවතින බවත්, මෙ හේතුවෙන් රු. 131,683 ක VAT බදු මුදල්ද සමඟ රජයට සිදුව තිබුණු පාඩුව රු. 1,777,723 ක් බවත් නිරීක්ෂණය විය.

### 3.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

සමාලෝචිත වර්ෂයේ විගණනයට අදාලව නිකුත් කරන ලද විගණන විමසුම් 08 කට දෙපාර්තමේන්තුව විසින් පිළිතුරු ලබාදී නොතිබුණු අතර යථෝක්ත විමසුම්වලින් රු. 26,243,200,680 ක් වටිනාකමකින් යුතු කරුණු සම්බන්ධයෙන් විමසීම් කර තිබුණි.

### 3.6 කළමනාකරණ දුර්වලතා

**3.6.1** ආයතන සංග්‍රහය xxiv පරිච්ඡේදය, මුදල් රෙගුලාසි 113 (6) (ආ) ඡේදය හා 2020 සැප්තැම්බර් 02 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව කටයුතු කරමින් විශ්‍රාම ගිය හා තනතුර හැරගිය නිලධාරීන් 09 දෙනෙකුට අදාල රු.1,456,174 ක් වූ ණය ශේෂය නිරවුල් කර නොතිබුණි.

**3.6.2** 2014/2015 වර්ෂයේ සිට මේ දක්වා කැසිනෝ ව්‍යාපාරය වලින් බදු අය කිරීම් පිළිබඳ පරීක්ෂාව

**(අ) තක්සේරු වර්ෂයන් සඳහා වාර්ෂික බද්ද**

(i) 1988 අංක 40 දරන ඔට්ටු හා සූදු බදු පනතේ 2 වන වගන්තිය හා 2015 අංක 14 දරන ඔට්ටු හා සූදු බදු (සංශෝධන) පනතින් කරන ලද සංශෝධනවලට අනුව කැසිනෝ ව්‍යාපාර පවත්වාගෙන යන්නන් විසින් රුපියල් මිලියන 200 ක වාර්ෂික බද්දක් ගෙවියයුතු වුවත් කැසිනෝ ව්‍යාපාර සඳහා ලියාපදිංචි බදුගෙවන්නන් දෙදෙනෙකු විසින් රු. 440,980,000 ක් වටිනා වාර්ෂික බදු මුදල් ගෙවා නොතිබුණි.

(ii) කැසිනෝ ව්‍යාපාර පවත්වාගෙන යන්නන් විසින් වාර්ෂික බද්දට අදාල වාරිකය 1988 අංක 40 දරන ඔට්ටු හා සූදු බදු පනතෙහි 2 වන වගන්තිය හා 2001 අංක 07 දරන ඔට්ටු හා සූදු බදු පනතේ සංශෝධනයන්ට අනුව ගෙවිය යුතු අතර, යථෝක්ත පනතෙහි 4 වන වගන්තියේ 3 වන උපවගන්තිය හා 2001 අංක 07 දරන ඔට්ටු හා සූදු බදු (සංශෝධන) පනත 3 (ආ) වගන්තිය අනුව නියමිත දිනට පසුව ගෙවන යම් බද්දක් සඳහා සියයට 33 1/3 ක දඩ මුදලක් ද, 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 151 හා 157 වගන්තිය අනුව නියමිත දිනට පසුව ගෙවන යම් බද්දක් සඳහා නියමිත දිනයේ සිට මේ දක්වා පොලියක් ද අය විය යුතු වේ. ඒ අනුව එකිනෙක වර්ෂ සඳහා කැසිනෝ ව්‍යාපාරවල ප්‍රමාද වී වාර්ෂික බදු ගෙවීම් සම්බන්ධව නියම කළ හැකි දඩ ප්‍රමාණය ලෙස ආසන්න වශයෙන් රු.1,558,295,125 ක් පමණ අය කර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

(iii) යථෝක්ත නියමයන්ට අනුව 2014 වර්ෂයේ සිට නොගෙවූ බදු හා ප්‍රමාද වී සිදු කළ ගෙවීම් සම්බන්ධව එක් ව්‍යාපාරිකයෙක් වෙත ඉදිරිපත් කරන ලද මෙතෙක් නිකුත් වී ඇති තක්සේරු අනුව දඩ මුදල් රු. 91,666,667 ඌන ගණනය වී තිබුණි.

**(ආ) කැසිනෝ ව්‍යාපාර සඳහා දල මුදල් ලැබීම් එකතුව මත බදු අය කිරීම**

(i) දේශීය ආදායම් කොමසාරිස්වරයා විසින් ඔට්ටු හා සූදු ව්‍යාපාර සම්බන්ධයෙන් දෙපාර්තුමේන්තු ආකෘති පත්‍ර ප්‍රකාරව අදාල කාර්තුවෙහි දල මුදල් ලැබීම් වාර්තා පමණක් ලබාගන්නා අතර එම දල ලැබීම් සනාථ කරගත හැකි උපකාරක ලියවිලි ලබා ගැනීම්

පරීක්ෂා කිරීමට හෝ පිරිවැටුම වෙනම ම හඳුනා ගැනීමට හැකිවන පරිදි සුදුසු ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිතකර නොතිබුණි. ඒ අනුව කැසිනෝ ව්‍යාපාර සඳහා නිවැරදි මාසික දල එකතුව නිවැරදිව හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක නොකරන බැවින් කැසිනෝ ව්‍යාපාර මත අය කළ යුතු දල එකතුව මත බද්ද නිවැරදිව අය වන බව විගණනයේදී නිරීක්ෂණය නොවිය.

**(ii)** 2013 අංක 19 දරන ඔට්ටු හා සූදු බදු (සංශෝධන) පනත හා 2015 අංක 14 දරන ඔට්ටු හා සූදු බදු (සංශෝධන) පනත අනුව දල එකතුව පිළිබඳ වාර්තාව කාර්තුව අවසාන වී එළඹෙන මස **20** වන දිනට පෙර දෙපාර්තමේන්තුව වෙත භාරදිය යුතු අතර, ඊළඟට එළඹෙන මස පළමුවන සතිය තුල ගෙවිය යුතුය. වාර්තා භාරදීමට අපොහොසත් වන්නේ නම් රු. 50,000 ක උපරිමයකට යටත් දඩයක් ද, නියමිත දිනට නොගෙවන අවස්ථාවලදී යථෝක්ත පනත හා 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 179 හා 180 වගන්තිවල විධිවිධාන ප්‍රකාරව දණ්ඩන ද පැනවිය යුතුය. තක්සේරු වර්ෂ 2014/2015 වර්ෂවල සිට මේ දක්වා දල එකතුව පිළිබඳ වාර්තා දේශීය ආදායම් දෙපාර්තුමේන්තුවට නියමිත දිනට භාර දී නොමැති අවස්ථාවලදී හා ගෙවිය යුතු බද්ද නියමිත දිනට නොගෙවීම මත අය කළ යුතු රු. 342,281,284 ක් හිඟ දඩ හා ඊට අදාල පොලිය අය කර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

**(ඇ) කැසිනෝ ඇතුලත්වීමේ බද්ද අය කිරීම**

2015 අංක 14 දරන ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනතේ 2 වන වගන්තිය මගින් සංශෝධනය කරනු ලැබූ 1988 අංක 40 දරන පනතට ඇතුළත් කල 2 (1) (අ) වගන්තිය ප්‍රකාරව 2015 ජනවාරි මස 01 වන දින හෝ ඉන් පසුව ශ්‍රී ලංකාවේ සූදු ව්‍යාපාරය පවත්වා ගෙන යනු ලබන සෑම තැනැත්තකු විසින්ම එම සූදු ව්‍යාපාරය පවත්වා ගෙන යනු ලබන ස්ථානයට ඇතුල්වන සෑම තැනැත්තෙකුගෙන්ම ඇමරිකානු ඩොලර් 100 ක් හෝ පරිවර්තනය කල හැකි ඊට සමාන වෙනත් ව්‍යවහාර මුදලකින් හෝ ඊට සමාන ශ්‍රී ලංකා රුපියල් වලින් කැසිනෝ ඇතුලත්වීමේ බද්දක් අය කරනු ලැබිය යුතුය.මෙම බද්ද අය 2016 - 2019 වර්ෂ දක්වා අහෝසිකර තිබුණ නමුත් නැවත 2019 වසරේ අයවැය යෝජනා මගින් කැසිනෝ ව්‍යාපාරික ස්ථානයට ඇතුලත්වන ශ්‍රී ලංකාවේ වාසික පුද්ගලයකු හෝ පුරවැසියකුගෙන් ඇමරිකානු ඩොලර් 50 ක මුදලක් කැසිනෝ ඇතුලත්වීමේ බද්දක් ලෙස අය කිරීමට යෝජනා කරන ලද නමුත් දෙපාර්තමේන්තුව විසින් මෙම බද්ද අය කර ගැනීම සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**(ඈ) කැසිනෝ ව්‍යාපාර කර්මාන්ත අය බද්ද අය කිරීම**

2015 අංක 10 දරණ මුදල් පනතින් පනවා ඇති කැසිනෝ ව්‍යාපාර කර්මාන්ත අය බද්ද ව්‍යාපාරිකයන් විසින් වාරික වශයෙන් ගෙවීමට කටයුතු කර තිබුණද කැසිනෝ ව්‍යාපාර දෙකක් වෙතින් තවදුරටත් කැසිනෝ ව්‍යාපාර කර්මාන්ත අය බද්දට අදාලව රු. 2,980,000,000 ක් වටිනා හිඟ බදු හා දඩ මුදල් අයවිය යුතුව ඇති අතර එම හිඟ බදු අයකරගැනීම සඳහා පමණක් නීතිමය පියවර ගෙන තිබුණි. කැසිනෝ ව්‍යාපාර කර්මාන්ත අය බද්ද ප්‍රමාද වී සම්පූර්ණයෙන් ගෙවා ඇති ව්‍යාපාර දෙකක් වෙතින් 1988 අංක 40 දරන ඔට්ටු හා සූදු බදු පනතෙහි 4 වන වගන්තියේ 3 වන උපවගන්තිය හා 2001 අංක 07 දරන ඔට්ටු හා සූදු බදු (සංශෝධන) පනත 3 (ආ) වගන්තිය හා 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 151 හා 157 වගන්තිය අනුව ප්‍රමාදය මත අය කළයුතු දඩ හා පොලී අයකිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ඔට්ටු හා සූදු බදු වලට අදාලව ශ්‍රී ලංකාවේ කැසිනෝ ව්‍යාපාර සම්බන්ධ බදු කටයුතු පරිපාලනය හා කළමනාකරණය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියට ඓ් දක්වා ඇතුලත් කර නොමැති වීම හේතුවෙන් යෝජිත පද්ධතිය ස්ථාපනය කර බදු කටයුතු ස්වයංක්‍රියකරණය තුළින් අපේක්ෂිත ප්‍රධාන අරමුණක් වන බදු අධිකාරිය සමඟ බදුකරු සෘජුව සම්බන්ධ වීමෙන් සිදුවිය හැකි ගැටළු අවම කර ගැනීම හෝ දෙපාර්ශවය මනා විනිවිදභාවයකින් යුතුව කටයුතු කරන බවට තහවුරුවක් සිදු නොවීණි.

### 3.6.3 රාජ්‍ය ආයතන විසින් බදුකරුවන් වෙත ගෙවන ලද එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් සිදු කරනු ලබන ක්‍රියාවලිය පරීක්ෂා කිරීම

රාජ්‍ය ආයතන විසින් බදුකරුවන් වෙත ගෙවන ලද එකතු කළ අගය මත බදු (VAT) මුදල් පිළිබඳව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 වගන්තිය ප්‍රකාරව කටයුතු කළයුතු අතර 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනතේ 26 (1) වගන්තිය හා 21 (1) (ආ) වගන්තිය ප්‍රකාරව බදුකරුවන් විසින් කටයුතු කළ යුතුය. නියැදි විගණන පරීක්ෂාවකට අනුව, රාජ්‍ය ආයතන 6 ක් විසින් සිය සැපයුම්කරුවන්ට ගෙවන ලද VAT බදු එම බදුකරුවන් විසින් දෙපාර්තමේන්තුව අයවීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සක්‍රිය බදු කරුවන් 305 දෙනෙකු විසින් එකතු කළ අගය මත බදු වශයෙන් 2019, 2020 හා 2021 වර්ෂ තුළ රැස් කර තිබුණු රු. 205,813,913 ක් වටිනා බදු මුදල් ඔවුන් විසින් ඉදිරිපත් කර තිබුණු VAT නිමවුම් උපලේඛන වල ඇතුලත් කර නොතිබීම හෝ අදාල කාල පරිච්ඡේදයට නිමවුම් උපලේඛන RAMIS පද්ධතියට ඇතුලත් නොවීම හේතුවෙන් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය වී නොතිබුණි.

(ආ)බදු කරුවන් 14 දෙනෙකු විසින් VAT වාර්තා මගින් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ වටිනාකම නිවැරදිව ගෙවීම් කර නොතිබීම හේතුවෙන් රු.524,665,221 ක් වටිනා බදු මුදල් රජයට අයවී නොතිබුණ අතර ඊට නියමිත වැඩ අයිතම විගණන දිනය දක්වා අවසන් කර නොතිබුණි.

(ඇ) අක්‍රීය බදු කරුවන් 05 දෙනෙකු වෙත ගෙවා තිබුණු රු. 569,506 ක් හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වී නොතිබුණු බදුකරුවන් විසින් රැස්කර තිබුණු රු. 1,144,529 ක් වටිනා වැට් බදු දෙපාර්තමේන්තුව වෙත අයවී නොතිබුණු අතර, බදුකරුවන් දෙදෙනෙකු විසින් එකතු කළ අගය මත බදු සම්බන්ධ නිමවුම් උපලේඛන නිවැරදි ආකෘතියට අනුව ඉදිරිපත් කිරීම වෙනුවට කාර්තුමය සාරාංශ වාර්තා වශයෙන් ඉදිරිපත් කිරීම හේතුවෙන් රු. 289,828 ක් වටිනා VAT බදු දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය වූ බවට තහවුරු නොවිය. රු.1,756,811 ක් වූ VAT බදු ප්‍රමාණයන් සඳහා සැපයුම්කරුවන්ගේ ඉන්වොයිස් අංකය හා ඉන්වොයිස් දිනය සඳහන් කර නොමැති වීම නිසා එම බදු මුදල් දෙපාර්තමේන්තුව වෙත නිවැරදිව ප්‍රේෂණය වූ බව තහවුරු කර ගැනීමට නොහැකි වී තිබුණි.

තෙවන පාර්ශවයන් විසින් රාජ්‍ය ආයතන වෙතින් භාණ්ඩ හා සේවා සැපයීම් මත අයකර දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු VAT බදු නිසි පරිදි අයවී නොමැතිවීම හා ප්‍රමාද වී අයවීම හේතුවෙන් එම බදු මුදල් රැස් කරන පාර්ශවයන්ට අයථා පරිහරණයට ඉඩ සැලසී ඇති බවත් , බදුකරුවන් වෙතින් යථෝක්ත VAT බදු මුදල් රජය වෙත අය කර ගැනීමට කටයුතු කරන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ඒ සඳහා කාර්යක්ෂම සුදුසු විසඳුම් පියවර ගැනීමට කටයුතු කර නොමැති බවත් නිරීක්ෂණය විය.

### 3.6.4 2018/19 තක්සේරු වර්ෂයෙහි සංස්ථාපිත ආදායම් බදු (CIT) සඳහා තක්සේරු වාර්තා නිකුත්කිරීමේ ක්‍රියාවලිය පරීක්ෂාව

(අ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතෙහි 152 වන වගන්තිය ප්‍රකාරව කොමසාරිස් ජනරාල්වරයා විසින් බදු අය විය යුතු සහ ගෙවීමට නියමිත දිනයේදී බදු නොගෙවා ඇති විට දී ගෙවීම කරන ලෙස ඉල්ලා සිටීමින් බදු ගෙවන්නා වෙත දැන්වීමක් යැවිය හැකි අතර යථෝක්ත පනතේ 135 (2) (ආ) වගන්තිය ප්‍රකාරව ස්වයංතක්සේරු වාර්තා ගොනු කල දිනයේ සිට මාස 30 ක් ඇතුලත සංශෝධිත හෝ අතිරේක තක්සේරු වාර්තා නිකුත්කල හැකි වේ. නමුත් විගණිත දිනය වන 2022 සැප්තැම්බර් 22 දින වන විටත් නියැදි පරීක්ෂාවට අනුව 2018/2019 තක්සේරු වර්ෂය සඳහා ආයතන 47 කින් රු. 759,163,289 ක හිඟ බදු මුදල් අයකරගැනීමට/ තක්සේරු වාර්තා ගොනු කිරීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් නිසි පියවර ගෙන නොතිබීම හේතුවෙන් එම බදු මුදල් කාලාවරෝධයට ලක්ව තිබුණි.

(ආ) 2017 අංක 17 දරන දේශීය ආදායම් පනතෙහි 157 වගන්තිය ප්‍රකාරව නියමිත දිනයට අදාල බදු ප්‍රමාණය නොගෙවා ඇත්තේ නම්, ගෙවන්නා ගෙවීමට නියමිත දිනයේ සිට බදු ගෙවන දිනය දක්වා කාලපරිච්ඡේදය සඳහා එම ප්‍රමාණය මත පොලියක් ගෙවීමට යටත්විය යුතුය. නියැදි විගණන පරීක්ෂාවට අනුව ආයතන 02 ක් විසින් නියමිත දිනට පසුව ගෙවන ලද රු.10,087,748 ක බදු සඳහා යථෝක්ත වගන්තිය ප්‍රකාරව පොලී මුදල් අයකර නොතිබුණි.

**3.6.5 බදු බැර තිබියදී බදු තහවුරු කිරීමේ සහතික/ නිශ්කාෂණ සහතික නිකුත් කිරීම**

(අ) මත්පැන් බලපත්‍ර අලුත් කිරීම සඳහා වූ බදු තහවුරු කිරීමේ සහතිකයට අනුව, බදු වර්ග සඳහා අදාළ ගෙවිය යුතු බදු ගෙවා ඇති බවට/ අදාල බදු ගෙවීමට සතුටුදායක වැඩපිළිවෙලක් යොදවා ඇති බවට සහතික විය යුතුය. එහෙත් දෙපාර්තමේන්තුව විසින් මත්පැන් බලපත්‍ර හිමිකරුවන් වෙත බදු තහවුරු කිරීමේ සහතික නිකුත් කිරීම සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද උපදෙස් අනුව, බදු තහවුරු කිරීමේ සහතික නිකුත් කිරීමේදී හිඟ බදු පිළිබඳ නොසලකා පෙර වර්ෂයේ ගෙවීම් පිළිබඳ පමණක් සළකා බලා නිශ්කාෂණ සහතික නිකුත් කර තිබුණු අතර, RAMIS පද්ධතිය තුළින් සිදුකල නියැදි විගණන පරීක්ෂාවට අනුව බදුකරුවන් 06 දෙනෙකුගෙන් තවදුරටත් අයවිය යුතු රු. 5,192,556 ක බදු බැර තිබියදී අදාල සහතික නිකුත් කර තිබුණි.

(ආ) අනෙකුත් අවස්ථාවන් වලදී නිශ්කාෂණ සහතික නිකුත් කිරීමේදී බදුකරුවන් 15 දෙනෙකුට අදාලව තවදුරටත් රු.24,269,657 ක බදු අයවිය යුතුව පැවතියදී, නිශ්කාෂණ සහතික නිකුත්කර තිබුණු බවත්, සහතික නිකුත් කිරීමේදී දක්වා ඇති තක්සේරු වර්ෂය තෙක් බදු වාර්තා බාරදී ඇති බවට සහතික වීමක් සිදුකරන නමුත් එලෙස බදු වාර්තා බාරදී නොමැති, අවස්ථා වලදී යථෝක්ත සහතික 10 ක් නිකුත් කර ඇති බවත්, RAMIS පද්ධතිය අනුව සිදුකල නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඇ) TIN අංක 114416525 බදුකරුගේ ආදායම් බදු වාර්තා අනුව 2012/2013, 2013/2014 සහ 2014/2015 යන තක්සේරු වර්ෂ සඳහා ගෙවිය යුතු ආදායම් බදු (CIT) නියමිත පරිදි ගෙවා ඇති බව 2019 අප්‍රේල් 08 දිනැතිව දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ලිපියෙහි සඳහන් වුවත්, LEGACY පද්ධතිය සහ RAMIS පද්ධතිය තුල ගෙවීම් සටහන් අනුව යථෝක්ත කාලපරිච්ඡේද තුන සඳහා පිළිවෙලින් රු. 4,566,511 ක්, රු. 4,044,817 ක් හා රු. 349,253 ක් වශයෙන් එකතු වටිනාකම රු. 8,960,581 ක බදු බැරකමක් තවදුරටත් තිබියදී එම නිශ්කාෂණ සහතික නිකුත් කර තිබුණි.

**3.6.6** දේශීය ආදායම් දෙපාර්තුමේන්තුව සඳහා GP - 2 අය ක්‍රමය යටතේ විදුලි බල සැපයුම ලබා දී ඇති කාර්යාලයන්හි විදුලි බිල් ප්‍රමාද වී පියවීම හේතුවෙන් රු. 571,661 ක ප්‍රමාද පොලියක් විටින් විට දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි.

2022 අප්‍රේල් 26 දිනැති රාජ්‍ය වියදම් පාලනයට අදාළ ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හා 2022 අගෝස්තු 15 දිනැති අංක: PS/SB/Circular/10/2022 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛයට පටහැනිව දරන ලද වියදමක් සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී පෞද්ගලිකව වගකිව යුතු ලෙස දක්වා තිබුණු නමුත්, මෙම ගෙවීම් සිදුකිරීමේදී ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානය යොමුකර නොතිබුණු බවත්, මේ හේතුවෙන් රජයට සිදුව ඇති පාඩුව සඳහා මුදල් රෙගුලාසි 210 (2) අනුව කටයුතු සිදුව නොමැති බවත් නිරීක්ෂණය විය.

## 4. මානව සම්පත් කළමනාකරණය

### 4.1 අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අදාළව 2022 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්වය පහත පරිදි විය.

| සේවක කාණ්ඩය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 1257 | 996 | 261 |
| තෘතියික මට්ටම | 59 | 31 | 28 |
| ද්විතියික මට්ටම | 1056 | 972 | 84 |
| ප්‍රාථමික මට්ටම | 496 | 432 | 64 |
| **එකතුව** | **2868** | **2431** | **437** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදුකෙරේ.

(අ) 2022 දෙසැම්බර් 31 දිනට සමස්ථ පුරප්පාඩු සංඛ්‍යාව 437 ක් වූ අතර ඊට අනුරූපීව 2020 හා 2021 වර්ෂවලදී පුරප්පාඩු සංඛ්‍යාව පිළිවෙලින් 320 ක් හා 387 ක් වී තිබුණි.මේ අනුව දෙපාර්තමේන්තුවේ සේවක පුරප්පාඩු සංඛ්‍යාව ක්‍රමිකව වර්ධනයක් පෙන්නුම් කර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට එය සමස්ථ අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 15 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 261 ක් පුරප්පාඩුව පැවති අතර එය පූර්ව වර්ෂයට වඩා තනතුරු 25 ක සංඛ්‍යාත්මක වර්ධනයකි. එම පුරප්පාඩු අතර විශේෂ ශ්‍රේණියේ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් තනතුරු 03 ක්, ජ්‍යෙෂ්ඨ කොමසාරිස් තනතුරු 16 ක් හා 1 ශ්‍රේණියේ කොමසාරිස් තනතුරු 47 ක් පැවතිම දෙපාර්තමේන්තු කාර්යය සාධනය කෙරෙහි දැඩි බලපෑමක් ඇතිකරන බව නිරීක්ෂණය විය.

(ඇ) 2020 ජූලි 09 දිනැති අංක DMS/1166/V දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I පන්තිය II, III ශ්‍රේණිවල SL 1 වැටුප් කාණ්ඩයට අයත් නියෝජ්‍ය/සහකාර තනතුරු 10 ක් හා එම සේවයේ 2 පන්තිය II ශ්‍රේණියට අයත් MN6 කාණ්ඩයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ නිලධාරි තනතුරු 29 ක් නොපමාව පිහිටුවීම සඳහා අනුමැතිය ලබාදී තිබුණි. කෙසේ වුවද, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සේවයේ I පන්තිය II, III ශ්‍රේණියන්ට අයත් නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ තනතුරු 12 ක් හා තෘතියික මට්ටමේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික නිලධාරි තනතුරු 28 ක් 2020 වර්ෂයේ සිට මේ දක්වා පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) ඒ අනුව RAMIS ව්‍යාපෘතිය ක්‍රියාත්මකව පවත්වාගෙන යාමට හැකියාව සහිත කාර්ය මණ්ඩලයක් බඳවා නොගැනීම හේතුවෙන් මේ වනවිටත් ව්‍යාපෘතිය දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට නොහැකි වී තිබුණු අතර, 2020 පෙබරවාරි 20 දිනැති අංක : IRD /RAMIS /MOF /2018 දරන ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ ලිපිය ප්‍රකාරව RAMIS පද්ධතිය තුල පවතින මොඩියුල 24 , අදියර 03 ක් යටතේ නව කාර්ය මණ්ඩල බඳවා ගැනීමක් සහිතව පවරා ගැනීමේ සැලසුමෙහි ඇතුළත් RAMIS ව්‍යාපෘතිය භාරදීමට අදාළ ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය අවස්ථාවති නිසි මැදිහත්වීම සිදු නොකිරීම හේතුවෙන් යථෝක්ත ව්‍යාපෘතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීම දිගින් දිගටම ප්‍රමාද වී අතිරේක වියදම් ද දරමින් සිටින බව නිරීක්ෂණය විය.

(ඉ) දෙපාර්තමේන්තු අනුමත කාර්යය මණ්ඩලය තුල ශ්‍රී ලංකා ඉංජිනේරු සේවාවට අයත් II, III ශ්‍රේණියේ ඉංජිනේරු තනතුරක් 2016 වර්ෂයේ සිට මෙතෙක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණු අතර, ද්විතියික හා තෘතියික නිලධාරි කාණ්ඩවලට අයත් කාර්මික නිලධාරී (සිවිල්/විදුලි) ගොඩනැගිලි පරීක්ෂක හා සංචාරක බංගලා භාරකරු යන තනතුරු 4 ම පූර්ව වර්ෂයේ සිටම පුරප්පාඩුවී තිබුණු අතර, එම මට්ටම්වලට අයත් සමස්ත තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව 148 ක් විය

(ඊ) 2018 ජනවාරි 18 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව සෑම රජයේ ආයතනයක් විසින්ම ඉදිරි වර්ෂය සඳහා වූ මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කල යුතුය. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර තිබුණද, 2023 වර්ෂයට අදාලව මානව සම්පත් සංවර්ධන සැලැස්ම මෙතෙක් යාවත්කාලීන කර නොතිබුණි.

ඊ. එම්. කේ. එම්. පද්මලාල්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
නියෝජ්‍ය විගණකාධිපති වෙනුවට.

ඊ.එම්.කේ.එම්. පද්මලාල්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පිටපත් :
1. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
2. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකාව
உள்நாட்டு இறைவரித் திணைக்களம் - இலங்கை
INLAND REVENUE DEPARTMENT - SRI LANKA

සර්. චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත, කොළඹ 02
சேர் சிற்றம்பலம் ஏ. கார்டினர் மாவத்தை, கொழும்பு 02
Sir Chittampalam A. Gardiner Mawatha, Colombo 02